# දෙසතිය

## පුවත් සඟරාව

2025 දෙසැම්බර්



# කොළඹින් කතා කර සියවසකට පසු



# අවදි වූ හේලි ගුබ්බි

ඉතියෝපියාවේ පිහිටා ඇති විශාලතම ගිනි කඳුවලින් එකක් වන 'හේලි ගුබ්බි' (Hayli Gubbi) ගිනි කන්ද නොබෝදා (2025 නොවැම්බර් 23) විදාරණය වුණා. ඒ දැවැන්ත අළු වලාවක් 14 Kmක් පමණ ඉහළ අහසට මුදාහරිමින්. 'හේලි ගුබ්බි' ගිනි කන්ද එලෙස පුපුරා ගොස් ඇත්තේ මීට වසර දහස් ගණනකට පසුව වීම විශේෂත්වයක්.

එය ඊසාන දිග ඉතියෝපියාවේ 'අෆාර්' කලාපයේ පිහිටි 'එර්ටා ඒල්' නම් කඳු වැටියට අයත් ගිනි කන්දක්. මීටර 493ක් (අඩි 1617)ක් උසැති මේ ගිනි කන්ද භූ තැටි දෙකක් හමුවන භූගෝලීය වශයෙන් දැඩි ක්‍රියාකාරී කලාපයක් වන රිෆ්ට් නිම්නයේ පිහිටා තිබෙනවා. 'හේලි ගුබ්බි' ගිනි කන්ද පුපුරා යාමෙන් ඒ අසල නගර කිහිපයක් අළුවලින් යට වූ බව විදෙස් මාධ්‍ය වාර්තා කරනවා. ඉන් කිසිදු විපතක් හෝ හානියක් හෝ නොවූ අතර යේමනය, ඕමානය, ඉන්දියාව සහ චීනය යන රටවලට අළු වලාවෙන් බලපෑමක් ඇති වූ බව සඳහන්. මේ නිසා ඉන්දියාවේ ගුවන් සමාගම් කිහිපයක් අවලංගු කර තිබෙන්නේ මැදපෙරදිග බලා යාමට නියමිත ව තිබූ ගුවන් ගමන් වාර ගණනාවක්.

ඇමරිකාවේ ස්මිත්සෝනියම් කෞතුකාගාරය සතු ව ලෝකයේ ගිනි කඳු පිළිබඳ වසර 12,000කට වඩා පැරණි දත්ත පවතිනවා. එහෙත් ඒ කිසිවක ඉතියෝපියාවේ 'හේලී ගුබ්බි' ගිනි කන්ද පුපුරායාමක් පිළිබඳ තොරතුරු වාර්තා වන්නේ නැහැ. මිචිගන් තාක්ෂණික විශ්වවිද්‍යාලයේ ගිනි කඳු පිළිබඳ විද්‍යාඥයෙකු සහ මහාචාර්යවරයෙකු වන සයිමන් කාන් තහවුරු කර ඇත්තේ ද අයිස් යුගය අවසන් වීමෙන් පසු වසර 12,000කට පමණ පෙර ආරම්භ වූ යුගයේ සිට මේ ගිනි කන්දේ කිසිදු පුපුරායාමක් වාර්තා නොවන බව. එම නිසා 'හේලි ගුබ්බි' ගිනි කන්ද වසර 12,000කට පසු ප්‍රථම වරට පුපුරා ගොස් ඇති බවයි විද්‍යාඥයන්ගේ මතය.

**මධූෂා සෙව්වන්දි**

# දෙසතිය
පුවත් සඟරාව

**වෙළුම 47, කලාපය 12,**
**2025 දෙසැම්බර්**



**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150



උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**


මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





20 කවරයේ කතාව


13 ඇවිළෙන ගාසාව


03 දිට්වා සුළියෙන් නොසැලෙන්


32 අවදානමට පෙර සූදානම


07 දඬුවම වෙනුවට රැකවරණය


40 යෝග

දෙසතිය

පුවත් සඟරාව

# සොබාදහමේ පණිවිඩය

වසරක් ගෙවී තව වසරක් උදා වන විට රටට, සමාජයට මෙන් ම තනි තනි ව පුද්ගලයන්ටත් තිබෙන්නේ එළඹෙන වසරට මුහුණදීමේ නැවුම් බලාපොරොත්තු සහ අපේක්ෂා. 2025 වසර ගෙවී 2026 වසරට පා තබන මොහොතේ ශ්‍රී ලාංකිකයන් ලෙස අපට මුහුණදීමට සිදු ව තිබෙන්නේ අභියෝග රැසකට. ඒ, සොබාදහමේ නීතියට අනුගත ව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව දැඩි ව අවධාරණය කරමින් සිටින මොහොතක.

නොවැම්බර් මාසයේ අවසානයත් දෙසැම්බර් මාසයේ ආරම්භයත් ශ්‍රී ලංකාවට ගෙන දුන්නේ අමිහිරි, වේදනාබර මතක රැසක්. 'දිට්වා' සුළි කුණාටුවේ බලපෑම නිසා අධික වැසි ඇති වී මහා ජල ගැලීම් හා නාය යාම් සිදු වීමෙන් පරිපාලන දිස්ත්‍රික්ක 22ක 600කට අධික ජීවිත හානි, 200කට ආසන්න පුද්ගල අතුරුදන්වීම් මෙන් ම බොහෝ දේපළ හානි වුණා. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (**UNDP**) එළිදක්වා ඇති නවතම වාර්තාවකට අනුව 'දිට්වා' සුළි කුණාටුව මෙරට පුද්ගලයන් මිලියන 2.3කට සෘජු සහ දැඩි බලපෑම් එල්ල කර තිබෙනවා. හෙක්ටයාර මිලියන 1.1 ඉක්මවූ භූමි ප්‍රමාණයක්, එනම් ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 20%ක් ජලගැලීම්වලට හසු ව තිබෙනවා.

සොබාදහමේ මේ හැසිරීමෙන් සාමාන්‍ය ජන ජීවිත අඩාල වූවා පමණක් නොව රටේ ආර්ථිකයට ඇති වූ බලපෑම ගණනය කළ හැකි වුවත් සිදු වූ සමාජීය හානිය ගණනය කළ නොහැකි තරම්. මෙවැනි පසුබිමක ආපදාවෙන් විපතට පත් පිරිසට රජය සහන සලසමින් ඔවුන්ගේ ජීවිත නගා සිටුවීමට පියවර ගනිමින් සිටින්නේ යුහුසුළු ව. එහිදී විදෙස් ආධාර ලබා ගැනීමට ද පියවර ගත්තා. ඒ අනුව දෙස් විදෙස් මානුෂීය ආධාර විශාල වශයෙන් ලැබුණු අතර තවමත් එම ක්‍රියාවලිය අවසන් නැහැ.

පශ්චාත් ආපදා කළමනාකරණ අවධියේ සාමාන්‍ය තත්ත්වය මෙය වුවත් ශ්‍රී ලාංකිකයන් කිසිදු සොබාදහමෙන් පාඩම් ඉගෙන ගන්නා ජාතියක් නොවන බවට කරන චෝදනාව බැහැර කරන්නටත් බැහැ. ඒ, කාලයේ වැලි තලාවෙන් සියල්ල වැසී යද්දී සොබාදහමට අභියෝග කරමින්, පරිසරයට අනුගත නොවන අයුරින් නැවතත් සුපුරුදු ජීවන රටාවට ම හුරුවීමට මිනිසුන් පෙලඹෙන නිසා. මෙය නව වසරේ වෙනස්විය යුතු තත්ත්වයක්. පරිසරය යනු ආර්ථික, සමාජීය, දේශපාලන, අධ්‍යාපනික, සංස්කෘතික යන සෑම ක්ෂේත්‍රයකට ම බලපෑම්කාරී සාධකයක්. එයට අනුගත නොවුණහොත් දෙන දඬුවම් සුළුපටු ඒවා නොවන බව නොබෝද අපට ප්‍රත්‍යක්ෂ වුණා. පාරිසරික නීතිරීති කෙතරම් දැඩි වුවත් පුද්ගලයා ආකල්පවලින් වෙනස් නොවනතාක් මේ ගැටලුකාරී තත්ත්වයෙන් අත්මිදෙන්නට බැහැ.

මේ නිසා සෑම පුද්ගලයකුට ම තම ජීවන ක්‍රියාකාරකම් දෙස ආපසු හැරී බලන්නට යැයි සොබාදහම කරන ඉඟිය සාවධාන ව විමසමින් නව වසර පිළිගන්නට අපට සිදු වෙනවා. මේ ආපදා තත්ත්වය පුද්ගල ක්‍රියාකාරකම් ඔස්සේ සමස්ත රටේ ම ඉරණම තීරණය වන බවට හොඳම නිදර්ශකයක්. රජයට රටේ සංවර්ධන සහ ආර්ථික ස්ථාවරත්වය ගොඩනැංවීමේ ක්‍රියාවලිය පසෙක තබා ආපදාවට විසඳුම් සොයන්නට වී තිබීමෙන් එම කරුණ තහවුරු වෙනවා.

එබැවින් 2024 වසරේ දෙසැම්බරයට වඩා 2025 වසරේ දෙසැම්බරය වෙනස්. ඒ නිසා 2026 දෙසැම්බරය වන විට ස්වාභාවික ආපදා කළමනාකරණය පිළිබඳ ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවී තිබෙනු දක්නට ලැබෙනවානම් එය අනාගත පරපුරේ වාසනාවක්. නව වසර එළඹීමට නියමිත ව ඇත්තේ එම කාර්යය ඉටු කිරීම සඳහා රටක් ලෙස සාමූහික ව යා යුතු ගමනක් අපට ඇති බව පසක් කර තිබෙන මොහොතක. ඊට සූදානම් වීමයි අප කළ යුත්තේ.

මාලා මල්කාන්ති අරණගමගේ

- සංස්කාරක -

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........................................................................

Address ..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

..........................................................................

ID Number ........................................ Tel / Mobile ........................................

Signature ........................................ Date ........................................

දෙසතිය සඟරා දයකත්වය

වාර්ෂික දයකත්වය රු. 1680.00

අර්ධ වාර්ෂික දයකත්වය රු. 840.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දයකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න.   විමසීම් - 0112512759



# දිට්වා සුළියෙන් නොසැලෙන්

රංගිකා අබේසේකර

මෑත ඉතිහාසයේ දරුණුතම ආපදා තත්ත්වයකට මුහුණදීමට ශ්‍රී ලංකාවට සිදුවුණා. ඒ, 2025 නොවැම්බර් 28 සිට 30 දක්වා 'දිට්වා' (Ditwah) සුළි කුණාටුව ඇති කළ බලපෑමත් සමඟ. මේ සුළි කුණාටුව හා සමගාමී ව ආසියානු කලාපයේ සෙන්යාර් (Senyar) සහ කොටෝ (Koto) සුළි සුළං ද්විත්වය ද වර්ධනය වී තිබුණා. 'දිට්වා' ලෙස මේ සුළි කුණාටුව නම් කර ඇත්තේ යේමනය. පැයට කිලෝමීටර 62-87 දක්වා තීව්‍රතාවක් පවතින විට එය සුළි කුණාටුවක් ලෙස සලකනවා. ලෝක ඉතිහාසයේ දරුණුතම සුළි කුණාටුව ලෙස සලකන්නේ 1970 දී ඇති වූ මහා භෝලා සුළිකුණාටුව (Bhola cyclone).

දිට්වා සුළි කුණාටුව ශ්‍රී ලංකාවට ඉතා ආසන්න ව සහ නැගෙනහිර වෙරළ තීරය ඔස්සේ ගමන් කිරීම නිසා එහි පීඩාකාරී බව මීට පෙර වාර්තා වී ඇති සුළි කුණාටුවලට වඩා බරපතළ වුණා. මේ සුළි කුණාටුවේ බලපෑමත් සමඟ ඇති වූ අධික වර්ෂාපතනය හේතුවෙන් ගංවතුර සහ නාය යාම් රැසක් වාර්තා වූයේ ගාල්ල, මාතර හා හම්බන්තොට හැර ඉතිරි පරිපාලන දිස්ත්‍රික්ක 22කට ම දැඩි හානි ගෙන දෙමින්.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයට අනුව මේ ව්‍යසනයෙන් විශාල ප්‍රමාණයේ නාය යාම් 1250ක් වාර්තා වී තිබෙනවා මහනුවර දිස්ත්‍රික්කයේ නාය යාම් 744ක්, නුවරඑළිය දිස්ත්‍රික්කයේ 99ක්, සබරගමුව 86ක් සහ බදුල්ල දිස්ත්‍රික්කයේ 321ක් ලෙස.

වර්ෂාව ලැබීමට ප්‍රථම වර්ෂාවේ ස්වභාවය හා එය ප්‍රමාණාත්මක ව බලන ක්‍රමවේදයක් ලංකාවේ දැනට නැහැ. ඇමරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව වැනි රටවල් මේ සඳහා භාවිත කරන තාක්ෂණයක් (**Doppler radars**) තිබෙනවා. එය වලාකුළේ ඝනත්වය ලබාගෙන ගණනය කරන ක්‍රමවේදයක්. එම තාක්ෂණයෙන් වුවත් 100%ක් නිවැරැදි පුරෝකතන ඉදිරිපත් කිරීම අපහසුයි. එහෙත් සාපේක්ෂ වශයෙන් නිවැරදිතාව වැඩි ක්‍රමවේද ලෝකයේ භාවිත වනවා.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2025.12.15 දිනැති දෛනික වාර්තාවට අනුව දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පවුල් 468,472ක්, පුද්ගලයන් 1,628,017ක් බලපෑමට ලක් ව තිබෙනවා. ඒ අතර වන්නේ මරණ 643ක් හා අතුරුදන් වීම් 183ක්. මෙහිදී පූර්ණ වශයෙන් හානි වූ නිවාස 6,176ක් සහ අර්ධ නිවාස හානිවීම් 95,213ක් වාර්තා වෙනවා. මේ වන තෙක් ආරක්ෂිත කඳවුරු 762ක රැඳී සිටින පිරිස 70,055ක්.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් 2025 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලද වාර්තාවේ දත්ත විශ්ලේෂණයට අනුව දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ශ්‍රී ලංකාවේ භූමියෙන් හෙක්ටයාර මිලියන 1.1ක් ජලගැලීම්වලට හසු වී ඇති අතර එය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් 20%ක් බව සඳහන්. විශාලතම ගංවතුර ප්‍රමාණය වාර්තා වුණේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන්. ඒ, හෙක්ටයාර 23,000ක භූමියක. සමස්තයක් ලෙස මිලියන 2.3ක ජනතාවකට ජලගැලීම්වලින් සෘජු ව ම බලපෑම් සිදු ව ඇති අතර දළ වශයෙන් මිලියන 1.2ක් කාන්තාවන්, ළමයින් සහ තරුණ පිරිස (වයස අවුරුදු 0-15) 522,000ක්, වැඩිහිටි පුද්ගලයන් (වයස අවුරුදු 65+) 263,000ක් ඊට ඇතුළත්.

UNDP වාර්තාව අනුව ගොඩනැගිලි 720,000කට ආසන්න සංඛ්‍යාවක් ආපදාවට ලක් ව ඇති අතර රෝහල් 243ක් ද ඒ අතර වෙනවා. මාර්ග 16,000kmක් සහ පාලම් 480කට, දුම්රිය පාලම් 35ක් ඇතුළු ව දුම්රිය මාර්ග 278කට හානි සිදු ව තිබෙනවා. දිට්වා සුළි කුණාටුවෙන් ශ්‍රී ලංකාවේ කුඹුරු ඉඩම් හෙක්ටයාර 530,000කට අධික ව ගංවතුරට ගොදුරු වී ඇති බවයි එම වාර්තාව පෙන්වා දෙන්නේ. මෙරට ශ්‍රම බලකායෙන් 30%ක් පමණ කෘෂිකර්මාන්තයේ නියුතු වන අතර ඉන් වැඩි පිරිසක් සහල් නිෂ්පාදකයන්.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඉංජිනේරු ආසිරි කරුණාවර්ධන පවසන ආකාරයට දිට්වා සුළි කුණාටුව රටට ඇතුළු වීමත් සමඟ ඇති වූ වර්ෂාපතනය හේතුවෙන් නාය යාම් පූර්ව නිවේදන නිකුත් කර තිබෙනවා. අවදානම් සහිත ප්‍රදේශවල සවිකර තිබෙන ආයතනය සතු වර්ෂාපතන මාන 330කට අධික සංඛ්‍යාවෙන් ඒ මොහොතේ (Real Time) ඇද හැලෙන වර්ෂාපතනය ගණනය කරනවා. ඒ අනුව මිලිමීටර 75ක වර්ෂාපතනයක් ලැබීම විමසිල්ලෙන් සිටින ලෙසත් මිලිමීටර 100ක වර්ෂාපතනයක් ලැබීම ඉවත්වීමට සූදානම් වන ලෙසත් මිලිමීටර 150ක වර්ෂාපතනයක් ලැබීම ඉවත්වන ලෙසටත් රතු නිවේදනයක් නිකුත් කිරීම සාමාන්‍ය නිර්ණායකයක්. ශ්‍රී ලංකාවේ භූ විෂමතාව අනුව මිලිමීටර 150ක වර්ෂාපතනයක් කඳු බෑවුමකට ලැබීමෙන් ඒ කන්ද අස්ථාවර වීමට පුළුවන් නිසා එවැනි වර්ෂාපතනයක් ලැබීමත් සමඟ එක් එක් ප්‍රදේශවලට නායයාම් සහ වර්ෂාපතන අනතුරු ඇඟවීම් දැනුම් දී තිබෙනවා. විශේෂයෙන් දිය උල්පත් මතුවීම්, පොළොව පැළීම්, ගස් ඇලවීම් වැනි පෙර සලකුණු ඇති වූ ස්ථානවලින් ජනතාව අනිවාර්යෙන් ම ඉවත් විය යුතු බවයි අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කළේ.

ආයතනයක් නිවැරදි මොහොතේ නිවැරදි ලෙස ක්‍රියාත්මක වීමත් වැදගත්. එහෙත් මේ දැවැන්ත ආපදාව සිදුවීමට පෙර අත්දැකීම් නොමැති වීම නිසා එය 100%ක් ක්‍රියාත්මක කිරීම දුෂ්කර කාර්යයක්. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග අධ්‍යක්ෂ එල්. එච්. සූරිය බණ්ඩාර (ජල විද්‍යා හා ආපදා කළමනාකරණ) පවසන ආකාරයට ගංවතුර කළමනාකරණයට පමණක් සැකසූ ජලාශ දක්නට නැහැ. ඒවා සකසා ඇත්තේ පද්ධති ලෙස විවිධ අවශ්‍යතා වෙනුවෙන්. ජලාශයත් ආරක්ෂා කරමින් හානිය අවම කිරීමයි වඩා වැදගත් වන්නේ. අදහස් දක්වන ඔහු; "වර්ෂාව

**දේශගුණික තත්ත්ව සඳහා මුහුණදීමටනම් ශ්‍රී ලංකාවට වාර්ෂික ව ඩොලර් බිලියන 4ක් පමණ ආයෝජනය කළ යුතු වනවා. ලෝක බැංකුවේ නවතම වාර්තාවට අනුව ස්වාභාවික විපත් හේතුවෙන් වාර්ෂික ව ඩොලර් මිලියන 330ක් පමණ රටට අහිමි වනවා. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.4ක්. රටක් ලෙස ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගතහොත් 2035 වසර වන විට ස්වාභාවික විපත් නිසා ආර්ථිකයට වන හානිය දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%ක් දක්වාත් 2050 වසර වන විට 3.5%ක් දක්වාත් ඉහළ යනු ඇති**

ලැබීමට ප්‍රථම වර්ෂාවේ ස්වභාවය හා එය ප්‍රමාණාත්මක ව බලන ක්‍රමවේදයක් ලංකාවේ දැනට නැහැ. ඇමරිකාව, ජපානය, ඕස්ට්‍රේලියාව වැනි රටවල් මේ සඳහා භාවිත කරන තාක්ෂණයක් (Doppler radars) තිබෙනවා. එය වලාකුළේ ඝනත්වය ලබාගෙන ගණනය කරන ක්‍රමවේදයක්. එම තාක්ෂණයෙන් වුවත් 100%ක් නිවැරැදි පුරෝකතන ඉදිරිපත් කිරීම අපහසුයි. එහෙත් සාපේක්ෂ වශයෙන් නිවැරදිතාව වැඩි ක්‍රමවේද ලෝකයේ භාවිත වනවා. ගංවතුර තත්ත්ව නවත්වන්නට බැහැ. පාලනය පමණයි කළ හැක්කේ. හානිය අවම කළ හැකියි. හානිය නැති කිරීමට බැහැ. යටිතල පහසුකම් නොමැති විට මෙවැනි අවස්ථාවල අපට කළ හැක්කේ තිබෙන දේ භාවිත කර හානි අවම කිරීම පමණයි."

ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 5000ක්. එහෙත් නොවැම්බර් මස 24-26 දිනවල උඩුදුම්බර ඇතුළු ව මහනුවර, මාතලේ, කුරුණෑගල, බදුල්ල හා කොළඹ දිස්ත්‍රික්කවලට දින 3ක් මිලිමීටර 300 ඉක්මවූ වැසි ලැබී තිබෙනවා. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දැනුවත් කිරීම ඔස්සේ කෑගල්ල, මාතලේ, බදුල්ල, මහනුවර දිස්ත්‍රික්කවල ජනතාව අවදානම් ස්ථානවලින් ඉවත් කර ගැනීමට හැකියාව ලැබුණු බවත් ඒ අනුව 7,000ක පමණ ජනතාවක් ආරක්ෂිත ස්ථාන කරා යොමු කළ බවත් ආචාර්ය ඉංජිනේරු ආසිරි කරුණාවර්ධන සඳහන් කළා.

මේ ආපද තත්ත්වය නිසා සැලකිය යුතු පිරිසකගේ ආර්ථිකයට සෘජු හා වක්‍ර බලපෑමක් එල්ල වී තිබෙන බවත් දළ දේශීය නිෂ්පාදිතයට සිදු ව ඇත්තේ සෘණාත්මක බලපෑමක් බවත් කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ සඳහන් කරනවා. අදහස් දක්වන මහාචාර්යවරයා; "මේ ආපද තත්ත්වය නිසා ඉදිරි කාර්තු දෙකක කාලසීමාවේ නිෂ්පාදන මට්ටම හා ආර්ථික වර්ධනය පහළ යාමටත් සේවා වියුක්තිය සහ දුප්පත්කම ඉහළ යාමටත් පුළුවන්. මෙවැනි පසුබිමක රාජ්‍ය අය වැයට විශාල බරක් දැරීමට සිදුවනු ඇති

නිසා ඒ තෙරපුම් මත රජයට සිදුවනවා අය වැයෙන් වෙන්කර ගත් මුදල රට ගොඩනැගීම සඳහා වෙන් කිරීමට.

මෙහිදී විදෙස්ගත ශ්‍රමිකයන්ගේ හා විදේශවල පදිංචි වී සිටින ශ්‍රී ලාංකිකයන්ගේ දායකත්වය ලබා ගැනීමට රජයට හැකියාව තිබෙනවා. විදෙස්ගත ව සිටින පිරිස දළ වශයෙන් මිලියන 03ක්. එමගින් ගිණුම් ශේෂයට වන බලපෑම අවම කිරීමට පුළුවන්. මූල්‍ය ක්ෂේත්‍රයේ බැංකු, මහා පරිමාණ නිෂ්පාදන ආයතන සහ අපනයනකරුවන් වැනි පෞද්ගලික අංශය රට යළි ගොඩනැගීමට සම්බන්ධ කර ගත හැකියි. විශේෂයෙන් එම ආයතන පරිසර සහ සමාජ තිරසාරත්වය වෙනුවෙන් CSR ව්‍යාපෘති (Corporate social responsibility Project) සඳහා වාර්ෂික ව අරමුදල් වෙන් කරනවා. ඊළඟ ප්‍රවේශය වන්නේ ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක සහනදායී ණය පහසුකමක් වන ආපදා මූල්‍ය පහසුකම (Catastrophe Deferred Draw) ලබා ගැනීමට අවධානය යොමු කිරීම වඩා වැදගත්."

BBB (Build Bad Better) සංකල්පය අනුව යමින් රට යළි ගොඩනඟන විට එය ආපදා තත්ත්වවලට මුහුණපෑමට හැකියාව ඇති ආකාරයේ වැඩපිළිවෙළක් විය යුතු බවත් කෙටිකාලීන සහනශීලී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරමින් නැවත වරක් ආපදාවට ලක්වීමට ඇති අවස්ථා අවම කරමින් දීර්ඝකාලීන සැලසුම්ගත නිශ්චිත ක්‍රමවේදයකට යාම වැදගත් බවත් මහාචාර්යවරයා පෙන්වා දෙනවා

ආපදාවෙන් පසු ජනතාවගේ ජීවන තත්ත්වය යථාතත්ත්වයට පත් කිරීම සඳහා 2025.12.01 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස 'Rebuilding Sri Lanka' ආරම්භ කළා. මේ සඳහා දේශීය වශයෙන් මෙන් ම විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ගෙන් සහ විවිධ ආයතනවලින් මූල්‍යාධාර වශයෙන් රුපියල් මිලියන 3421ක් (භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2025.12.13 දිනට) ලැබී ඇති බව මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූර්යප්පෙරුම සඳහන් කරනවා. මීට අමතර ව ජන ජීවිතය ඔසවා තැබීමට මුදල් ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අය වැය චක්‍රලේඛ අංක 08/2025 යටතේ ආපදාවට ලක් වූ ප්‍රජාව වෙනුවෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව නොබෝදා (දෙසැම්බර් 15) ජනාධිපති ලේකම් කාර්යාලයේදී රැස් වී ජාතික ආපදා කළමනාකරණ ඒකාබද්ධ යාන්ත්‍රණයක් සැකසීම සහ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීමට අදාළ පත්‍රිකාව සභාගත කළා. විශේෂයෙන් මධ්‍යම කඳුකරය රැක ගැනීම සඳහා ස්ථිර විසඳුමක් සෙවීමේ රජයේ වැඩපිළිවෙළ යටතේ මේ වන විට අවදානම් කලාපයේ පවතින නිවාස 15,000ක් හඳුනාගෙන තිබෙන බවත් 2026 වසර අවසන් වන විට එම ජනතාව වෙනුවෙන් ඉදිවන නිවාස 8,000ක කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන බවත් ජනාධිපතිවරයා එහිදී සඳහන් කළා.

දේශගුණික තත්ත්ව සඳහා මුහුණදීමටනම් ශ්‍රී ලංකාවට වාර්ෂික ව ඩොලර් බිලියන 4ක් පමණ ආයෝජනය කළ යුතු වනවා. ලෝක බැංකුවේ නවතම වාර්තාවට අනුව ස්වාභාවික විපත් හේතුවෙන් වාර්ෂික ව ඩොලර් මිලියන 330ක් පමණ රටට අහිමි වනවා. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.4ක්. රටක් ලෙස ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගතහොත් 2035 වසර වන විට ස්වාභාවික විපත් නිසා ආර්ථිකයට වන හානිය දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%ක් දක්වාත් 2050 වසර වන විට 3.5%ක් දක්වාත් ඉහළ යනු ඇති බවට පුරෝකථනය කර ඇති බවයි කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ අවධාරණය කළේ.

මේ නිසා පසු ආපදා කළමනාකරණ (Post Disaster Management) මෙන් ම පූර්ව ආපදා කළමනාකරණය (Pre Disaster Management) ඉතා වැදගත්. විශේෂයෙන් දේශගුණය සහ ආර්ථික සංවර්ධනය පිළිබඳ සලකා රටක් ලෙස ඉදිරියට යාමට ජාතික සංවර්ධන සැලසුමක් අවශ්‍ය වෙනවා. ඒ, ආණ්ඩු මාරුවීම මත ප්‍රතිපත්ති සැලසුම් නොවෙනස් වන අයුරින් ජාතික ප්‍රතිපත්තියක් වෙත යමින්.



# ඒකාබද්ධ යාන්ත්‍රණයකින් තිරසර විසඳුමක්




මහාචාර්ය
**නිශාන් සකලසූරිය**
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය


ශ්‍රී ලංකාව ස්වාභාවික ආපදාවලින් තොර රටක් ලෙසයි අර්ථ දක්වන්නේ. එයයි ජනතාව නොමග ගිය තැන. ශ්‍රී ලංකාවේ පිහිටීම ගත් විට එය පවතින්නේ දේශගුණික වශයෙන්, පාරිසරික වශයෙන් දැඩි අවදානම් කලාපයක. හේතුව මෝසම් 2කට මැදි වන රටක් නිසා. ඊසාන දිග හා නිරිත දිග මෝසම් සුළඟත් අතරමැද පිහිටි අන්තර් මෝසම් සුළං දෙකකුත් වාර්ෂික ව රටට බලපානවා. අන්තර් මෝසම් කාලයේදී සුළි කුණාටු, වායු අවපාත පැමිණෙන්නට පුළුවන්. එක ම වේලාවක එක් ප්‍රදේශයක ගංවතුර, අනෙක් ප්‍රදේශයේ නාය යාම්, තවත් ප්‍රදේශයක නියගය ඇතිවන විට අනෙක් ප්‍රදේශයට වර්ෂාව ලැබෙනවා. දේශගුණික තත්ත්වය අනුව ඕනෑ ම වේලාවක ඕනෑ ම ස්ථානයකට වර්ෂාව ලැබිය හැකියි. සුනාමියක් පැමිණියහොත් වෙරළට සම්බන්ධ දිස්ත්‍රික්ක 14ට ම ඍජු බලපෑම් ඇතිවෙනවා. මධ්‍යම කඳුකරයට තද වැසි ඇති වුවහොත් දිස්ත්‍රික්ක 15කට ගංවතුර තත්ත්වයත් දිස්ත්‍රික්ක 11කට නාය යාම් අවදානමත් පවතිනවා.

ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය, පැසිෆික් භූ තැටිය සහ යුරේසියානු භූ තැටිය එකට හමුවන භූ තැටි මායිමකින් 1600km ඈතින් ශ්‍රී ලංකාව පිහිටා තිබෙනවා. ඒ නිසා භූ කම්පන අඩු වශයෙන් මෙරටට බලපෑවත් ශ්‍රී ලංකාව භූ කම්පනවලින් තොර රටක් ද නොවෙයි. සෑම වසර දෙකකට වරක් මෙරට භූමි කම්පා වාර්තා වෙනවා. එහෙත් එම භූමිකම්පා රිච්ටර් මාපකයේ 5-6ට වඩා අඩු ඒවා. යම් මොහොතක හෝ එම භූ කම්පනවල ඉහළ අගයක් වාර්තා වීමට පුළුවන්. මේ කාරණා ගත් විට ශ්‍රී ලංකාව ස්වාභාවික ආපදාවලින් තොර රටක් ද යන්න විමසා බැලිය යුතු කාරණාවක්.

තැනිතලා ප්‍රදේශ සැකසී ඇත්තේ මධ්‍යම කඳුකරය සෝදා යාමෙන්. විශේෂයෙන් මෙවැනි ස්ථානවල ජනතාව කිසිදු වග විභාගයකින් තොර ව පදිංචි වීම සහ දේශපාලඥයන් විසින් පදිංචි කරවනු ලැබීම ශ්‍රී ලංකාවේ භූමි පරිහරණයේ එක් අඳුරු පැතිකඩක්. ශ්‍රී ලංකාවේ දැනට භෞතික සංවර්ධන සැලසුම් ආයතනයක්, භූමි පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුවක් තිබෙනවා. එහි සිටින භූගෝල විද්‍යාඥයන් ඉදිරිපත් කරන සැලැසුම්වල සඳහන් වන පරිදි බෑවුම 60°ට වැඩි භූමිවල සම්පූර්ණයෙන් ම ස්වාභාවික වනාන්තර වගා කළ යුතුයි. එහෙත් අප සිදු කළ භූගෝල විද්‍යා අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ භූමි බෑවුම 80°ට වඩා වැඩි භූමි 64%කට වඩා ප්‍රමාණයක ජනතාව වගා කර හෝ නිවාස, ගොඩනැගිලි ඉදිකර හෝ තිබෙනවා. මෙවර නාය යාමට ලක් ව තිබෙන්නේ 60°ට වඩා බෑවුම තිබෙන ප්‍රදේශ පමණයි. නාය යාම් සිදු වන්නේ 60°ට වඩා අඩු භූමි ආනතිය සකසා ගැනීමට. සිතියම් අධ්‍යයන අනුව පැහැදිලි ව කියන්න පුළුවන් අංශක 60ට අඩු භූමි නාය ගිහින් නැති බව. භූමි පරිහරණ සැලසුම නිසි ලෙස ක්‍රියාත්මක නොවීමේ මානව ක්‍රියාකාරකම්වල අතුරු ප්‍රතිඵලයක් ලෙසයි මෙය හඳුනාගත හැක්කේ.

ගංගා නාය යාම්වලට ජල මට්ටම වර්ධනය වන විට, අධික වර්ෂාපතනයක් ඇති වන විට එය පාලනයටයි අප මධ්‍යම කඳුකරයේ ජලාශ සකසා ඇත්තේ. මෙවැනි අධික වර්ෂාපතනයක් පැමිණේනම් වහා ම කළ යුත්තේ ප්‍රධාන ජලාශවල ජල මට්ටම 50%ක් දක්වා පහළ හෙළීම. එවිට වර්ෂාවෙන් එකතු වන ජලයත් මධ්‍යම කඳුකරයේ වාන් දොරටු විවෘත කළ පසු එම ජලයත් ජලාශවලට එකතු වන නිසා පහළ මිටියාවත්වල සිටින ජනතාව ජලගැලීමට හසු වන්නේ නැහැ.

කඳුකර නාය යාම්වලට ප්‍රධාන වශයෙන් තේ වගාව බලපානවා යැයි පවතින මතය නිවැරදි නැහැ. විදෙස් ජාතිකයන් පැමිණ තේ, කෝපි, රබර් කුරුඳු වගාව ව්‍යාප්ත කළේ හදවත බඳු ව ආරක්ෂා කළ මධ්‍යම කඳුකරයේ. සාමාන්‍යයෙන් තේ වතු නාය යන්නේ ඒවා ස්ථාපිත කර වසර 15-20 අතර කාලයකදී. තේ වතුවල භූමි භාවිතය විධිමත් ව සිදු කිරීම වැදගත්. තේ පැළ සිටුවීමට අමතර ව එහි පයින් (**Pine Tree**) වැනි වෙනත් ගස් සිටුවීම කළ යුත්තේ පසේ පැවැත්ම සකසා ගැනීමට. වර්තමානයේ බොහෝ පිරිස් එවැනි ගස් කපා දමනවා. මේ නිසා තේ වතුවලට අලුත් නීති පද්ධතියක් එක් කළ යුතුයි.

මෙරට භූමි පරිහරණයේදී භූගෝලීය පසුබිම අවබෝධ කර නොගෙන සැකසී ඇති නියමු, පරිසර පනත, භූමි පරිහරණ නීතිරීති යන සියල්ල උල්ලංඝනය කරමින් කළ ඉදිකිරීම් සහ මානව කටයුතු ඉතා ප්‍රබල ව මේ ව්‍යසනයට බලපෑවා. ආපදාවට ලක්විය හැකි ස්ථානවලින් හැකි සෑම අවස්ථාවකදී ම ජනතාව ඉවත් කර තැබීමයි වඩා වැදගත්. සිතියම් සහ නාය යාම් සිදුවන ස්ථාන නිරීක්ෂණය කර චීනය වැනි රටවල ක්‍රියාත්මක Village City (Grated City) සංකල්පය මෙරටත් ක්‍රියාත්මක කිරීම දීර්ඝකාලීන විකල්පයක්. සියල්ලට පෙර ජනතාවගේ ආකල්ප පරිවර්තනයක් අවශ්‍යයි. ඒවා වෙනස් කළ හැක්කේ රාජ්‍ය ආයතනවල කාර්ය සහ පුරෝකථන නිවැරදි ලෙස ජනතාව වෙත ගෙන යාමෙන්. ඒ ඔස්සේ ජනතාවගේ විශ්වාසය ගොඩනැගීමෙන්. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වලාකුළු පදනම් කරගෙන පමණයි පුරෝකථන සපයන්නේ. ඔවුන් භූ දර්ශනය පදනම් කරගන්නේ නැහැ. මෙය සාකච්ඡාවට ලක් කළ යුතු කාරණාවක්.

ආපදවලින් තොර රටක් නිර්මාණයටනම් ඊට සම්බන්ධ සියලු ආයතන, විශේෂඥ දැනුම හා උපදෙස්, සුදුස්සන් සුදුසු තැනට පත් කිරීම සහ ජනතාවගේ සහයෝගය මත ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක විය යුතුයි. එවිට ඉදිරි ව්‍යසන හෝ වැළැක්වීමට හැකිවනු ඇති.

**රංගිකා අබේසේකර**



# දඬුවම වෙනුවට රැකවරණය

විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ජාතික ගැටලුවක්. ජාවාරම්කරුවන්ට එරෙහි ව නීතිය දැඩි ව ක්‍රියාත්මක කිරීම මෙන් ම මේ ව්‍යසනයේ ගොදුරු බවට පත්වූ ජීවිත පුනරුත්ථාපනය කර, රැකබලා ගැනීම ද අත්‍යවශ්‍ය වෙනවා. මේ, ඒ පිළිබඳ අදහස් විමසීමක්.

**ප්‍රශ්නය; ; පුද්ගලයකු විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වන්නේ ඇයි?**

**පිළිතුර;** ඇබ්බැහිය රෝගයක් වගේ ම අපරාධයක්. පුද්ගලයෙකුට නිරන්තරයෙන් මත්ද්‍රව්‍ය මිල දී ගන්න අවශ්‍ය මුදල් නොමැතිනම් සොරකමට යොමු වෙනවා. එසේ බැරිනම් මත්ද්‍රව්‍ය වෙළෙඳාම දක්වා මේ තත්ත්වය වර්ධනය විය හැකියි. මේ නිසා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම අපරාධයක් විදිහටත් සලකනවා.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට විවිධ හේතු බලපානවා. ඉගෙනීම අතරමඟ නතර වීම ප්‍රධානතම හේතුවක්. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ අයගෙන් 70%ක් ම අධ්‍යාපනය අතරමඟ නතර වූ අය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් 6, 7 ශ්‍රේණි දක්වා පමණක් ඉගෙන ගත් අය. දුප්පත්, අඩු ආදායම්ලාභී, ඉගෙනීමක් නැති අය වැඩි වශයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිටිනවා. උගත්, ඉහළ තලවල අය ද නැතුවා ම නොවෙයි. රිමාන්ඩ් බන්ධනාගාරය තුළ 60%ක් ම සිටින්නේ මත්ද්‍රව්‍යවලට හුරු වූ අය. ඊළඟ කරුණ අනාරක්ෂිත දරුවන්. කාන්තා ගෘහමූලිකත්වය




මහාචාර්ය
**ඒ. ඩබ්ලිව්. කේ. වසන්තා සුබසිංහ**
සභාපති
පුනරුත්ථාපන කාර්යාංශය


දරන බොහෝ පවුල්වල මව, දරුවන් සමඟ නොසෑහෙන ජීවන අරගලයක් කරනවා. ඔවුන් රැකියාවට යනවිට දරුවන් රැක බලා ගැනීම, දරුවන්ගේ ආරක්ෂාව ගැන පවතින්නේ ගැටලුවක්. මෙය සමාජ අර්බුදයේ කොටසක්. තුන් වැනි කාරණාව ගමක තිබුණු එකමුතුකම, ආදරය, කරුණාව ගිලිහී ගොස් එකිනෙකා කෙරෙහි පවතින ආදරය, ආරක්ෂාව නැති වී යාම. ළමයින් ක්‍රීඩා පිටියට, පුස්තකාලයට යාම සහ ඒම නතර වුණා. දරුවන් එක ම කණ්ඩායමක් විතරක් ආශ්‍රය කරන්නට පටන් ගත්තා. ඒ නිසා ම විවිධ දේ අත්හදා බැලුවා. ඔවුන් එතැනින් එහා සිතන්න දේවල් සොයා ගත්තේ නැහැ. මෙවැනි හේතු සමඟ ශීඝ්‍රයෙන් විෂ මත්ද්‍රව්‍ය සමාජගත වී තිබෙනවා.

**ප්‍රශ්නය; පුනරුත්ථාපනයෙන් මේ සඳහා පිළියම් යොදන්නේ කෙසේ ද?**

**පිළිතුර;** විෂ මත්ද්‍රව්‍යවලින් වන හානිය වළක්වන්නටනම් මත්ද්‍රව්‍ය ඉල්ලුම වගේ ම මත්ද්‍රව්‍ය සැපයුම නැවැත්විය යුතුයි. මත්ද්‍රව්‍ය සැපයුම නැවැත්වීමට ආරක්ෂක අමාත්‍යාංශය, පොලිසිය මැදිහත් වී සිටිනවා. පුනරුත්ථාපන කාර්යාංශයට, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම සහ පුනරුත්ථාපනය සඳහා පනතින් ම සම්පූර්ණ අනුමැතිය හිමි වී තිබෙනවා. පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට මීට පෙර යම් යම් පිරිස් ඇතුළත් කර ගත්තේ මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටීම හෝ ඒ ආශ්‍රිත වැරදිවලට උසාවි නියෝගයකින්. උසාවියට අප වගකිව යුතුයි.

කන්දකාඩුවල ප්‍රධාන පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යවන්නේ වයස අවුරුදු 25-60 අතර පිරිස්. එහි 500කට පමණ

පුනරුත්ථාපන පහසුකම් තිබෙනවා. 120කට පමණ පුනරුත්ථාපන පහසුකම් ඇති වව්නියාව මධ්‍යස්ථානයට යොමු කරන්නේ වයස අවුරුදු 18-25 අතර අය. මේ පුනරුත්ථාපන කාර්යයේදී අප විධිමත් ලෙස මේ අය වර්ගීකරණයක් කරනවා. නැතහොත් අපරාධවලට සම්බන්ධ අයත් මේ සමඟ සිටිය හැකි නිසා ඔවුන් සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන්, බලපෑමෙන් අනෙක් අයත් අපරාධවලට යොමු වන්නට පුළුවන්. පසුගිය කාලයේ කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 300ක් පමණ පුනරුත්ථාපනය වන්නන් සිටියා. 'ඉවත්වෙනු' ජාතික ව්‍යාපාරයත් සමඟ මේ පිරිස 400 දක්වා වැඩි වුණා.

මුල් කාලයේ කුමන මධ්‍යස්ථානයක සිටියත් මාස 03ක කාලයක් රඳවාගෙන සාමාන්‍ය තත්ත්වයට පත් වූ පසු සේනපුර වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට යොමුකොට ඔවුන්ට වෘත්තීය පුහුණුවක් ලබා දෙනවා. මෑතකදී වෘත්තීය පුහුණු අධිකාරිය සමඟ අවබෝධතා ගිවිසුමකින් සේනපුරින් පිටවෙන අයට තෝරගත් සුවිශේෂ පාඨමාලා 10කට NVQ LEVEL 3 සහතිකය ලබා දෙනවා. වෙනත් ලෙඩ රෝග වැලඳී තිබුණොත් පමණක් ඒ අයට බෙහෙත්, යහපත් කායික මානසික තත්ත්වයකට ගෙනඒමේ වැඩසටහන්, කෑම බීම් ලබාදෙනවා වගේ ම ව්‍යායාම, චිකිත්සන ක්‍රම, භාවනා, යෝග වැනි උපදේශන සේවා නොමිලයේ ක්‍රියාත්මක කරනවා.

**ප්‍රශ්නය; මතට ඇබ්බැහිවූවන්ට ඉන් මිදෙන්නට හැකියාවක් තිබෙනවා ද?**

**පිළිතුර;** මතට ඇබ්බැහිවූවන් ඉන් මුදවන්නට රටවල් විවිධ ආකෘති ක්‍රියාත්මක කරනවා. මනෝවිද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක චර්යාමය වෙනසක් තමයි අප සිදු කරන්නේ. රෝගයකට බෙහෙත් දෙනවා හැරෙන්නට ඇබ්බැහියෙන් වැළැක්වීමට බෙහෙත් ලබා දෙන්නේ නැහැ. සාමාන්‍ය ජීවිතයෙන් ඈත් ව යම්කිසි ක්‍රියාවකට ලොල්වීමයි අප ඇබ්බැහිය ලෙස හඳුන්වන්නේ. ඒ ලොල්වීම

> කන්දකාඩුවල ප්‍රධාන පුනරුත්ථාපන මධ්‍යස්ථානයට යවන්නේ වයස අවුරුදු 25-60 අතර පිරිස්. එහි 500කට පමණ පුනරුත්ථාපන පහසුකම් තිබෙනවා. 120කට පමණ පුනරුත්ථාපන පහසුකම් ඇති වව්නියාව මධ්‍යස්ථානයට යොමු කරන්නේ වයස අවුරුදු 18-25 අතර අය. මේ පුනරුත්ථාපන කාර්යයේදී අප විධිමත් ලෙස මේ අය වර්ගීකරණයක් කරනවා. නැතහොත් අපරාධවලට සම්බන්ධ අයත් මේ සමඟ සිටිය හැකි නිසා ඔවුන් සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන්, බලපෑමෙන් අනෙක් අයත් අපරාධවලට යොමු වන්නට පුළුවන්.

සුරාවට, සූදුවට, ලිංගිකත්වයට වෙන්න පුළුවන්. සමාජ විද්‍යාඥයන් පවසන ආකාරයට සාමාන්‍ය පුද්ගලයන් බොහෝ සතුටු වන්නේ අන්තර් ක්‍රියාවලින්. ජීව විද්‍යාත්මකවත් එලෙසමයි. මත්ද්‍රව්‍යවලින් විකෘති, කෘත්‍රිම සතුටක් ලබන්නේ විෂ මත්ද්‍රව්‍යවලින් උපරිම සතුටක් ගන්න ඇබ්බැහිවූවන්.

**ප්‍රශ්නය; පුනරුත්ථාපන කාර්යාංශයේ අලුත් වැඩපිළිවෙළ කුමක් ද?**

**පිළිතුර;** තරුණ දරුවන්, රැකියාවක් කරන්නන් හා නොකරන්නන්, ගෘහ මූලිකයන් ලෙස විෂ මත්ද්‍රව්‍ය ගන්නා අය විවිධ වෙනවා. ඔවුන් විෂ මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ විවිධ ක්‍රමවලින්. මේ නිසා මත්ද්‍රව්‍ය භාවිතය වළක්වන්නත් විවිධ ක්‍රම භාවිත කළ යුතුයි. විෂ මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත්වීමට අපේක්ෂා කරන අයට පුළුවන් රහස්‍යභාවය ආරක්ෂා වන විදිහට 0769627761/0112883891 දුරකතන අංක වෙත පෞද්ගලික ව ඇමතුමක් ලබා දීමෙන් බාර වෙන්නට. ඔවුන් වෙනුවෙන් සේනපුර මධ්‍යස්ථානයක් තිබෙනවා සම්පූර්ණ පහසුකම් සහිත ව. එහි රැකවරණය ලැබෙන මාස 03 ඇතුළත සමාජ මනෝ විද්‍යාත්මක ක්‍රමවලින් සහනදායී මනසක්, සංස්කෘතික වටපිටාවක් මෙන් ම ඔවුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීමේ පරිසරය අප සකස් කර තිබෙනවා. එම මධ්‍යස්ථානයෙන් පිටවූ පසු වසර 02ක් ඔවුන් පිළිබඳ අප පසු විපරමක සිටිනවා වගේ ම ඔවුන්ගේ නිවැසියනුත් උපදේශනයට ලක් කරනවා තමන්ගේ දරුවා රැක බලා ගැනීම, නැවත ප්‍රකෘතිමත් ව සමාජගත වීම සම්බන්ධයෙන්.

**ප්‍රශ්නය; ඉදිරිපත් වන තරුණ තරුණියන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම ගැන සහතික විය හැකි ද?**

**පිළිතුර;** අපේ මධ්‍යස්ථානයට පැමිණි විට ආරූඪ නමක් ඔවුන්ට ලබා දෙනවා ඇතුළෙ සිටින අය පවා ඇත්ත නම දැනගත යුතු නැති නිසා. රෝහල්ගත වූ විට ලබාදෙන රෝගියාගේ පරීක්ෂා වාර්තා පොත රැකියාවකට, සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් කරන්නේ නැහැ. ඒ වගේ ම අප ලබාදෙන පුනරුත්ථාපනකරුගේ ප්‍රගතියත් කිසි විටෙකත් කිසිවකුට ලබා දෙන්නේ නැහැ. මේ පිරිස එන්නේ උසාවිය මගින් නොවන නිසා උසාවියටවත් එම වාර්තා ලබා දිය යුතු නැහැ. සමහර අය රැකියා ස්ථානයෙන් මාසයක් නිවාඩු ලබාගෙන එන්න පුළුවන් පුහුණුවකට සහභාගි වන ආකාරයෙන්. පුහුණුවක්, සහතිකයක් කොහොමත් අප ලබා දෙනවා. එහි රහස්‍යභාවය මෙන් ම ඔවුන්ගේ රැකියාවේ සුරක්ෂිත බව සහතික කරන අතර ම මත්ද්‍රව්‍ය ඇබ්බැහියෙන් මිදී නැවත සාමාන්‍ය පුද්ගලයකු හැටියට ජීවත්වීමේ ආසාව අප ඔවුන්ට ලබා දෙනවා. බූස්ස, මහබේරිතැන්න, කොත්මලේ ආදී ප්‍රදේශවල අලුතෙන් ස්වේච්ඡා මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවීමටත් පියවර ගනිමින් සිටිනවා. එවිට පොලිසියට ඇවිත් ඉල්ලීම් කළත් උසාවියට නොදා පුනරුත්ථාපන නිලධාරියෙකු සම්බන්ධ කරගෙන නිවසේ සිට වුවත් ප්‍රතිකාර ගන්න පුළුවන්.

සාකච්ඡා කළේ;
**ප්‍රියාන් ආර් විජේබණ්ඩාර**

# කුණාටුව මැද ආර්ථිකයට තල්ලුවක්




මහාචාර්ය

**වසන්ත අතුකෝරළ**

ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය




ස්වාභාවික ආපදා නිසා ශ්‍රී ලංකා ආර්ථිකයට විවිධාකාරයේ බලපෑම් එල්ල වී තිබෙනවා. ගංවතුර, නියඟ, නාය යාම්, සුනාමි ආදිය එම ස්වාභාවික ආපදා තත්ත්ව. මේ හේතුවෙන් විවිධ කාලවල විවිධ ප්‍රමාණවලිනුයි ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම් සිදු වී තිබෙන්නේ. 2025 නොවැම්බර් අවසානයේ හා දෙසැම්බර් මුල් කාලයේ ගංවතුර සහ 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ බලපෑම තවමත් ප්‍රමාණාත්මක ව මිනුම් කළ නොහැකි වුවත් එය ඉතාමත් ඉහළ ආර්ථික පිරිවැයක් සහිත ආපදාවක් තත්ත්වයක්.

එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසන පරිදි මෙහිදී හානි වී තිබෙන්නේ 51600ක පමණ වගාබිම්. පසුගිය කන්නයේ මෙරට කුඹුරු ඉඩම් ලක්ෂ 9ක් පමණ සහ අනෙකුත් කාලීන බෝග හෙකටයාර් ලක්ෂයක් පමණ වගා කර තිබුණා. ඒ හැර කර්මාන්ත අංශයටත් සේවා අංශයටත් බලපෑම් ඇති වුණා. ඒ අනුව ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන වන කෘෂිකර්මාන්ත අංශයට, කර්මාන්ත අංශයට හා සේවා අංශයට දිට්වා සුළි කුණාටුවෙන් දැඩි ආර්ථිකමය පිරිවැයක් දැරීමට සිදු වී තිබෙන බව ප්‍රකාශ කළ හැකි වුවත් තවමත් ඒ පිළිබඳ නිවැරදි ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීමට හැකියාවක් නැහැ.

> 2022 වර්ෂයේ ණය අර්බුදයක් පැමිණීම, ඉන්පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගිතා ගිවිසුමක් ඇති කර ගැනීමෙන් පසුව 2025 වර්ෂයේ සියයට 4.8ක පමණ ආර්ථික වර්ධනයක් ඇති කරගෙන යම් ආකාරයක ආර්ථිකයේ නැගී සිටීමට අවශ්‍ය පදනම සකස් කර ගැනීම දක්නට ලැබුණා. මෙවැනි පසුබිමක ඇති වූ ස්වාභාවික ආපදාව ආර්ථිකයට ඉහළ පිරිවැයක් නිර්මාණය කළා.

2022 වර්ෂයේ ණය අර්බුදයක් පැමිණීම, ඉන්පසුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගිතා ගිවිසුමක් ඇති කර ගැනීමෙන් පසුව 2025 වර්ෂයේ සියයට 4.8ක පමණ ආර්ථික වර්ධනයක් ඇති කරගෙන යම් ආකාරයක ආර්ථිකයේ නැගී සිටීමට අවශ්‍ය පදනම සකස් කර ගැනීම දක්නට ලැබුණා. මෙවැනි පසුබිමක ඇති වූ ස්වාභාවික ආපදාව ආර්ථිකයට ඉහළ පිරිවැයක් නිර්මාණය කළා. මේ නිසා ශ්‍රී ලංකාව අපේක්ෂා කළ පරිදි ම ආර්ථිකයේ සියයට 5ක ඉලක්කගත වර්ධනය 2025 වසරේ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වීමේ යම් අවදානමක් තිබුණ ද එය සුළු වශයෙන් පහළ යා හැකියි. 2025 පළමු වැනි සහ දෙවැනි කාර්තුවේදී පිළිවෙළින් සියයට 4.8ක් හා 4.9ක් වූ ආර්ථික වර්ධනය තුන් වැනි හා හතර වැනි කාර්තුවේදීත් ධන වර්ධනයක් පුරෝකතනය කිරීමේ හැකියාව තිබුණා. එහෙත් හතර වැනි කාර්තුවේදී අපේක්ෂා කළ වර්ධනය මේ ව්‍යවසනය නිසා යම් ආකාරයක පහළ යාමක් අපේක්ෂා කරන්න පුළුවන්.

ඇතැමුන් ප්‍රකාශ කරන පරිදි දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආර්ථිකයට සිදු වූ බලපෑම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහනට හෝ 2026 රාජ්‍ය අය වැයට බාධාවක් ලෙසින් මා දකින්නේ නැහැ. එයට හේතුව IMF වැඩසටහනේ ක්‍රියාත්මක වුණේ ආර්ථික අර්බුදය හේතුවෙන් කඩාවැටී තිබූ ආර්ථිකය නැවත නගා සිටුවීමේ වැඩපිළිවෙළක් සමඟ එයින් පීඩාවට පත් ජනතාවට යම් ආකාරයක සහනශීලී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීම. එහෙත් මේ වැඩපිළිවෙළේ ම ඉහළ බදු අය කිරීමක් ද සිදු වුණා. එය රටේ අනාගතය සඳහා අත්‍යවශ්‍ය කාරණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පස් වැනි සමාලෝචනයෙන් ශ්‍රී ලංකාවට විස්තීර්ණ ණය ක්‍රමය යටතේ හය වැනි වාරිකය ඇමරිකන් ඩොලර් මිලියන 350කට ආසන්න ප්‍රමාණයක් ලැබීමට තිබෙනවා. එයින් ඩොලර් මිලියන 200ක් පමණ ඉක්මනින් ලබාදෙන ලෙස ශ්‍රී ලංකා රජය ඉල්ලුම් කර තිබෙනවා. ඒ සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ධනාත්මක ප්‍රතිචාර දක්වා තිබෙන බව පැහැදිලි වන්නේ මේ ස්වාභාවික ආපදා අවස්ථාවේදී ඔවුන් ශ්‍රී ලංකාවට අවශ්‍ය සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කර තිබීමෙන්. මේ නිසා දිට්වා සුළි කුණාටුව හේතුවෙන් රටේ ආර්ථිකයට ඇති වූ හානිය IMF වැඩසටහනට බාධාවක් ඇති නොකරනු ඇතැයි මා විශ්වාස කරනවා.

මෙවැනි ස්වාභාවික ව්‍යසනයක් පවතින විට සංවර්ධන සැලසුම් හා ක්‍රියාමාර්ග අතරමග නතර කර දැමීමට වඩා මෙය ඊට අවස්ථාවක් කර ගැනීමයි වඩාත් ම සුදුසු. IMF වැඩසටහන හෝ 2026 අය වැයෙන් ඉදිරිපත් කරන ලද වෙනත් සංවර්ධන වැඩසටහන් නතර කිරීමෙන් අනාගතයේදී එය ආර්ථිකයට තවත් බරක් එකතු කරනු ඇති. එම නිසා එවැනි වැඩසටහන්වලට මෙය බාධාවක් කර නොගත යුතුයි. 2027 වසරින් පසුව ශ්‍රී ලංකාවේ ණය ගෙවීම තවදුරටත් ඉහළ යාමට නියමිතයි. මේ වන විටත් ශ්‍රී ලංකාව වර්ෂයකට ඩොලර් බිලියන 3කට ආසන්න ප්‍රමාණයක ණය ගෙවමිනුයි සිටින්නේ. 2027 වසරින් පසුව මේ අගය ඩොලර් බිලියන 4 හෝ 5 දක්වා ඉහළ යා හැකියි. මේ නිසා IMF වැඩසටහන සමග ඉදිරියට යාම ශ්‍රී ලංකාවට නවතා දැමීමට හැකියාවක් නැහැ. 2025 වර්ෂයේ දිට්වා සුළිකුණාටුව නිසා ආර්ථිකයට සිදු වූ බලපෑම අවම කර ගනිමින් නැවතත් නැගී සිටීම සඳහා ක්‍රියා කළ යුතු ව තිබෙනවා.

2026 අයවැයෙන් අපේක්ෂා කරන ලද සාර්ව ආර්ථික ඉලක්කවලටත් දැඩි බලපෑමක් මේ ව්‍යසනයෙන් එල්ල වෙන්නේ නැහැ. සෑම වර්ෂයක ම පාහේ ඇති වූ යම් යම් වෙනස්කම් හැරුණුකොට අය වැය හිඟයේ පවා විශාල වෙනස්කමක් ඇති විය නොහැකියි. එයට හේතුව මේ වන විටත් දෙස් විදෙස් ආධාර වශයෙන් ශ්‍රී ලංකාවට රුපි මිලියන 3000කට ඉහළ ප්‍රමාණයක් ලැබී තිබෙනවා. කළ යුත්තේ මේ ආධාර උපරිම කාර්යක්ෂමතාවකින් යෙදවීම. සහන අවශ්‍ය වුවත් සහන දීමත් සමඟ නව ක්‍රමවේද ඔස්සේ යටිතල පහසුකම් වර්ධනය, නගර නිර්මාණය වැනි කාර්ය සඳහා ඒවා යෙදවිය යුතුයි. රජය ප්‍රකාශ කර තිබෙනවා 2026 අය වැය වෙනස් නොකළත් ඒවායේ ප්‍රමුඛතා යම් ආකාරයක වෙනසකට ලක්කරන බව. එය ඉතා යහපත් තත්ත්වයක්.

දිට්වා සුළි කුණාටුව නිසා ඇති වූ බලපෑම ශ්‍රී ලංකාවට ලැබුණු සංවර්ධන අවස්ථාවක් ලෙසින් සලකා ක්‍රියා කළ හැකි පැති කිහිපයක් ම තිබෙනවා. ශ්‍රී ලංකා ආර්ථිකය දිගු කාලයක් අයාලේ ගිය ආර්ථිකයක්. ව්‍යාපාර ලියාපදිංචි කිරීම අවමයි. අනවසර ඉදිකිරීම් බහුලයි. නගර සැලසුම්කරණයක් නැති තරම්. මේ අවස්ථාවේදී හෝ එවැනි ගැටලු නිරාකරණය කරගෙන ඉදිරියට යාම ආරම්භ කළ යුතුයි. මේ වන විටත් රජය අනවසර ඉදිකිරීම් පිළිබඳ අවධානය යොමු කර තිබෙනවා. එය වුවත් ප්‍රමාණවත් නැහැ. පරිසරය පිළිබඳ සැලකිලිමත් වෙමින් ඉදිකිරීම් සැලසුම් කළ යුතුයි. ගංවතුර හානි සඳහා විශාල වශයෙන් වන්දි ලබා දෙන අතර ම ඇතිවිය හැකි නව ඉදිකිරීම් පිළිබඳ අවධානය යොමු කිරීමත් වැදගත්. තනි තනි තිරස් ඉදිකිරීම් සඳහා සෑම ආකාරයකින් ම වැය වෙන වර්තමාන සහ අනාගත පිරිවැය සිරස් ඉදිකිරීම්වලින් විශාල ලෙස අවම කර ගැනීමේ හැකියාව තිබෙනවා. මේ සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ලබා ගත හැකියි. නිවාස හානි වූ පුද්ගලයන් හෝ අනවසර ඉදිකිරීම්වල පදිංචි පිරිස් හෝ සඳහා පෞද්ගලික අංශයේ දායකත්වයෙන් සුදුසු ස්ථානයක නිවාස සංකීර්ණයක් (Apartments) ගොඩනගන්න පුළුවන්. මේ නිවාස සංකීර්ණය ව්‍යාපාරික නගරයක් ලෙසින් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබා දීමෙන් අවම අවදානමක් සහිත සුරක්ෂිත ජන ජීවිතයකට අවශ්‍ය පරිසරය සකසනු ඇති. එසේ ම ශ්‍රී ලංකාවට ආධාර සහ වෙනත් අනුග්‍රහ දැක්වීමට කැමැත්තෙන් සිටින ජාත්‍යන්තර ප්‍රජාවට ඒ සඳහා පවතින නීතිමය සහ අනෙකුත් බාධා ඉවත් කිරීමට ක්ෂණික ව ක්‍රියා කළ යුතුයි. වගකීම් සහිත රාජ්‍ය නිලධාරින්ට ඊට අදාළ කාර්ය පැවරීමත් දූෂණ හා වංචනික ක්‍රියා සඳහා කඩිනමින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුත්තක්.


දිට්වා සුළි කුණාටුව නිසා ඇති වූ බලපෑම ශ්‍රී ලංකාවට ලැබුණු සංවර්ධන අවස්ථාවක් ලෙසින් සලකා ක්‍රියා කළ හැකි පැති කිහිපයක් ම තිබෙනවා. ශ්‍රී ලංකා ආර්ථිකය දිගු කාලයක් අයාලේ ගිය ආර්ථිකයක්. ව්‍යාපාර ලියාපදිංචි කිරීම අවමයි. අනවසර ඉදිකිරීම් බහුලයි. නගර සැලසුම්කරණයක් නැති තරම්. මේ අවස්ථාවේදී හෝ එවැනි ගැටලු නිරාකරණය කරගෙන ඉදිරියට යාම ආරම්භ කළ යුතුයි. මේ වන විටත් රජය අනවසර ඉදිකිරීම් පිළිබඳ අවධානය යොමු කර තිබෙනවා.

සියල්ල ධනාත්මක ව සිදු වුවහොත් වසරක් ඉක්මවීමට පෙර ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වෙනු ඇතැයි මා විශ්වාස කරනවා. රජය ඒ සඳහා ක්‍රියා කරන බව පෙනී යනවා. එහෙත් එහි ඵලදායිතාව තීරණය වන්නේ රාජ්‍ය නිලධාරින් අවංක ව සහ කාර්යක්ෂම ව තම කාර්ය ඉටු කරනවා ද? යන්න මත. මෙහිදී රජය යම් ඉලක්කගත වැඩසටහනකට අනුව රාජ්‍ය නිලධාරින් කාර්යක්ෂම ව යෙදවීම අත්‍යවශ්‍ය කාරණයක්. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයේ දැකිය හැකි ලක්ෂණයක්නම් යම් රැකියාවක් සඳහා පමණක් රජයේ නිලධාරියා පුහුණු වී තිබීම සහ ඇතැම් විට එම පුහුණුව සාමාන්‍ය පුහුණුවක් පමණක් වීම. මේ නිසා රජයේ නිලධාරින් මෙවැනි අවස්ථාවක යෙදවීමේදී ගැටලු සහගත තත්ත්ව පැන නගිනවා. රාජ්‍ය සේවකයා පුළුල් වපසරියක ක්‍රියා කළ හැකි පුහුණුවක් සහිත සේවකයෙකු වශයෙන් නිර්මාණය කිරීම අනාගතයේදී හෝ වැදගත් වනු ඇති. ඒ සඳහා පවතින නීතිමය බාධා ඉවත් කිරීමෙන් හෝ නව නීති සම්පාදනයෙන් මෙවැනි අවස්ථා සඳහා රාජ්‍ය සේවකයන් කාර්යක්ෂම ව යොදවා ගැනීම පිළිබඳවත් රජය අවධානය යොමු කිරීම වැදගත්.

මේ සියලු තත්ත්ව සඳහා බලපාන ඉතාමත් කඩිනමින් අවධානය යොමු කළ යුතු ගැටලුවක් වන්නේ ශ්‍රී ලංකාවේ කාර්යක්ෂම වූ තත්‍යකාලීන දත්ත පදනමක් (Real Time Data) නොමැති වීම. මේ සඳහා ඩිජිටල් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම කළ හැකියි. ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී වසම් 14000කට මඳක් වැඩියෙන් තිබෙනවා. එක් ග්‍රාම නිලධාරී වසමකට රාජ්‍ය නිලධාරින් 05ක් පමණ අනුයුක්ත කර සිටින නිසා මේ නිලධාරීන්ට දත්ත රැස් කිරීමට සිදු වන්නේ ඉතා කුඩා භූගෝලීය ප්‍රදේශයක. ඔවුන්ට ඉතාමත් පහසුවෙන් තත්‍යකාලීන දත්ත අන්තර්ජාලය භාවිතයෙන් නිරන්තරයෙන් මධ්‍යගත දත්ත ගබඩාවකට එවීම සිදු කළ හැකියි. සිදු කළ යුත්තේ ඒ සඳහා වන පුහුණුව සහ අවශ්‍ය පහසුකම් ඔවුන්ට ලබා දීම පමණයි. මෙය ආපදා තත්ත්වයකදී පමණක් නොවෙයි ඕනෑ ම කාර්යයක් සඳහා ඉතාමත් වැදගත් සහ අත්‍යවශ්‍ය තත්ත්වයක්.

ඒ අනුව දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ බලපෑම ශ්‍රී ලංකා ආර්ථිකයේ පිම්මකට හොඳ පදනමක් සපයා ගත හැකි ආකාරයෙන්, එය ම අවස්ථාවක් කර ගැනීමයි මේ අවස්ථාවේ කළ යුතු වන්නේ.

**දීප්ත කුමාර බටගොඩ**




# පුනරුද මෙහෙයුමක පුළුල් වේදිකාව

## ඩිජිටල්කරණය

**ධනුෂ්ක හර්ෂණ වික්‍රමරත්න**

'සමාජමය ශ්‍රම මෙහෙයුම', 'සමාන අයිතිය' හා 'පුළුල් ශ්‍රම නිදහස' සහිත 'සමාජවාදය' නම් ලද ලෝකය ගොඩනැගෙන්නේ ධනවාදයේ ම වර්ධනයේ පෙළඹුමක් ලෙස. එහෙත් එය ධනවාදී ගර්භාෂය තුළ බිහි වන කලලයක් නොවෙයි. මිනිසා තම 'මානව සමාජ ගමන' අරඹන්නේ ගල් අවි තාක්ෂණය සමඟ. වත්මන් පරිගණක තාක්ෂණය ඔස්සේ ඩිජිටල්කරණය දක්වා ද කෘත්‍රිම බුද්ධිය දක්වා ද පිවිස තිබෙන එය ඓතිහාසික ගමන් මඟක වර්ධනයේ ප්‍රතිඵලය.

විශ්වය ප්‍රසාරණය හා පුළුල් සක්‍රිය බව අරඹන්නේ මෙයට වසර සියකෝටි 13.5කට පෙර බව විශ්ව න්‍යාය විද්‍යාව තහවුරුකොට තිබෙනවා. එහිදී සක්‍රිය වන්නේ ශක්තිය හා පදාර්ථය. එය ද්‍රව්‍ය සංවර්ධනය නම් පොදු ගුණයට ගැනෙනවා. අදින් වසර සියකෝටි 4.5කට පෙර බිහිවූ පෘථිවියේ එම ද්‍රව්‍ය සංවර්ධනයේ ම ඵලයක් ලෙස අදින් වසර සියකෝටි 3.8කට පෙර ජීවය බිහි වුණා. අදින් වසර දශලක්ෂ 6කට පෙර මිනිසාගේ සහ චිම්පන්සියාගේ මිත්තණිය විසූ බව ෆොසිල විද්‍යාව තහවුරු කරන අතර හෝමෝ ගණයේ වානරයා මිනිසා බවට පත්වෙමින් පළමු ගල් අවිය නිපදවා ඇත්තේ අදින් වසර දශලක්ෂ 2.5කට පෙර. ඉන් පෙර ඔවුන් උපකරණ බවට පත්කොට ගත්තේ සත්ත්ව ඇටකටු, සොබාදහමේ හමුවන දෙය.

මිනිසා අදින් වසර ලක්ෂ 3කට පෙර ගින්දරවල ගුණය හඳුනා ගැනීම තාක්ෂණ වර්ධනයේ නව හැරවුමක්. ගින්නෙහි තාක්ෂණික හැකියාව හඳුනාගත් මිනිසා පදාර්ථ මෙළෙක්කොට හැසිරවීම හා ශක්තිමත් කිරීම සඳහා එය යොදා ගත්තා. දැඩි ව වෙහෙස ව සමහර විට පරම්පරා කිහිපයක් නිපදවූ ගල් අවිය නිපදවීමේ තාක්ෂණය ද භාවිතයේ තාක්ෂණය ද උගත් මිනිසා තාක්ෂණය හසුරුවන්නෙක් වුණා. ඔහුට හුරුබුහුටි අතක් ද තියුණු ඇසක් ද ලැබෙන්නේ මෙහි ප්‍රතිඵලයක් ලෙස. වසර 12000කට පෙර ඇරඹි සත්ත්ව හා ශාක බෝ කිරීම නව තාක්ෂණයට මඟක් වුණා. අදින් වසර 200කට පමණ පෙර ඇරඹි කාර්මික විප්ලවය විසින් මිනිසා යොමු කරන ලද්දේ තමන් සෘජු ව හසුරුවන උපකරණවලින් මිදී වෙනත් ස්වාභාවික බලය ඔස්සේ මෙහෙයවන යන්ත්‍ර විප්ලවයකට. මිනිසාට යන්ත්‍ර හැසිරවීමේ ශ්‍රම කාර්යය පමණක් ඉතිරි වූ අතර එතැන් පටන් ඔහු සැලසුම් කරන්නෙකු හා මෙහෙයවන්නෙකු පමණක් වුණා. යන්ත්‍ර මෙහෙයවන යන්ත්‍ර බිහිවන්නේ එලෙසින්. මේ සඳහා දත්ත රැස්කිරීම හා ගණනය වැදගත් කර්යයක් ඉටු කළා. එය මිනිස් මොළයේ ස්නායු මෙහෙයුමෙන් එහා ගෙන යමින් යන්ත්‍රයකට පවරන්නට ඔහුට හැකි වුණා. මිනිස් මොළය නම් සිතිමේ ඉන්ද්‍රිය සපයන මෙහෙයුම් ඔස්සේ යාන්ත්‍රික ව සිතන්නට හැකි පරිගණක බිහිවන්නේ මේ ඔස්සේ.

මෙවැනි සිතවන මැෂින් දූන් ඉටු කරන්නේ මානව ශ්‍රම ක්‍රියාවලියේ තීරණාත්මක මෙහෙයුමක්. මිනිසා කවදත් සන්නිවේදනය මත තම සාමූහිකත්වය පවත්වාගත් සත්ත්වයෙක්. තම අත්විඳීම්, අත්දැකීම් හුවමාරු කරගත් සත්වයෙක්. මානවයා තම ශ්‍රම මෙහෙයුම් සැලසුම් කළේ එවැනි දත්ත ඔස්සේ. එම දැනුම පෙරළා ඔහුගේ චින්තනය පුළුල් කරන අතර යන්ත්‍ර මෙහෙය වන චාලක බලයක් ගවයා වැනි සතුන්ගෙන් ද ජලය, ජලවිදුලිය වැනි බලවේග ඔස්සේ ද ලබාගත් මිනිසා වත්මනෙහි යන්ත්‍ර මෙහෙයවන චාලක බලය ඩිජිටල් මෙහෙයුම් ඔස්සේ ලබා ගන්නවා. ඉන් ඔබ්බට දත්ත රැස්කිරීම, දත්ත විශ්ලේෂණය, දත්ත සංශ්ලේෂණය හා දත්ත සැලසුම්කරණය ඔස්සේ මෙහෙයුම් සකස් කිරීම හා මෙහෙයවීම සඳහා මිනිස් චින්තනයේ යම් යාන්ත්‍රික පංගුවක් අත්පත් කරගනු ලබන්නේ ඩිජිටල් තාක්ෂණය විසින්. ඒ නිසා පුනරුද මෙහෙයුමක් හෝ සාමාන්‍ය තත්ත්වයේ සංවර්ධන මෙහෙයුමක් හෝ සඳහා අද ඩිජිටල් තාක්ෂණය තීරණාත්මක සාධකයක්. සමාජයට කිසිදා ශ්‍රම මෙහෙයුම්වලින් මුළුමනින් ම නිදහස් විය නොහැකි වුවත් ඔහු ක්‍රමක්‍රමයෙන් ළඟා වන්නේ ශ්‍රමයෙන් හැකි උපරිම නිදහස් වෙමින් යන්ත්‍ර මෙහෙයවා ඒවා කර ගැනීමට. ඒ ඔස්සේ තම සංස්කෘතික ජීවිතයට අවැසි උපරිම කාලය ඉතිරි කරගැනීමයි එහි අරමුණ.

පංති බෙදුණු සමාජයකදී මේ උත්සාහයේ ම ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයක් හෙවත් ප්‍රතිපක්ෂයක් දක්නට ලැබෙනවා. පංති සමාජයේ දියුණුතම හා ශ්‍රම සූරාකෑම ඉහළ ම සමාජය වන 'ධනවාදය' සලකා බලන්නේනම් තාක්ෂණ දියුණුව යනු බලවත් පංතිය සතු උපකරණයක්. එබැවින් තාක්ෂණය අඛණ්ඩ ව දියුණුවත් ම ශ්‍රමයේ නිදහස තව තවත් අඩු වෙනවා. එහෙත් එයට පිළිමල් ව විය යුත්තේ තාක්ෂණ දියුණුව මානව ශ්‍රම මෙහෙයුමේ පංගුව අඩු කිරීමට දායක වීම. එම ගැටලුව ධනවාදයෙන් විසඳිය නොහැකියි. ඉන් එහා වුව ක්ෂණික ව එක් රැයකින් විසඳිය නොහැකියි. සමාජය ගොඩනැඟිය යුත්තේ සාමුහික නිෂ්පාදනය, සාමුහික ව බෙදී යන සැලසුම් සහගත සමාජයක් ලෙසට. එවැනි සමාජයක සාමුහික සමාජ ශ්‍රමය කාර්යක්ෂම කිරීමේ කාර්යය ඩිජිටල් තාක්ෂණය ප්‍රමුඛ යන්ත්‍රවලට පවරා සමාජ ශ්‍රම විමුක්තිය උදා කර ගන්නට පුළුවන්. ඉන් මිනිසාගේ විවේක බුද්ධිය ඔස්සේ නිර්මාණශීලීත්වයට ද සංස්කෘතික ජීවිතය ඔස්සේ ආධ්‍යාත්මික සතුටට ද වැඩි ඉඩක් අත්පත් වෙනවා. මිනිසා තාක්ෂණය වර්ධනය කරන්නේ ජීවිතයේ 'විඳවීම' අඩු කර ජීවිතය 'වින්දනය කිරීමට'.

මෙවැනි පසුබිමක ශ්‍රී ලංකාවේ නව පාලනයේ ඩිජිටල්කරණ ප්‍රතිපත්තිය විමසා බැලීම වැදගත්. රට ඉදිරියට ගෙන යා හැක්කේ පවතින තැන සිට. ඒ නිසා වත්මන් පාලනය එකිනෙකින් වෙන් නොවන ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන, ග්‍රාමීය දුප්පත්කම නැති කිරීම, ඩිජිටල්කරණය යන ප්‍රධාන තේමා තුනක් ඔස්සේ සංවර්ධනය ඉලක්ක කරනවා.

මේ ත්‍රිත්වය එකිනෙකට සම්බන්ධිත ව සිදුවන සංවර්ධන මෙහෙයුමක්. සමාජයේ භෞතික හා ආධ්‍යාත්මික පිරිසිදු බව සඳහා මෙහෙයුම ක්ලීන් ශ්‍රී ලංකා වන අතර ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කිරීමේ ප්‍රජාශක්ති යාන්ත්‍රණය හා එය අන්‍යෝන්‍ය ව සම්බන්ධ වී ක්‍රියාකාරී වෙනවා. ඩිජිටල්කරණය මේ තේමා දෙක ම සමඟ සම්බන්ධ වෙනවා. ක්ලීන් ශ්‍රී ලංකා ඔස්සේ මත් උවදුර හා දූෂණය පරාජය කිරීම රැකුලක් වෙනවා ග්‍රාමීය දුප්පත්කම තුරන් කිරීමට. ඩිජිටල් හැඳුනුම් පත වැනි උපකරණවලින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවත් විශ්වසනීයත්වයත් තහවුරු කිරීම වැදගත් වෙනවා ග්‍රාමීය දුප්පත්කම තුරන් කිරීමට.

සමාජ නිෂ්පාදන ක්‍රියාවලිය යනු නිෂ්පාදනය, බෙදාහැරීම, හුවමාරුව සහ පරිභෝජනය. ඩිජිටල්කරණය යනු මේ ක්‍රියාවලියේදී මිනිස් ආර්ථික සම්බන්ධතා සහ සමාජීය සම්බන්ධතා ඩිජිටල් රැහැන්වලින් සම්බන්ධ කිරීම. එහිදී භාණ්ඩ වුවත් සේවා වුවත් මේ සියල්ල ඩිජිටල් තාක්ෂණයෙන් බැඳෙනවා. එවිට එම සම්බන්ධතාවල කාර්යක්ෂම බවත් විශ්වසනීයත්වයත් තහවුරු කළ හැකියි. එයට අදාළ මෘදුකාංග පරිශීලකයා ද ඩිජිටල් හුරුවෙන් සන්නද්ධ වෙනවා.

Gov Pay මෘදුකාංගයෙන් ක්‍රමයෙන් සිදු වන්නේ රජය සමඟ පුරවැසියාගේ ගනුදෙනු වේගවත් හා පහසු කිරීම. 2025 පෙබරවාරි 07 දින ආරම්භ කළ එය මේ වන විටත් සම්බන්ධ කර තිබෙන්නේ රාජ්‍ය ආයතන 52ක්. ආරම්භයේදී එහි ඉලක්කය වූයේ රාජ්‍ය ආයතන 100ක් හා සම්බන්ධ කිරීම. එය තවත් පුළුල්වනු ඇති. ග්‍රාමීය මෙන් ම නාගරික පුරවැසියාට රජය සමඟ ගෙවීම් හා ගනුදෙනු පහසු වූ විට ආයතන වෙත පිවිසීමේ ගමනාගමනය අඩු වීම, දෛනික කාලය ඉතිරි වීම, බිල් නොගෙවීම් ආදියෙන් විය හැකි විදුලි විසන්ධිවීම් වැනි අපහසුතා වැළැක්වීම ලැබෙන වාසි අතරට අයත්. ඩිජිටල් හැඳුනුම්පත නිසා ද දෛනික රාජ්‍ය සේවා ලබාගැනීම් පහසු වන අතර ගමන් වෙහෙස සහ වියදම වැළකෙනවා. රෝහල් වැනි ආයතන තුළ තෙරපීම, රස්තියාදුව, පෝලිම ඉවත් වෙනවා. චීනයේ රෝහලට ගිය පසු රෝගියා මුහුණින් හඳුනා ගන්නා ඩිජිටල් උපකරණ ඇති අතර ඉන්පසු වෛද්‍යවරයා වෙත රෝගියාගේ සියලු වාර්තා යොමු වන්නේ පරිගණකය ඔස්සේ. එවිට වෛද්‍යවරයාගේ නිරීක්ෂණය අනුව ඖෂධ නිර්දේශය ඖෂධ අංශයට යොමු කළ පසු රෝගියාගේ නමට අදාළ බෙහෙත් අඩංගු පාර්සලය ඔහු අතට පත්වන්නේ යන්ත්‍ර මාර්ගයෙන්. මෙරට ගමනාගමනය කළමනාකරණයට ද ඩිජිටල් තාක්ෂණය වැදගත්. කෘත්‍රිම බුද්ධියෙන් අනාගත මිනිසා තම දෛනික කාර්ය සියල්ල ඉටු කර ගන්නා තත්ත්වයකදී රට ඩිජිටල්කරණය ඔස්සේ ක්‍රමයෙන් ඒ වෙත යා යුතුයි. දැනට ලෝක වෙළෙඳ පොළේ පවතින රැකියා හා ව්‍යාපාර අවස්ථා වෙත තරුණයා යොමු කළ හැකි ආර්ථික මාවත් ද මෙහි පවතිනවා. යුක්තිය පසිඳලීම මෙන් ම අධ්‍යාපනය සහ සියලු මානව ගනුදෙනු ඩිජිටල්කරණය ඔස්සේ සිදු කිරීමෙන් මානව ශ්‍රමය උසස් තලයකට ද නිදහස් අවස්ථාවකට ද පත් වෙනවා.

නව පාලනයේ ඩිජිටල්කරණ ප්‍රවේශයේ පරිමාව ඩිජිටල් තාක්ෂණය වර්ධනය වී ඇති මට්ටමට සාපේක්ෂ ව කුඩා විය හැකියි. එහෙත් එය සමාජ පුරුද්දක් දක්වා පුළුල් කරන ඉලක්කය සමාජය සතු විය යුතුයි. පාලනය විසින් පහසුකම් සපයනු ලබන විට ඩිජිටල්කරණයේ ඵලදාව නෙළා ගත යුත්තේ සමාජය. ඒ සඳහා පෙළඹවීමේ ධෛර්යය පාලනය සතු ව පවතින තුරු ඉලක්කය හඹා යෑම අපහසු නැහැ. එදා විප්ලවීය ගුරුවරයා සහ නායක ලෙනින් පැවසුවේ සෝවියට් දේශය විද්‍යුත්කරණය සම්පූර්ණ කරන තුරු සමාජවාදය ජයග්‍රහණය නොවන බව.

1920 දෙසැම්බර් මාසයේ වී අයි ලෙනින් විසින් (වත්මනේ ඩිජිටල්කරණය තරම්) එවකට උසස් තාක්ෂණය වූ 'විද්‍යුත්කරණය' සමාජවාදී සෝවියට් දේශයට ගෙන ඒමේ අරගලය වෙනුවෙන් 8 වැනි සෝවියට් සභා සම්මේලනයට ඉදිරිපත් කිරීමට ලියූ යෝජනාවයි මේ.

"තව ද, මෙම සැලැස්ම වෙනුවෙන් ඉතාමත් පුළුල් ප්‍රචාරයක් ගෙනයාමට සහ නගරවල හා ගම්බද පෙදෙස්වල සිටින පුළුල්තම ජනතා කොටස්වලට ඒ ගැන කරුණු වටහා දීමට සෑම පියවරක් ම ගන්නා ලෙස සම්මේලනය ආණ්ඩුවට උපදෙස් දෙන අතර එසේ කරන ලෙස සමස්ත රුසියා වෘත්තීය සමිති මධ්‍යම මණ්ඩලයෙන් සහ සමස්ත රුසියා වෘත්තීය සමිති සම්මේලනයෙන් ඉල්ලයි. මෙම සැලැස්ම ගැන අධ්‍යයනය කිරීම කිසි ම විශේෂයක් නොමැති ව, සමූහාණ්ඩුවේ තිබෙන සියලු ම අධ්‍යාපන ආයතනවලට හඳුන්වා දිය යුතු ය. සෑම විදුලිබල ස්ථානයක් ම තරමක් හෝ හොඳින් සංවිධානය වී ඇති සෑම ෆැක්ටරියක් ම සහ රජයේ ගොවිපොළක් ම විදුලිබලය සහ නවීන කර්මාන්තය පිළිබඳ ප්‍රතිපත්ති උගැන්වීමේ මධ්‍යස්ථානයක් ද, විද්‍යුත්කරණය සඳහා සැලැස්ම ගැන ප්‍රචාරය කිරීමේ හා එය ක්‍රමානුකූල ලෙස අධ්‍යයනය කිරීමේ මධ්‍යස්ථානයක් ද බවට පත්විය යුතු ය. ප්‍රමාණවත් තරම් විද්‍යාත්මක නැතහොත් ප්‍රායෝගික දැනුම ඇති පුද්ගලයන් සියලුදෙනා ම විද්‍යුත්කරණ සැලැස්ම ගැන ප්‍රචාරක කටයුතු කිරීම සහ එය වටහා ගැනීමට අවශ්‍ය දැනුම අන් අයට දීම සඳහා සංවිධානය කරගත යුතු ය."



# ඇවිළෙන ගාසාව

චන්දන මාරසිංහ

ඊශ්‍රායලය, ඊජිප්තුව සහ මධ්‍යධරණී මුහුදෙන් වට වූ ගාසා තීරය දිග කිලෝමීටර් 41කින් හා පළල කිලෝමීටර් 10කින් යුතු ලොව වඩාත් ම ජනාකීර්ණ ස්ථානයක්. මේ හේතුවෙන් ඊශ්‍රායල මෙහෙයුම්වලින් ගාසා තීරයට හා සිවිල් වැසියන්ට බරපතළ බලපෑම් එල්ල වූ අතර ප්‍රහාරවලට අමතර ව කුසගින්න හේතුවෙන් බොහෝ මියයාම් ද වාර්තා වුණා.

2023 ඔක්තෝබර් මස 07 දින හමාස් සංවිධානය ඊශ්‍රායලයට එල්ල කළ ප්‍රහාරයකින් 1,139 දෙනෙකු මිය ගිය අතර තවත් 200 දෙනෙකු පමණ හමාස් සංවිධානය ප්‍රාණ ඇපයට ගත්තා. මේ ප්‍රහාරයට ප්‍රතිචාර දැක්වීම සඳහා ඊශ්‍රායලය ගාසා තීරයේ ආරම්භ කළේ දැවැන්ත මෙහෙයුමක්. එහි ප්‍රතිඵලයක් ලෙසයි 2025 දෙසැම්බර් මාසය වන විට පලස්තීන ජාතිකයන් 70,100ක් මියගොස් 170,965 දෙනෙකු තුවාල ලැබීම දක්වා මේ ඛේදවාචකය දරුණු මානුෂීය අර්බුදයක් බවට පත් ව ඇත්තේ.

මිලියන 2.1ක් වූ ගාසා තීරයේ ජනගහනයෙන් යුද්ධය හේතුවෙන් මිලියන 1.9ක් අවතැන් වී සිටිනවා. ළමයින් 39,000කට තම මව හෝ පියා හෝ දෙදෙනා ම හෝ අහිමි වී අවසන්. Save the Children ආයතනය පෙන්වා දෙන ආකාරයට 139,000ක් මන්දපෝෂණයෙන් පෙළෙනවා. යුද්ධයෙන් ළමයින් 50,000ක් මිය ගොස් හෝ තුවාල ලබා හෝ ඇති බව යුනිසෙෆ් සංවිධානය අනාවරණය කරන විට Save the Children ආයතනය පවසන්නේ එහිදී ළමයින් 20,000ක් පමණ මිය ගොස් ඇති බව. ආහාර, ජලය, ඖෂධ හා සනීපාරක්ෂක ද්‍රව්‍ය නොමැති වීම හේතුවෙන් ගාසා තීරය මිහිපිට අපායක තත්ත්වයට පත් ව ඇති බව එක් අවස්ථාවකදී ජගත් සංවිධානය පෙන්වා දුන්නා.

ඊශ්‍රායල මෙහෙයුම් හේතුවෙන් පලස්තීන සිවිල් වැසියන්ට එල්ල වන මේ පීඩනය අවම කිරීම සඳහා සටන් නතර කරන ලෙස විවිධ රටවල් හා ජාත්‍යන්තර සංවිධාන අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර තිබෙනවා. ඊශ්‍රායලයට ජන සංහාරක චෝදනා එල්ල කරමින් දකුණු අප්‍රිකාව ජාත්‍යන්තර අධිකරණයේ නඩුවක් ද ගොනු කළා. 2025 ජනවාරි 26 දින ජාත්‍යන්තර අධිකරණය මෙහෙයුම් නතර කරන ලෙසට ඊශ්‍රායලයට දැනුම් දුන්නා. එහෙත් එම කිසිදු ඉල්ලීමකට හෝ නියෝගයකට හෝ ඊශ්‍රායලය අවනත වූයේ නැහැ. එහි ප්‍රතිඵලයක් ලෙස ආධාර ලබා ගැනීම සඳහා පෝලිම්වල රැඳී සිටි සිවිල් වැසියන් පවා ඊශ්‍රායල ප්‍රහාරවලින් ඝාතනය වුණා. 2024 මැයි 06 දින සටන් විරාමයකට සූදානම් බව හමාස් සංවිධානය දන්වා සිටියත් ඊශ්‍රායලය ඊට එකඟ වූයේ නැහැ. වසර 25කට පසුව 2024 අගෝස්තු 23 ගාසා තීරයෙන් පෝලියෝ රෝගියෙකු හමුවූ බව ද ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශ කර තිබෙනවා.

ඇමරිකාවේ ජනාධිපති ධුරයට පත්වූ ඩොනල්ඩ් ට්‍රම්ප් 2024 දෙසැම්බර් 02 දින ප්‍රකාශ කළේ 2025 ජනවාරි 25 දිනට පෙර ගාසා තීරයේ රඳවා සිටින ප්‍රාණ ඇපකරුවන් නිදහස් නොකළහොත් දැඩි ප්‍රතිවිපාක විඳීමට සිදුවන බව. ඒ අනුව 2025 ජනවාරි 15 දින සටන් විරාමයක් පිළිබඳ එකඟතාවක් ඇති වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජනවාරි 19 දින හමාස් සංවිධානය යටතේ සිටි ප්‍රාණ ඇපකරුවන්ගෙන් පළමු කණ්ඩායම නිදහස ලබන නමුත් පෙබරවාරි 20 දින වන විට ඊශ්‍රායලය සටන් විරාමය උල්ලංඝනය කරන බව සඳහන් කරමින් ප්‍රාණ ඇපකරුවන් නිදහස් කිරීම නතර කිරීමටයි හමාස් සංවිධානය තීරණය කළේ.

මෙවැනි පසුබිමක 2025 ජූලි මාසයේදී බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ප්‍රංශය හා ඉතාලිය ඇතුළු රටවල් 27ක් යුද්ධය වහා ම අවසන් කරන ලෙස ඉල්ලා සිටි අතර 2025 සැප්තැම්බර් 29 දින ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු සමඟ එක් ව ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ධවල මන්දිරයේදී



සාම සැලැස්මක් ප්‍රකාශයට පත් කළා. ඔක්තෝබර් මාසය වන විට එම සැලසුමට එකඟ බවයි හමාස් සංවිධානය ප්‍රකාශ කළේ. ඒ අනුව ප්‍රාණ ඇපකරුවන් 20 දෙනෙකුට නිදහස හිමි වූ අතර ඊශ්‍රායල අත්අඩංගුවේ සිටි පලස්තීන ජාතිකයන් 1000කට ආසන්න පිරිසක් නිදහස් වුණා. ඇමරිකාව, කටාර්, ඊජිප්තුව සහ තුර්කිය මේ සටන් විරාමයේ මැදිහත්කරුවන්. ඒ අනුව ඔක්තෝබර් 10 දින සටන් විරාමය ප්‍රකාශයට පත් කෙරුණු අතර එහිදී ගාසා තීරයේ ඊශ්‍රායල පාලනයට යටතේ ඇති කොටස හරිත කලාපය ලෙසත් අවතැන් පලස්තීන ජාතිකයන් රඳවා සිටින ප්‍රදේශය රතු කලාපය ලෙසත් නම් කෙරුණා. එම කොටස් දෙක වෙන් වන්නේ කහ රේඛාව නමැති කොටසින්. ජනපති ට්‍රම්ප් ඉදිරිපත් කළ කරුණු 20කින් සමන්විත යෝජනාවට නොවැම්බර් මස 17 දින ජගත් ආරක්ෂක මණ්ඩල අනුමැතිය හිමි වුණා. එහිදී ආරක්ෂක මණ්ඩල සාමජිකයන් 13 දෙනෙකු යෝජනාවට පක්ෂ වූ අතර රුසියාව හා චීනය ඡන්දය දීමෙන් වැළකී සිටියා. රුසියාව හා චීනය යන රටවල් එම යෝජනාවට දැඩි ලෙස විවේචන එල්ල කළා.  යම් හෙයකින් ඔවුන් ආරක්ෂක මණ්ඩලයේ තම නිෂේධ බලය යොදා ගත්තානම් යෝජනාව සම්මත වන්නේ නැහැ. මේ යෝජනාවට ඊජිප්තුව, සවුදි අරාබිය, තුර්කිය ඇතුළු මුස්ලිම් ජාතීන් 08ක් සහය පළ කර තිබෙනවා. රුසියාව හා චීනය සිය නිෂේධ බලය යොදා නොගැනීමේ ප්‍රධාන සාධකය එම අරාබි රටවල දායකත්වය ලෙස පෙන්වා දිය හැකියි.

ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ යෝජනාවලට අනුව ගසා තීරයේ සංක්‍රාන්ති පාලනයක් සහ ජාත්‍යන්තර ස්ථාවරකරණ බලකායක් පිහිටුවීමට නියමිත ව තිබෙනවා. එහිදී පලස්තීන පොලිස් බලකායකට පුහුණුව ලබාදෙන අතර ඔවුන් ඊශ්‍රායලය සහ ඊජිප්තුව සමග එක් ව ක්‍රියා කිරීමටයි නියමිත. හමාස් සංවිධානය නිරායුධ විය යුතු සේ ම ඔවුන්ගේ යුද මධ්‍යස්ථාන විනාශ කිරීම ද මේ සැලසුමට අයත්. ගසා තීරයේ පාලනය සඳහා හමාස් සංවිධානය ඍජු ව හෝ වක්‍ර ව හෝ දායක නොවිය යුතු බවත් එම යෝජනාවල සඳහන් කර තිබෙනවා. මේ යෝජනා මාලාවට අනුව ගාසා තීරයේ කටයුතු මෙහෙයවීම සම්පූර්ණයෙන් ම ඇමරිකාවේ හා ඊශ්‍රායලයේ මූලිකත්වය මත සිදුවිය හැකියි. මෙහිදී නිරායුධ වීම සහ පාලනයෙන් ඉවත්වීම යන කරුණුවලට හමාස් සංවිධානය විරෝධය පළ කර තිබීමෙන් පෙනී යන්නේ ඔවුන් එම යෝජනාවලට අකමැති වීම.

කෙසේ වෙතත් ජනපති ට්‍රම්ප්ගේ යෝජනාවට ජගත් ආරක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම කරුණු කිහිපයක් නිසා වැදගත් වෙනවා. මේ යෝජනාවට අනුව නව බලකායක් මාර්ගයෙන් ගාසා තීරයේ කටයුතු සිදු වන අතර ඊට ජාත්‍යන්තර සහය ලබා ගැනීම අනිවාර්ය කරුණක්. එක්සත් ජාතීන්ගේ අනුමැතියකින් තොර ව එසේ බලකායක් පිහිටුවීමේ උත්සාහය නව අධිරාජ්‍යවාදී වැඩපිළිවෙළක් ලෙසට අර්ථකථනය විය හැකියි. මේ වන විට එවැනි අර්ථකථනයක් මතු නොවන්නේ යෝජනාවට ආරක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින්. ඒ අනුව නව සැලසුමට නීත්‍යානුකූල බවක් ලැබී තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වැනි පරිච්ඡේදයට අනුව අනුමැතියක් නොමැති ව වෙනත් භූමියක් පාලනය කිරීම සන්නද්ධ මෙහෙයුමක්. අන්තර්වාර පාලනයක් ඇති කිරීමට ද මේ යෝජනාව අනුමත වීමෙන් පහසුකම් ලැබී තිබෙනවා. එය මීට පෙර නැගෙනහිර ටිමෝරයේ සහ කොසෝවෝහි ක්‍රියාත්මක වුණා. පලස්තීන අධිකාරියේ සහය ද සැලැස්මට ලැබී තිබීම තවත් විශේෂත්වයක්. කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ VII වැනි පරිච්ඡේදයේ සඳහන් පරිදි අදාළ පාර්ශ්වවල කැමැත්ත නැති ව වුව ද මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට ආරක්ෂක මණ්ඩලයට හැකියාව පවතිනවා.

කලාප වෙන් කර බෙදා පාලනය කිරීමක් මේ වන විට දක්නට පුළුවන්. සටන් විරාමය ප්‍රකාශයට පත් කළ දිනයේ සිට දින 50කදී ඊශ්‍රායලය එල්ල කළ ප්‍රහාරවලින් පලස්තීන ජාතිකයන් 357 දෙනෙකු මියගොස් තිබෙනවා. එම දින 50හේදී ඊශ්‍රායලය 591 වතාවක් සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කර තිබෙනවා. සිවිල් වැසියන්ට අවස්ථා 164කදී ප්‍රහාර එල්ල කිරීම ද ඊට අයත්. කහ රේඛාව උල්ලංඝනය කරමින් ප්‍රදේශ 25ක වැටලීම් සිදු කර ඇති අතර ගාසා තීරයට බෝම්බ හා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම් 280ක් වාර්තා වෙනවා. මෙයින් පෙනී යන්නේ ඊශ්‍රායලය කිසිදු අවස්ථාවක පැකිළීමකින් තොර ව තමන්ට අවශ්‍ය පරිදි සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරන බව. ඒ අනුව මේ ගිවිසුම පූර්ණ එකඟතාවකින් තොර ව ඇමරිකාවේ සහ ඊශ්‍රාලයේ අවශ්‍යතාව මත පමණක් ක්‍රියාත්මක වන්නක් ලෙස පෙන්වා දිය හැකියි. අරාබි රටවල් 08ක සහය ලැබී තිබුණත් හමාස් සංවිධානය ද එහි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන්නේ නැහැ. ගාසා තීරයේ පාලනය භාර ගැනීමට සූදානම් බව පලස්තීන අධිකාරිය ප්‍රකාශ කර තිබුණත් ඊශ්‍රායලය හෝ ඇමරිකාව හෝ ඊට ප්‍රතිචාර දක්වා නැහැ. එසේ ම ස්වාධීන පලස්තීන රාජ්‍යයක් බිහි කිරීමට ඇමරිකාව මෙන් ම ඊශ්‍රායලය ද විරෝධය පළ කර තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 150කට වැඩි සංඛ්‍යාවක් පලස්තීන රාජ්‍යය දැනටමත් පිළිගෙන ඇති අතර බ්‍රිතාන්‍යය, ප්‍රංශය, කැනඩාව හා ඕස්ට්‍රේලියාව ද ඒ අතරට අයත්. එවැනි පසුබිමක පවා ක්‍රියාත්මක වන්නේ ඇමරිකාවේ සහ ඊශ්‍රායලයේ අවශ්‍යතා. අගමැති බෙන්ජමින් නෙතන්යාහු සඳහන් කළේ කිසි විටෙකත් පලස්තීන රාජ්‍යයක් පිළි නොගන්නා බව. ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ යෝජනා අනුව ගාසා තීරයේ රතු කලාපයක් නිර්මාණය කිරීමෙන් පලස්තීන සිවිල් වැසියන්ට යම් සීමාවක් දක්වා තිබෙනවා. මේ ආකෘතිය අලුත් දෙයක් නොවෙයි. 1950 ගණන්වලදී මලයාවේ නව ගම්මාන පිහිටුවීමට බ්‍රිතාන්‍යය ක්‍රියා කළා. ඇමරිකාව 1960 ගණන්වලදී වියට්නාමයේ එවැනි ගම්මාන නිර්මාණය කළ අතර සිම්බාබ්වේහි 1970 ගණන්වල එසේ ආරක්ෂිත ගම්මාන නිර්මාණය කර තිබෙනවා. සිවිල් ජනතාව තෝරාගත් ස්ථානවල කේන්ද්‍රගත කිරීමෙන් ගැටලුවලට විසඳුම් සෙවීම අපහසු වන්නට පුළුවන්. ආරක්ෂක මණ්ඩලය මේ සැලැස්ම අනුමත කිරීමෙන් ඊට පුළුල් පිළිගැනීමක් ලබා දී තිබෙනවා. එහෙත් ඊශ්‍රායලයේ මෙහෙයුම් හෝ සිවිල් වැසියන් ඝාතනය කිරීම හෝ නතර කර නැහැ. ඒ අනුව ගසා තීරයේ විසඳුම් ඒකපාර්ශ්වික බවකුයි පෙන්වන්නේ. ඊශ්‍රායලයට එල්ල වූ ජන සංහාරක චෝදනාවලට ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැහැ. කෙසේ වෙතත් සැබෑ අවශ්‍යතාවක් පවතීනම් මේ යෝජනාවලියෙන් ම 'පලස්තීන ස්වයං රාජ්‍යය' යන මාවත වෙත යොමු කළ හැකියි. සංක්‍රාන්ති පරිපාලනයෙන් ඊට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාගත හැකියි. එහෙත් ඊශ්‍රායලය ඊට කිසිසේත් එකඟ නොවනු ඇති අතර යුක්තිය ඉටු කිරීමකින් තොර ව සැබෑ සාමයක් අත්කරගත නොහැකි බව අමතක නොකළ යුතු කරුණක්.

කෙසේ වෙතත් සැබෑ සාමයක් පිළිබඳ ජනතාවගේ බලාපොරොත්තු තවමත් අවසන් වී නැහැ. යුද්ධය ආරම්භ වීමත් සමග බටහිර ඉවුරේ බෙත්ලෙහෙමේ නත්තල් සැමරුම අවලංගු කිරීමට සිදුවුණා. එහෙත් සටන් විරාමයත් සමඟ ශුද්ධ වූ නගරයේ ඓතිහාසික Nativity පල්ලිය ඉදිරිපිට සාම්ප්‍රදායික යෝධ නත්තල් ගස ආලෝකමත් කිරීමට පියවර ගෙන තිබෙන්නේ එම බලාපොරොත්තුවලට අලුත් ජීවයක් ලබා දෙමින්.

# දියුණුවේ රළ නගන කේරළය

ඩබ්ලිව් එම් ශාන්තප්‍රිය

අන්ත දරිද්‍රතාව තම ප්‍රාන්තයෙන් තුරන් කළ බව කේරළ මහ ඇමති පිනරායි විජයන් (**Pinarayi Vijayan)** 2025 නොවැම්බර් 01 දින ප්‍රකාශයට පත් කළා. ඒ, කේරළ ප්‍රාන්තය බිහිකොට වසර 70ක් සම්පූර්ණ වීමත් සමඟ. ඒ අනුව ඉන්දියාවේ ප්‍රාන්ත අතරින් පළමුවෙන් ම අන්ත දරිද්‍රතාව (Extreme poverty) තුරන් කළ ප්‍රාන්තය බවට පත්වුණේ කේරළය. අන්ත දරිද්‍රතාව තුරන් කිරීමේ ව්‍යාපෘතිය (Extreme Poverty Eradication Project-EPEP) වැනි ඉලක්කගත ව්‍යාපෘති ඔස්සේ හඳුනාගත් පවුල්වලට ආහාර, නිවාස, සෞඛ්‍ය, ජීවනෝපාය සහය ලබාදෙමින් අධ්‍යාපනය හා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඓතිහාසික ශක්තිය මත ගොඩනගමින් අන්ත දරිද්‍රතාව තුරන් කිරීමට කේරළ ප්‍රාන්තය සමත් වනවා.

කේරළයේ අන්ත දරිද්‍රතාව පිටුදැකීමේ සිව් අවුරුදු වැඩසටහන 2021 වසරේදී ආරම්භ වන්නේ අන්ත දරිද්‍රතාවෙන් පෙළෙණු පවුල් 64,000කට වඩා වැඩි සංඛ්‍යාවක් හඳුනා ගනිමින් සහ ආදායම පමණක් මිනුමක් ලෙස භාවිත නොකර නිවාස, ආහාර, සෞඛ්‍ය සේවා වැනි ක්ෂේත්‍ර කරා ප්‍රවේශ නොමැති අය අන්තර්ග්‍රහණය කර ගනිමින්.


පිනරායි විජයන්

කේරළ ප්‍රාන්තයේ සුරා බදු, පළාත් පාලන හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය එම්.බී. රාජේෂ් පවසන්නේ මෙතෙක් ක්‍රියාත්මක කළ කිසිදු සුභ සාධන යෝජනා ක්‍රමයකින් ස්පර්ශ නොවූ පවුල් මේ වැඩසටහනෙන් ඉලක්ක වූ බව.

ලෝක බැංකුවේ නිර්ණායක අනුව දිනකට ඩොලර් 2.15කට අඩු ආදායමකින් ජීවත්වීම අන්ත දරිද්‍රතාව ලෙස සලකනවා. වෙනත් ආකාරයකින් පවසන්නේනම් රජයේ සහයෝගය හා උපකාරයක් නොමැති ව පැවැත්ම අවදානමට ලක්වී ඇති පුද්ගලයන් අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන්නන්.

ලෝක බැංකුව ඇස්තමේන්තු අනුව ලොව මිලියන 830කට වැඩි පිරිසක් අන්ත දරිද්‍රතාවේ ජීවත්වනවා. 2025 වසරේ නවතම ගෝලීය කුසගින්න දර්ශකයට අනුව හඳුනාගත් රටවල් 123ක් අතරින් ඉන්දියාව ශ්‍රේණිගත කර ඇත්තේ 102 වැනි ස්ථානයේ. ඉන්දියාවේ වයස අවුරුදු 05ට අඩු ළමයින්ගෙන් 32.9%කට නිදන්ගත මන්දපෝෂණයේ ලක්ෂණ මතුවී ඇති බව පැවසෙනවා. අහිමිවීම හා දරිද්‍රතාව තවමත් ඉන්දියානු ජනතාව අතර මහා යථාර්ථයක් බව ටාටා සමාජ විද්‍යා ආයතනයේ සංවර්ධන අධ්‍යයන පාසලේ මහාචාර්ය ආර්. රාමකුමාර් පවසනවා.

කේරළ ප්‍රාන්තය බිහි කළ මුල් කාලයේ එය 60%ක් වැනි ඉහළ දරිද්‍රතා ප්‍රතිශතයක් පැවැති ප්‍රාන්තයක්. එවැනි ප්‍රාන්තයකුයි වසර 70ක් සපිරෙන කාලයේ මේ ජයග්‍රහණය අත්පත් කරගෙන තිබෙන්නේ. මිලියන සිය ගණනක් දෙනා දරිද්‍රතාවෙන් පෙළෙන ඉන්දියාවේ ප්‍රාන්ත 28න් අන්ත දරිද්‍රතාව ජයගත් එක ම ප්‍රාන්තය වී ඇත්තේ කේරළය.

කේරළය ඉන්දියාවේ මලබාර් වෙරළ තීරයේ පිහිටි ප්‍රාන්තයක්. 1956 නොවැම්බර් 01 දින රාජ්‍ය ප්‍රතිසංවිධාන පනත යටතේ කේරළ ප්‍රාන්තය පිහිටුවීමෙන් ඉන්දියාවේ මලයාලම් භාෂාව කතා කරන ප්‍රදේශ තනි ප්‍රදේශයක් බවට පත් වෙනවා. වර්ග කිලෝමීටර 38,863ක විශාලත්වයකින් යුතු කේරළ ප්‍රාන්තය උතුරින් හා ඊසාන දිගින් කර්ණාටක ප්‍රාන්තයත් නැගෙනහිරින් හා දකුණින් තමිල්නාඩුවත් බටහිරින් ලැකදිව් මුහුදෙනුත් මායිම් වනවා. 2025 වන විට මෙහි මිලියන 33.4ක ජනතාවක් ජීවත් වන අතර තිරුවානන්තපුරම් හෙවත් ත්‍රිවන්ද්‍රම් මේ ප්‍රාන්තයේ අගනුවර. ජනගහනයෙන් බහුතරයක් මලයාලි භාෂාව කතා කරන අතර 54%ක් හින්දු ආගම අදහනවා. ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම අදහන පිරිසක් ද සිටින කේරළයේ සංස්කෘතිය හැඩ ගැසී ඇත්තේ ආර්ය හා ද්‍රවිඩ සම්ප්‍රදායේ සම්මිශ්‍රණයක් ලෙස. සාක්ෂරතා අනුපාතය 92.2%ක් වන කේරළයේ අපේක්ෂිත ආයු කාලය අවුරුදු 77.3ක්.

පොල්, තේ, කෝපි, කජු හා කුළුබඩු වැනි භෝග වගාවලට අමතර ව කළු ගම්මිරිස් හා ස්වාභාවික රබර් නිෂ්පාදනය කේරළයේ ජාතික නිෂ්පාදිතයට විශාල දායකත්වයක් සපයනවා. ආර්ථිකය බොහෝ විට සේවා අංශයට නැඹුරු වන අතර ප්‍රාථමික අංශය සාපේක්ෂ ව නියෝජනය කරන්නේ කුඩා කොටසක්. පර්සියානු හා ගල්ෆ් කලාපීය රාජ්‍යවලට සංක්‍රමණය වී ඇති මලයාලි ජනතාව එවන විදේශ ප්‍රේෂණ ද කේරළ ආර්ථිකයට ලබා දෙන්නේ ඉමහත් රුකුලක්.

1970 ගණන් වන විටත් කේරළයේ පැවතියේ ඉහළ දරිද්‍රතාවක්. 1970 ගණන්වල ආරම්භ කළ ඉඩම් ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය දරිද්‍රතාව පිටු දැකීමේ හැරවුම් ලක්ෂ්‍යයක්. මහජන සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා විශාල ආයෝජනවලින් දරිද්‍රතාව අඩු කිරීමේ පදනමක් ලෙස මානව ප්‍රාග්ධනය නිර්මාණය වනවා. කේරළය ආර්ථික වර්ධනයට මෙන් ම සමාජ සංවර්ධනයට ද ප්‍රමුඛත්වය ලබා දුන් ප්‍රාන්තයක්.

රාජ්‍ය අංශයේ ඉමහත් කැපවීම, විමධ්‍යගත පාලනය, කුටුම්භ ශ්‍රී වැඩසටහන (කාන්තාවන් සවි බල ගැන්වීම) පහළ සිට ඉහළට සැලසුම්කරණය, විශ්‍රාම වැටුප් වැනි සමාජ ආරක්ෂණ දැල් යනාදිය කේරළයේ අන්ත දරිද්‍රතාව පිටුදැකීමෙහිලා ඉටු කළේ ඉමහත් කාර්යභාරයක්. මේ සමස්ත ක්‍රියාවලිය ඔස්සේ 1970 වසර වන විට ජනගහනයෙන් 60%කට වඩා ඉහළ අගයකින් පැවති දරිද්‍රතාව 1990 වසර වන විට 25% දක්වාත් 2011-2012 වසර වන විට 11.3% දක්වාත් පහළ වැටී තිබුණා. ඉන්දියාවේ අඩු ම බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI) 0.7ක් ලෙස කේරළයෙන් වාර්තා වන අතර මේ දර්ශකයෙන් සෞඛ්‍ය, අධ්‍යාපනය, ජීවන තත්ත්වය ආදියෙහි අවම අහිමි වීම් පෙන්නුම් කරනවා.

අන්ත දරිද්‍රතාව පිටු දැකීමෙන් කේරළය ලබා ඇත්තේ විශාල ජයග්‍රහණයක්. මේ ජයග්‍රහණය පිටුපස පවතින ඉතා ප්‍රබල සාධකය වන්නේ එහි මාක්ස්වාදී ඉන්දීය

කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් යුත් වාමාංශික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ (LDF) ලබාදෙන දේශපාලන නායකත්වය. වාමාංශික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ පිහිටු වන්නේ 1979 වසරේ. මාක්ස්වාදී ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය හා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය මෙහි ප්‍රධාන පක්ෂ දෙක වන අතර විප්ලවවාදී සමාජවාදී පක්ෂය ද තවත් ප්‍රජාතන්ත්‍රවාදී  පක්ෂ හා කණ්ඩායම් 05ක් ද මේ සන්ධානයට අයත්. කේරළයේ වාමාංශික ආණ්ඩුවක් පිහිටු වන්නේ 1957 වසරේදී. එම වසරේදී ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය ලොව ප්‍රථම ප්‍රජාතන්ත්‍රවාදී ව තෝරා පත් වූ කොමියුනිස්ට් ප්‍රාන්ත පාලනය ආරම්භ කරනවා. එදා සිට අද දක්වා ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂය හා ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය වසර 40කට ආසන්න කාලයක් වෙන් වෙන්වත් සන්ධාන ලෙසත් කේරළයේ බලය හොබවා තිබෙනවා.

දැනට කේරළයේ ක්‍රියාත්මක වන්නේ ප්‍රධාන සන්ධාන දෙකක්. මාක්ස්වාදී ඉන්දීය කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වය ලබා දෙන වාමාංශික වාම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ හා ඉන්දීය ජාතික කොංග්‍රසයේ නායකත්වයෙන් ක්‍රියාත්මක වන මධ්‍යමවාදී එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ මේ  ද්විත්වය. 2016 වසරේ සිට ම කේරළයේ පාලන බලය හොබවන්නේ වාමාංශික වාම ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ. ඔවුන් සමත් වන්නේ 2021 වසරේ පැවැති ප්‍රාන්ත මැතිවරණයෙන් ආසන 140න් 99ක් ම ජයගනිමින් 2016 වසරේ පැවති ආසන 91 ඉක්මවා තම බලය තහවුරු කර ගැනීමට.

ඉන්දීය ජාතික කොංග්‍රසය ප්‍රමුඛ සන්ධානය ද වසර 25කට ආසන්න කාලයක් කේරළය පාලනය කර තිබෙනවා. මීට අමතර ව සුළු කාලයක් ප්‍රාන්ත පාලන බලය හොබවා ඇත්තේ ප්‍රජා සමාජවාදී පක්ෂය, ඉන්දීය ජාතික මුස්ලිම් ලීගය වැනි පක්ෂ.

ඉන්දීය මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂ ප්‍රමුඛ සංවිධානයේ පවතින සමාජවාදී සැලසුම්කරණ ප්‍රතිපත්ති මේ ජයග්‍රහණවලට මූලික වනවා. විශේෂයෙන් සහභාගිත්ව සැලසුම්කරණය, විමධ්‍යගත පාලනය මෙහිදී ඉතා ම වැදගත්. අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් හඳුන්වා දී ඇති වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ ද සැලසුම්කරණ ප්‍රතිපත්ති මුල්කර ගනිමින්. 'පවුලේ සමෘද්ධිය' යන අර්ථය දෙන කුටුම්භ ශ්‍රී වැඩසටහන ද දරිද්‍රතාව පහත හෙළීමට විශාල දායකත්වයක් ලබා දී තිබෙනවා. මේ වැඩසටහන ලෝකයේ විශාලතම කාන්තා අන්‍යෝන්‍යාධාර ජාලය. සාමුහික ගොවිපොළ, ප්‍රජා මුළුතැන් ගෙවල්, සමුපකාර, ප්‍රජා සංවර්ධන මුලපිරුම් හා වෙනත් ආකාර ඒකාබද්ධ ව්‍යවසාය මේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරුණා. මේ වැඩපිළිවෙළ අවධාරණය කළේ තරගයට වඩා සහයෝගිතාව. පෞද්ගලික ව්‍යවසායකත්වයට වඩා සාමුහිකත්වය. එය වෙළෙඳ පොළ කේන්ද්‍රීය දිළිඳුකම පිටු දැකීමේ ක්‍රමෝපායවලට වෙනස් වූ ක්‍රමෝපායයක්.

ආර්ථික සංවර්ධනයට මෙන් ම සමාජ සංවර්ධනයට ද එක සේ අවධානයක් යොමු කළ ප්‍රාන්තයක් ලෙස සලකන කේරළය ඉන්දියාවේ අඩු ම දරිද්‍රතා ප්‍රතිශතය සටහන් වන ප්‍රාන්තය. ඉන්දියාවේ ඇතැම් ප්‍රාන්තවලට වඩා කේරළයේ ඒක පුද්ගල ආදායම අඩු වුවත් ඉහළ සමාජ දර්ශක හා වත්කම් ව්‍යාප්තිය කේරළයේ දරිද්‍රතාව අඩුවීමට හේතු වී තිබෙනවා.

කේරළයේ දිළිඳුකම පිටුදැකීමේ වැඩපිළිවෙළ ඉදිරියට ගමන් කළේ ධනේශ්වර පාලනයක් පවතින මධ්‍යම ආණ්ඩුවක අධිකාරී බලයක් යටතේ. ඒ නිසා එයට බොහෝ බාධක හා සීමාවලට යටත් වන්නට සිදු වුණා. ඉන්දීය මහ ආණ්ඩුව අනුගමනය කළ නව ලිබරල්වාදී ආර්ථික උපායමාර්ගය තුළ කේරළයේ වාමාංශික ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවට එහි සමාජ ආර්ථික වැඩපිළිවෙළ ආපසු හැරවීමට බලපෑම් කෙරුණ ද ඊට සම්පූර්ණයෙන් ඔවුන් යටත් වුණේ නැහැ. එහි මහජන සැලසුම් ව්‍යාපාරය යටතේ විමධ්‍යගත සැලසුම්කරණයක් ක්‍රියාවට නගමින් රාජ්‍ය වියදම්වලින් සියයට 40ක් පළාත් පාලන ආයතනවලට බෙදා හැර පළාත් පාලන ප්‍රදේශවල අවශ්‍යතා හඳුනා ගැනීමට, වැඩසටහන් සැලසුම් කිරීමට හා සංවර්ධන ව්‍යාපෘතිවලට අය වැය වෙන් කළා. පොදු න්‍යාය පත්‍රයක් වෙනුවට ප්‍රාදේශීය වශයෙන් සැලසුම් කළ දිළිඳුකම පිටු දැකීමේ විශේෂිත ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. ප්‍රජාතන්ත්‍රීය, සමාජ ප්‍රතිපත්තිමය සංස්කෘතියක් ස්ථාපිත කිරීමට, එකට බැඳුණු රාජ්‍ය ආයතන හා සමුපාකාර ජාලයක් පෝෂණය කිරීමට පියවර ගත්තා.

කේරළයේ වඩාත් ප්‍රසිද්ධ අන්වර්ථ නාමය 'දෙවියන්ගේ ම රට'. එය එහි විශ්මයජනක ස්වාභාවික සුන්දරත්වය ඉස්මතු කරනවා. එහෙත් එහි පොහොසත් කුළුබඩු වෙළෙඳාම නිසා එය 'ඉන්දියාවේ කුළුබඩු උද්‍යානය' ලෙස ද බහුල තල් ගස් නිසා 'පොල් දේශය' ලෙස ද ඓතිහාසික ව මලබාර් වෙරළ තීරය ලෙස ද හැඳින්වෙනවා. නැෂනල් ජියෝග්‍රැපික් ට්‍රැවලර් සංවිධානය විසින් ලෝකයේ පාරාදීස දහයෙන් එකක් ලෙස නම් කරනු ලැබ ඇත්තේ කේරළය.





# වයසේ තහනම

නිහාල් පීරිස්

සමාජ මාධ්‍ය නිසා බොහෝ යහපත් දේ ලැබී ඇති බව නොරහසක්. එහෙත් 'මේ මාධ්‍ය භාවිතයට වුවමනාවට වඩා ඇබ්බැහි වීම දරුවන්ගේ ජීවිතවලට අයහපත් බලපෑමක් එල්ල කරන්නේ ය' යන්න ද කාලයක සිට ම නැගෙන චෝදනාවක්. මේ ගැටලුව විසඳා ගන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් ද බොහෝ පාර්ශ්වවල අවධානය යොමු නොවුණා නොවෙයි. තත්ත්වය එසේ තිබියදී මෙයට අදාළ ව ඕස්ට්‍රේලියාව විසින් ගන්නා ලද ඓතිහාසික පියවරක් ගැන ලොව පුරා විශාල සංවාදයක් ඇති වී තිබෙනවා.

ඕස්ට්‍රේලියාව ගත් එම පියවර වන්නේ වයස අවුරුදු 16ට අඩු දරුවන්ට සමාජ මාධ්‍ය භාවිතය තහනම් කිරීම. ලෝකයේ මෙවැනි පියවරක් ගත් පළමු රට ලෙස ඕස්ට්‍රේලියාව ඉතිහාසයට එක් වෙනවා. 2025 දෙසැම්බර් 10 දින සිට ක්‍රියාත්මක මේ තහනම පැන වී ඇත්තේ ලොව ප්‍රධාන ම Facebook, TikTok, X, Snapchat, Instagram, You Tube, Reddit, Threads, Twitch, Kick යන සමාජ මාධ්‍ය වේදිකා දහයකට අදාළ ව.

මේ අනුව වයස අවුරුදු 16ට අඩු දරුවන් අදළ සමාජ මාධ්‍ය වේදිකාවල ගිණුම් පවත්වාගෙන යාම නතර කිරීමට ඒවා අයත් සමාගම් පියවර ගත යුතු වෙනවා. මේ නීතිය උල්ලංඝනය කරන සමාගම් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 49.5ක උපරිම දඩයකට යටත් කිරීමට හැකියාව තිබෙන අතර මෙය ශ්‍රී ලංකා රුපියල් බිලියන 10කට ආසන්න දඩයක්. මේ තහංචිය කඩ කිරීම සම්බන්ධයෙන් දරුවන්ට හෝ මව්පියන්ට හෝ දඬුවම් පැමිණවීමක් සිදු නොවන බව සඳහන්. නීතිය ආරක්ෂා කිරීමේ සම්පූර්ණ වගකීම පවරා ඇත්තේ සමාජ මාධ්‍ය සමාගම්වලට.

ඕස්ට්‍රේලියාව ක්‍රියාත්මක කළ මේ ඓතිහාසික තහනම එරට බොහෝ මව්පියන්ගේත් දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම සම්බන්ධයෙන් ක්‍රියා කරන පාර්ශ්වවලත් දැඩි ප්‍රසාදයට හේතු වී තිබෙනු දක්නට පුළුවන්.

එහෙත් ඊට විරෝධය දක්වන පාර්ශ්ව ද නැතුවා නොවෙයි. ඇතැම් තාක්ෂණික සමාගම් ද අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස වෙනුවෙන් පෙනී සිටින පාර්ශ්ව ද මෙයට දක්වන්නේ විශාල විරෝධයක්. මේ තහනම සාර්ථක වනු ඇත් ද? යන්න සම්බන්ධයෙන් බොහෝ රටවල් අවධානයෙන් පසුවන අතර ඉදිරියේදී එම රටවල් ද මෙයට සමාන නීති ගෙන ඒමට ඉඩ තිබෙනවා.

බලාපොරොත්තු වූ ආකාරයෙන් ම බොහෝ  දරුවන් ද මේ තහනමට විරුද්ධත්වය පළ කරන අතර ඔවුන් මෙය සලකන්නේ ඔවුන්ගේ මූලික අයිතිවාසිකමක් උදුරා ගැනීමක් ලෙස. එය එරට ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් බව ද ඇතැමුන් පෙන්වා දෙනවා. නෝවා ජෝන්ස් සහ මේසි නේලන්ඩ් නැමැති 15 හැවිරිදි දරුවන් දෙදෙනෙක් මේ තහනමට එරෙහි ව අධිකරණය හමුවට යාමට පවා ක්‍රියා කළ අතර මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින ඇතැම් සංවිධානවල සහය ද ඔවුන්ට ලැබී තිබුණා.

සමාජ මාධ්‍ය භාවිත කරන බොහෝදෙනා එහිදී මුණ ගැසෙන අන්‍යයන්ගේ ජීවිත සමඟ තමන්ගේ ජීවිත සංසන්දනය කිරීමට ද නිරායාසයෙන් ම පෙලඹෙන ආකාරය දක්නට පුළුවන්. මෙහිදී බොහෝදෙනා ගොදුරුවන උගුලක් වන්නේ සමාජ මාධ්‍ය ඔස්සේ හමුවන අන්‍යයන් තමන්ට වඩා සාර්ථක, ප්‍රීතිජනක, පරිපූර්ණ ජීවිත ගත කරන බවට හැඟීමක් ඇති කර ගැනීම. අන්‍යයන්ගේ දක්ෂතා, හැඩරුව වැනි දේ පවා මේ ආකාරයෙන් තමන් සමඟ සසඳා බැලීමට මෙවැනි අය පෙලඹෙනවා. මෙහි අවසන් ප්‍රතිඵලය විය හැක්කේ තමන් පිළිබඳ කලකිරීමක්.




ඕස්ට්‍රේලියාව මෙවැනි තහනමක් පැනවීමට පියවර ගෙන ඇත්තේ සමාජ මාධ්‍ය නිසා දරුවන්ගේ චර්යාවලට, ඔවුන්ගේ මානසික සෞඛ්‍යයට විශාල බලපෑමක් එල්ල වන බවට අදහස් ඉදිරිපත් වන පසුබිමක. දරුවන් වැඩි කාලයක් මේ වේදිකාවල රඳවා ගනිමින් ඔවුන් ඒවාට ඇබ්බැහි කර ගැනීම සඳහා එම වේදිකා විවිධ තාක්ෂණික උපාය භාවිත කරන බවට ද එල්ල වන්නේ චෝදනා. මේ නිසා දරුවන්ගේ අධ්‍යාපනයට, සෘජු සමාජ සබඳතා ආදියට සිදුවන සෘණාත්මක බලපෑම් ගැන ද විශේෂඥයන් නිරන්තරයෙන් පෙන්වා දෙනවා.

සමාජ මාධ්‍ය ඔස්සේ කෙරෙන උසුළු විසුළු, නින්දා අපහාස, බොරු චෝදනා, බොරු ප්‍රචාර ආදිය ද මේ කාලයේ ඉමහත් ව්‍යසනයක්. මෙය ඉංග්‍රිසි බසින් හැඳින්වෙන්නේ Cyberbullying යනුවෙන්. දරුවන් යනු මෙවැනි හානිකර ක්‍රියාවලට නිතර ගොදුරු වන පිරිසක්.

සමාජ මාධ්‍ය භාවිත කරන බොහෝදෙනා එහිදී මුණ ගැසෙන අන්‍යයන්ගේ ජීවිත සමඟ තමන්ගේ ජීවිත  සංසන්දනය කිරීමට ද නිරායාසයෙන් ම පෙලඹෙන ආකාරය දක්නට පුළුවන්. මෙහිදී බොහෝදෙනා ගොදුරුවන උගුලක් වන්නේ සමාජ මාධ්‍ය ඔස්සේ හමුවන අන්‍යයන් තමන්ට වඩා සාර්ථක, ප්‍රීතිජනක, පරිපූර්ණ ජීවිත ගත කරන බවට හැඟීමක් ඇති කර ගැනීම. අන්‍යයන්ගේ දක්ෂතා, හැඩරුව වැනි දේ පවා මේ ආකාරයෙන් තමන් සමඟ සසඳා බැලීමට මෙවැනි අය පෙලඹෙනවා. මෙහි අවසන් ප්‍රතිඵලය විය හැක්කේ තමන් පිළිබඳ කලකිරීමක්, අවතක්සේරුවක් ඇති කර ගැනීම. මේ හේතුවෙන් විශාදය (depression), කාංසාව (anxiety) වැනි මානසික ආබාධවලට ගොදුරු වීමේ අවදානමක් ද ඇති බව කිව යුතු නැහැ. මනෝ වෛද්‍යවරු වැනි පාර්ශ්ව නිතර පෙන්වා දෙන්නේ දරුවන් පවා මෙවැනි ඛේදජනක තත්ත්වයකට පත්වීමට ඉඩකඩ ඇති බව.

සමාජ මාධ්‍ය ඔස්සේ අවුත් දරුවන් ගොදුරු කරගන්නා ලිංගික කප්පම්කරුවන් වැනි අපරාධකරුවන් ගැන ද මේ කාලයේ නිතර අසන්නට ලැබෙනවා. දරුවන් උපායෙන් රවටා ඔවුන්ගේ නිරුවත් ඡායාරූප ආදිය ගෙන්වාගෙන, ඒවා ප්‍රසිද්ධ කරන බවට ඔවුන් බිය වද්දා, කප්පම් ලබා ගන්නා මෙවැනි කණ්ඩායම්වල ගොදුරු බවට පත් වූ දරුවන් සිය දිවි නසා ගත් අවස්ථා ගැන ද පසුගිය කාලයේ වාර්තා වුණා.

සමාජ මාධ්‍යවලින් ඇති කරන බලපෑම පිළිබඳ සොයා බැලීම අරමුණු කරගත් සමීක්ෂණයක් ද මේ තහනම පැනවීමට පෙර  ඕස්ට්‍රේලියානු රජය පවත්වා තිබෙනවා. එහිදී හෙළිදරව් වී තිබූ එක් කාරණයක් වූයේ වයස අවුරුදු 10-15 අතර වයස් කාණ්ඩයේ දරුවන් අතරින් 96%ක් ම සමාජ මාධ්‍ය භාවිත කරන බව. ඒ අතරින් 70%ක් පමණ හානිදායක අන්තර්ගතවලට නිතර ම නිරාවරණය වන බවත් මෙහිදී හෙළිදරව් වී තිබෙනවා.

සිය දිවි හානි කර ගැනීම වැනි දේට උල්පන්දම් දෙන ආකාරයේ අන්තර්ගත ගැන ද සමීක්ෂණයේදී හෙළි වූ බැව් සඳහන්. කාන්තාවන් හෝ ගැහැනු ළමයින් හෝ පිළිබඳ  අගතිගාමී ආකල්ප වපුරන අන්තර්ගතවලට, ආහාර රටාවට අයහපත් ආකාරයෙන් බලපාන අන්තර්ගතවලට, ප්‍රචණ්ඩත්වය ප්‍රවර්ධනය කරන වීඩියෝ වැනි දේට දරුවන් බහුල වශයෙන් නිරාවරණය වන බවත් එම සමීක්ෂණයෙන් අනාවරණය වී තිබෙනවා.

ඕස්ට්‍රේලියාව පැන වූ තහනම ක්‍රියාත්මක කිරීමේදී මතුවන ප්‍රධාන අභියෝගයක් වනු ඇතැයි සඳහන් වූයේ ගිණුම් හිමියන්ගේ වයස් සොයා ගැනීමේ ගැටලුව. මෙහිදී හැඳුනුම් පත්වල තොරතුරු, වීඩියෝ, සෙල්ෆි ආදිය ඇසුරෙන් වයස තහවුරු කර ගැනීම පිළිබඳ ව ඇතැම් සමාජ මාධ්‍ය සමාගම් අවධානය යොමු කර තිබුණා.




# කොළඹින් කතා කර සියවසකට පසු

කපිල එම්. ගමගේ

විද්‍යුත් මාධ්‍ය ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් මෙරට ගුවන්විදුලිය 2025 දෙසැම්බර් 16 දින (1925-2025) සිය සියවස් පූර්ණය සමරනවා. එහි සියවසක අත්දැකීම්, හැලහැප්පීම්, බාධක, අභියෝග, ජයග්‍රහණ මැද්දේ පැමිණි ගමන්මග ආවර්ජනය කරමින් සියවසෙන් ඔබ්බට ගුවන්විදුලියේ ඉදිරි දිශානතිය පිළිබඳවයි මෙවර දෙසතිය කවරයේ කතාබහෙන් විමසුමට ලක් කරන්නේ.

ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි විකාශනයේ ඉතිහාසය 1920 ගණන්වල මුල්භාගය දක්වා දිව යනවා. බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේදී, ගුවන්විදුලි තාක්ෂණය තවමත් ලෝකයට අලුත් වූ විට විකාශනය සඳහා පළමු පියවර ආරම්භ වූයේ 1923 වසරේදී පමණ. ඒ, ලංකා ටෙලිග්‍රාෆ් දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවන් රැහැන් රහිත හඬ සම්ප්‍රේෂණ අත්හදා බැලීම් ආරම්භ කළ අවස්ථාවේදී. මේ අත්හදා බැලීම් ප්‍රාථමික උපකරණ භාවිතයෙන් සිදු කරන ලද අතර ඒවා කිසි විටෙකත් මහජන විනෝදාස්වාදය සඳහා අදහස් කළේ නැහැ. ඒවා ප්‍රධාන වශයෙන් දිවයිනේ ගුවන්විදුලි සන්නිවේදනයේ විභවය ගවේෂණය කිරීම සඳහා වූ තාක්ෂණික පරීක්ෂණ වුණා.

1925 දෙසැම්බර් මාසයේදී හැකි වුණා මේ පරීක්ෂණ සැලකිය යුතු සන්ධිස්ථානයක් කරා ගෙන එන්නට. ටෙලිග්‍රාෆ් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පළමු නිල විකාශනය ආරම්භ කළේ එම අවස්ථාවේදී. පසුව 'කොළඹ රේඩියෝ' ලෙස හැඳින්වෙන මේ ස්ථානය ක්‍රියාත්මක වූයේ කැපී පෙනෙන උපකරණයක් භාවිත කරමින්. එහෙත් එය අද විවාදපන්න කාරණයක්. ඉතිහාසයේ සඳහන් වන්නේ පළමු වැනි ලෝක යුද්ධයේදී අල්ලා ගන්නා ලද ජර්මානු සබ්මැරීනයක සම්ප්‍රේෂකයක් සිවිල් භාවිතය සඳහා අනුවර්තනය කරන ලද බව. මේ සම්ප්‍රේෂකය කොළඹ ස්ථාපනය කරන ලද අතර පළමු වැනි සැබෑ ගුවන්විදුලි වැඩසටහන් විකාශනය කිරීමට ඉඩ ලබා දුන්නා. මේ මුල් විකාශන සරල සහ පර්යේෂණාත්මක වූ අතර ග්‍රැමෆෝන් සංගීතය, කාල සංඥා සහ ඉඳහිට කථන නිවේදනවලින් සමන්විත වුණා. ඒවායේ මධ්‍යස්ථ ස්වභාවය තිබියදීත් මේ සම්ප්‍රේෂණවලින් තොරතුරු සන්නිවේදන සහ විනෝදාස්වාද මාධ්‍යයක් ලෙස ගුවන්විදුලියේ ඇති හැකියාව පෙන්නුම් කළා.

එකල ගුවන්විදුලි ග්‍රාහක යන්ත්‍ර හිමිකරුවන් සිටියේ ස්වල්ප දෙනෙකු පමණක් වුවත් රැහැන් රහිත ව සම්ප්‍රේෂණය වන සංගීතය සහ කටහඬ ඇසීමේ නව්‍යතාව විප්ලවීය බව ශ්‍රාවකයන් සොයා ගත්තා. මේ මුල් අවධිය ශ්‍රී ලංකාවේ විධිමත් ගුවන්විදුලි විකාශන සේවාවක් සංවර්ධනය කිරීම සඳහා අඩිතාලම දැම්මා. මේ අත්හදාබැලීම්වල සාර්ථකත්වය යටත්විජිත පරිපාලනයට ගුවන්විදුලියේ වටිනාකම ඒත්තු ගැන්වූ අතර අවසානයේ ආසියාවේ පැරණිතම ගුවන්විදුලි සේවාව වන 'රේඩියෝ සිලෝන්' බවට පරිණාමය වූ සම්පූර්ණයෙන් ම ව්‍යුහගත විකාශන මධ්‍යස්ථානයක් පිහිටුවීමට එය හේතු වුණා.



පැරණි ගොඩනැගිල්ල

# 1925-2025




## රේඩියෝ සිලෝන් පිහිටුවීම (1925-1949)

1925 වසරේ මුල් ම අත්හදාබැලීමේ විකාශනවල සාර්ථකත්වයෙන් පසුව ලංකා ටෙලිග්‍රාෆ් දෙපාර්තමේන්තුව ක්‍රමයෙන් වඩාත් ව්‍යුහගත විකාශන සේවාවක් සංවර්ධනය කළා. එය මුලින් හැඳින්වුණේ 'කොළඹ රේඩියෝ' ලෙස. සීමිත උපකරණ සහ සම්පත් සහිත ව මේ මධ්‍යස්ථානය සෙමින් වර්ධනය වුවත් එය සංගීතය, ප්‍රවෘත්ති සහ තොරතුරු වැඩසටහන් සපයන කුඩා මහජන විකාශකයකු ලෙස අඛණ්ඩ ව ක්‍රියාත්මක වන්නට පටන් ගත්තා. මෙහි නිල ආරම්භය ඉතිහාසයේ සටහන් වන්නේ 1925 දෙසැම්බර් 16 දින ලෙස. 1920 ගණන්වල අගභාගයේ සහ 1930 ගණන්වල කොළඹ ගුවන්විදුලිය එහි කාලසටහන පුළුල් කර තාක්ෂණික ධාරිතාව වැඩිදියුණු කළ අතර එම කාලයේ ආසියාවේ ඇති එක ම ගුවන්විදුලි සේවාවක් බවට එය පත්වුණා. විකාශන තවමත් සාපේක්ෂ ව මධ්‍යස්ථ වුවත් විශේෂයෙන් ඉංග්‍රීසි කතා කරන පදිංචිකරුවන් සහ රජයේ නිලධාරින් අතර වර්ධනය වන ප්‍රේක්ෂක පිරිසක් ගුවන්විදුලිය ආකර්ෂණය කර ගත්තා.

දෙවැනි ලෝක යුද්ධයේදී කොළඹ ගුවන්විදුලිය සැලකිය යුතු වෙනස්කම්වලට භාජනය වුණා. ලංකාව බ්‍රිතාන්‍යයන් සඳහා වැදගත් හමුදා කඳවුරක් බවට පත්වීමත් සමඟ යුදකාලීන සන්නිවේදනය සහ චිත්ත ධෛර්යය ගොඩනැගීමේ වැඩසටහන් සඳහා සහාය වීමට ගුවන්විදුලි මධ්‍යස්ථානයේ පාලනය මිත්‍ර හමුදා විසින් භාර ගනු ලැබුවා. මේ කාලයේ වඩා හොඳ සම්ප්‍රේෂක සහ වැඩිදියුණු කළ විකාශන පහසුකම් සමඟ මධ්‍යස්ථානය වැඩිදියුණු කෙරුණා. යුදකාලීන අවශ්‍යතාවලින් මෙහෙයවනු ලැබුවත් මේ වැඩිදියුණු කිරීම් මධ්‍යස්ථානයේ හැකියා බෙහෙවින් ශක්තිමත් කළ අතර පශ්චාත් යුද විකාශන යුගය සඳහා එය සූදානම් කෙරුණා. 1945 වසරින් පසු පාලනය නැවත ලංකා සිවිල් පරිපාලනය වෙත ලැබුණු අතර ඒ ඔස්සේ මේ නවීකරණය කරන ලද පහසුකම් සහිත වීම ගුවන්විදුලියේ ආකර්ෂණය වැඩි කර ගැනීමට හේතු වන බව තේරුම් ගැනුණා.

1940 ගණන්වල අගභාගය වන විට කොළඹ ගුවන්විදුලිය දකුණු ආසියාවේ පිළිගත් හා බලගතු විකාශකයකු බවට පරිණාමය වී තිබුණා. 1949 ඔක්තෝබර් 01 දින මධ්‍යස්ථානය නිල වශයෙන් ප්‍රතිසංවිධානය කර 'රේඩියෝ සිලෝන්' ලෙස නම් කරන ලද විට එය ලංකාවේ ගුවන්විදුලි සන්නිවේදනයේ ඉදිරි පියවරක් බවට පත්වුණා. මෙය රටේ වෘත්තීය විකාශනයේ නව යුගයක ආරම්භය සනිටුහන් කිරීම වැදගත්. මේ පරිවර්තනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් විකාශනය කරන වැඩසටහන්, පුහුණු දේශීය නිවේදකයන්, ව්‍යුහගත ප්‍රවෘත්ති ප්‍රකාශන සහ සංගීත අංශ හඳුන්වා දීමට හේතු වුණා. නව අනන්‍යතාව පර්යේෂණාත්මක සහ යුදකාලීන විකාශනයෙන් සම්පූර්ණයෙන් ම සංවර්ධනය වූ ජාතික සේවාවක් කරා මාරුවීමක් ද සංකේතවත් වුණා. රේඩියෝ සිලෝන් ඉක්මනින් ලංකාවේ සහ කලාපය පුරා ජනප්‍රියත්වයට පත් වූ අතර ආසියාවේ වඩාත් ම ප්‍රසිද්ධ ගුවන්විදුලි මධ්‍යස්ථානයක් බවට පත්වීම ද එහිදී සැලකිය යුතු කරුණක්.

## රේඩියෝ සිලෝනයේ ස්වර්ණමය යුගය (1950 - 1970)

1950 දශකයේ මුල්භාගයේ සිට 1970 දශකයේ අගභාගය දක්වා රේඩියෝ සිලෝනයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙනවා. එම කාලයේ ලංකා ගුවන්විදුලි නාලිකාව දකුණු ආසියාවේ වඩාත් ම බලගතු සහ ආදරණීය විකාශකයා ලෙස ප්‍රමුඛස්ථානයට පත්වුණා. 1949 වසරේදී එහි ප්‍රතිසංවිධානයෙන් පසු නවීන විකාශන ශිල්පීය ක්‍රම අනුගමනය කිරීමෙන්, ව්‍යුහගත වැඩසටහන් හඳුන්වා දීමෙන් සහ ගුවන් තරංගවලට ශක්තිය, වෘත්තීයභාවය ගෙන ආ දක්ෂ ලාංකික නිවේදකයන් සඳහා ආයෝජනය කිරීමෙන් ලාංකික ගුවන්විදුලිය ඉක්මනින් වේගවත් හා ජනප්‍රිය ගමනක් ඇරඹුවා. මේ කාලයේ කලාපය පුරා ප්‍රමුඛතම ඉලෙක්ට්‍රොනික විනෝදාස්වාද ආකාරය වුණේ ගුවන්විදුලිය. රේඩියෝ සිලෝන්හි බලවත් කෙටි තරංග සම්ප්‍රේෂක ඔස්සේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්තානය, නේපාලය සහ අග්නිදිග ආසියාවේ සහ මැදපෙරදිග ඇතැම් ප්‍රදේශවල පවා එහි වැඩසටහන් පැහැදිලි ව ඇසීමට ඉඩ සැලසුණා.

රේඩියෝ සිලෝන්හි අසාමාන්‍ය ජනප්‍රියතාවට හේතු වූ එක් ප්‍රධාන හේතුවක් වූයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ හින්දී භාෂාවෙන් ඉදිරිපත් කරන ලද එහි විවිධ වැඩසටහන් අන්තර්ගත. ඉන්දියාවේ මිලියන ගණනක ශ්‍රාවකයන් ආකර්ෂණය කරගත් හින්දී සේවය සඳහා මේ නාලිකාව විශේෂයෙන් ප්‍රසිද්ධියට පත් වුණා. සමස්ත ඉන්දීය ගුවන්විදුලිය බොලිවුඩ් චිත්‍රපට සංගීතය විකාශනය කිරීම සීමා කළ කාලයක දකුණු ආසියානු ප්‍රේක්ෂකයන් ආශා කළ සජීවී, සංගීතයෙන් පොහොසත් වැඩසටහන් විකාශනය කිරීමෙන් රේඩියෝ සිලෝන් එම හිඩැස පුරවා තිබුණා. සුප්‍රසිද්ධ අමීන් සයානි විසින් ඉදිරිපත් කරන ලද බිනාකා ගීත්මාලා වැනි සංගීත වැඩසටහන් සංස්කෘතික සංසිද්ධි බවට පත් වූ අතර දේශසීමා ඔස්සේ රසික පදනමක් නිර්මාණය කර ගැනීමට එයට හැකි වුණා. එහිදී ලාංකික ගුවන්විදුලියට ස්ථාපිතවීමට හැකි වුණා කලාපයේ 'ගුවන් තරංගවල රජු' ලෙස. මේ සාර්ථකත්වය ඉන්දියා-ලංකා සංස්කෘතික සබඳතා ද ශක්තිමත් කළා මෙන් ම වාණිජ අනුග්‍රාහකත්වය ඔස්සේ නාලිකාවේ වෙළෙඳ දැන්වීම් ආදායම වැඩි කරගැනීමට ද හැකි වුණා.

මේ ස්වර්ණමය යුගයේ විශිෂ්ට ශ්‍රී ලාංකික නිවේදක පරම්පරාවක් ද බිහි කළා. ඔවුන්ගේ හඬ ක්ෂණික ව හඳුනාගන්නට ශ්‍රාවකයන් සමත් වුණා. ලිවී විජේමාන්න, පර්ල් ඔන්ඩාට්ජේ, නිහාල් භාරතී, වර්නන් කොරයා සහ කේ. එස්. බාලචන්ද්‍රන් වැනි පෞරුෂ එම ගුවන්විදුලි නාලිකාවේ කීර්තිය වැඩිදියුණු කර, ඔප දැමූ සහ ආකර්ෂණීය ශෛලියක් ගෙන ආවා. ඔවුන්ගේ උණුසුම් ඉදිරිපත් කිරීම, නිවැරදි උච්චාරණය සහ සජීවී ඉදිරිපත් කිරීම් විසින් දකුණු ආසියාවේ ගුවන්විදුලි වෘත්තීයභාවය සඳහා සකස් දෙන ලද්දේ නව ප්‍රමිති. දේශීය කලා, නාට්‍ය, සම්භාව්‍ය සංගීතය සහ මහජන සේවා පණිවිඩ ප්‍රවර්ධනය කිරීමේදී ලංකා ගුවන්විදුලිය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අතර එය ශ්‍රී ලාංකිකයන් සඳහා එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට ද පත්වුණා.


1970 දශකය වන විට ලංකා ගුවන්විදුලියට ලොව වඩාත් ම ගෞරවනීය හා සාර්ථක ගුවන්විදුලි මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත වීමට හැකියාව ලැබුණා. 1972 වසරේදී රටේ දේශපාලන වෙනස්කම් සහ ජාතික ආයතන ප්‍රතිසංවිධානය අවසානයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (SLBC) බවටයි එය පරිවර්තනය කෙරුණේ. මේ මාරුව ලංකා ගුවන්විදුලියේ සංකේතාත්මක අනන්‍යතාවේ අවසානය සනිටුහන් කළත් එහි ස්වර්ණමය යුගයේ උරුමය ශ්‍රී ලංකාවේ විකාශන සම්ප්‍රදායට බලපෑම් කරමින් සිටින අතර දකුණු ආසියාව පුරා මිලියන ගණනක් එය සිහිපත් කරන්නේ ආදරයෙන්.

## ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව පිහිටුවීම (1972-වර්තමානය)

1972 වසරේදී රේඩියෝ සිලෝන්, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (SLBC) බවට පරිවර්තනය වීම රටේ විකාශන ඉතිහාසයේ ප්‍රධාන හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කළා. ලංකා ඩොමීනියන් රාජ්‍යයෙන් අප රට ශ්‍රී ලංකා ජනරජයට මාරුවීමෙන් පසුවයි මේ වෙනස සිදු වුණේ. 1972 ජනවාරි 05 දින අගමැතිනි සිරිමාවෝ බණ්ඩාරනායකගේ රජය ජාතික මහජන විකාශකයා ලෙස සේවය කිරීමේ වරමක් සහිත ව රාජ්‍යය සතු සංස්ථාවක් ලෙස මේ නාලිකාව නිල වශයෙන් ප්‍රතිසංස්කරණය කළා. මේ නැවත සන්නාමකරණය හුදෙක් නමේ වෙනසක් පමණක් නොවී එය ජාතික අනන්‍යතාව ශක්තිමත් කිරීම, දේශීය සංස්කෘතිය ප්‍රවර්ධනය සහ දිවයින පුරා මහජන සේවා විකාශනය පුළුල් කිරීම සඳහා පරිවර්තනය වුණා.

ඉන් අනතුරු ව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව උත්සාහ දැරුවේ සැලකිය යුතු නවීකරණ කිරීමට. එහිදී ප්‍රාදේශීය සේවා විකාශන පිහිටුවීම, කෙටි තරංග


එවක අගමැති ඩඩ්ලි සේනානායක මහතා ගේ ප්‍රධානත්වයෙන් සංස්ථාව පිහිටුවීම


සංරක්ෂිත ගබඩාව තුළ


පැරණි ගුවන්විදුලි මැදිරියක් තුළ


ගුවන්විදුලි තැටි ගබඩාව


පාසල් සිසුන්ට දැනුම බෙද දෙමින්

> ජාතික විකාශකයා ලෙස ශ්‍රී ලංකා ගුවන්විදුලිය තම භූමිකාව ශක්තිමත් කිරීමත් සමඟ 1970, 1980 සහ ඉන් ඔබ්බට සැලකිය යුතු ලෙස සේවා පුළුල් කිරීමේ කාල පරිච්ඡේදයකට අවතීර්ණ වීම දක්නට පුළුවන්. විවිධ භාෂාමය, සංස්කෘතික සහ කලාපීය ප්‍රජාව වෙත ළඟා වීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කැපවූ ප්‍රවෘත්ති, සංගීතය, අධ්‍යාපනික වැඩසටහන් සහ සංස්කෘතික අන්තර්ගත සහිත බහු නාලිකා දියත් කිරීමෙන් එහි වැඩසටහන් පුළුල් කළා.

සහ මධ්‍යම තරංග සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම මෙන් ම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් නව සේවා නිර්මාණය කිරීමෙන් එහි ආවරණය පුළුල් කළා. අධ්‍යාපනික හා සංස්කෘතික වැඩසටහන් කෙරෙහි විශේෂ අවධානය යොමු වූ අතර පාසල් විකාශන, කෘෂිකාර්මික උපදේශන වැඩසටහන්, ආගමික අන්තර්ගත, සෞඛ්‍ය අධ්‍යාපනය සහ දේශීය විනෝදාස්වාදය සඳහා වන වැඩසටහන් අන්තර්ගතයෙන් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව පෝෂණය වුණා. සිය සංගීත හා නාට්‍ය නිෂ්පාදන විවිධාංගීකරණය කරමින්, දේශීය කුසලතා පෝෂණය කරමින් සහ රේඩියෝ සිලෝන් යුගයේ ආරම්භ වූ උසස් තත්ත්වයේ ගුවන්විදුලි සංගීත වැඩසටහන්වල උරුමය අඛණ්ඩ ව පවත්වාගෙන යාමටත් එහිදී ක්‍රියා කළා. 1970 දශකය අගභාගයේ සහ 1980 දශකය මුල්භාගයේදී රූපවාහිනිය මතුවීමට පටන් ගත්තත් විශේෂයෙන් ගුවන්විදුලියට ප්‍රවේශ විය හැකි ග්‍රාමීය ප්‍රදේශවල ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ප්‍රවෘත්ති සහ තොරතුරු සඳහා අත්‍යවශ්‍ය මූලාශ්‍රයක් ලෙස තවදුරටත් පැවතුණා.

1990 දශකයේ සිට පෞද්ගලික එෆ්එම් මධ්‍යස්ථාන හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකාවේ මාධ්‍ය භූ දර්ශනය නාටකාකාර ලෙසයි වෙනස් වුණේ. එය දැඩි තරගකාරිත්වයක් ඇති කළා. වාණිජ විකාශකයන් නවීන ආකෘති සමග තරුණ ප්‍රේක්ෂකයන් අල්ලා ගත් විට පවා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව රටේ නිල රාජ්‍ය විකාශකයා ලෙස එහි භූමිකාව පවත්වාගෙන ගියා. තමන්ගේ ම එෆ්එම් සේවා දියත් කිරීම, සම්ප්‍රේෂණ තාක්ෂණය වැඩිදියුණු කිරීම සහ පසුව මාර්ගගත ප්‍රවාහය සහ ඩිජිටල් අන්තර්ගත හඳුන්වා දීමෙන් එය ක්‍රමයෙන් අනුවර්තනය වීම දක්නට පුළුවන්. අද වන විට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව බහු ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සේවා ක්‍රියාත්මක කරන අතර එය ආසියාවේ පැරණිතම ගුවන්විදුලි විකාශන ආයතනයක් පමණක් නොව ශ්‍රී ලංකාවේ විකාශන උරුමයේ ජීවමාන සංකේතයක් බවට ද පත් වී තිබෙනවා. වෙනස් වන මාධ්‍ය ප්‍රවණතා තිබියදීත් එය ශ්‍රී ලංකික සංස්කෘතියට ගැඹුරින් සම්බන්ධ වී තිබීම විශේෂිත කරුණක්. මහජන තොරතුරු, අධ්‍යාපනය සහ ජාතික සන්නිවේදනය සඳහා අත්‍යවශ්‍ය හඬක් ලෙස අඛණ්ඩ ව සේවය කරන ශ්‍රී ලංකා ගුවන්විදුලිය වාණිජ අර්බුදයකට ද දැඩි ලෙස ගොදුරු වෙමින් පවතින බවත් සඳහන් කළ යුතු කරුණක්.

## සේවා පුළුල් කිරීම

ජාතික විකාශකයා ලෙස ශ්‍රී ලංකා ගුවන්විදුලිය තම භූමිකාව ශක්තිමත් කිරීමත් සමඟ 1970, 1980 සහ ඉන් ඔබ්බට සැලකිය යුතු ලෙස සේවා පුළුල් කිරීමේ කාල පරිච්ඡේදයකට අවතීර්ණ වීම දක්නට පුළුවන්. විවිධ භාෂාමය, සංස්කෘතික සහ කලාපීය ප්‍රජාව වෙත ළඟා වීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලිය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් කැපවූ ප්‍රවෘත්ති, සංගීතය, අධ්‍යාපනික වැඩසටහන් සහ සංස්කෘතික අන්තර්ගත සහිත බහු නාලිකා දියත් කිරීමෙන් එහි වැඩසටහන් පුළුල් කළා. මේ ව්‍යාප්තිය ඉඩ සැලසුවේ ශ්‍රී ලංකා ගුවන්විදුලියට රාජ්‍ය සේවා ආයතනයක් ලෙස තම වගකීම ආරක්ෂා කරමින් නිශ්චිත ප්‍රේක්ෂක කණ්ඩායම් සඳහා සේවය කිරීමට. වඩාත් වැදගත් වර්ධනයක් වූයේ අනුරාධපුරය, මාතර, මහනුවර, යාපනය, කුරුණෑගල වැනි පළාත්වලට දේශීය වශයෙන් අදාළ අන්තර්ගත සපයන ප්‍රාදේශීය විකාශන මධ්‍යස්ථාන පිහිටුවමින් එවැනි සන්නිවේදන හිඩැස් පවා පියවා ප්‍රාදේශීය අනන්‍යතා ද ශක්තිමත් කිරීම. ග්‍රාහක සහභාගිත්වය ශක්තිමත් කරමින් ප්‍රජා ගුවන්විදුලි විකාශන ද ආරම්භ කළත් ආර්ථික අර්බුදවලට මුහුණදීමට නොහැකි ව ඒවායේ පැවැත්ම ක්‍රමක්ෂය වන්නට පටන් ගත්තා.

එහි ජාතික සහ ප්‍රාදේශීය ජාලවලට අමතර ව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව කෙටි තරංග සහ බාහිර සේවා ඔස්සේ එහි ගෝලීය පැවැත්ම පුළුල් කිරීමටයි පියවර ගත්තේ. එයින් ශ්‍රී ලාංකික විදේශිකයන් සහ ජාත්‍යන්තර ශ්‍රාවකයන් ඇතුළු විදේශවල සිටින ප්‍රේක්ෂකයන්ට ශ්‍රී ලංකා ප්‍රවෘත්ති සහ සංස්කෘතික වැඩසටහන් විකාශනය කෙරුණා. වෙළෙඳ සේවය, සිටි එෆ්එම්, විශේෂිත සේවා වෙනස් වන ශ්‍රාවක මනාපයට අනුවර්තනය වීමට සහ එහි අන්තර්ගත පිරිනැමීම් විවිධාංගීකරණයට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව උත්සාහ දැරුවා. අධ්‍යාපනික සේවය ද සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර පාසල් වැඩසටහන්, කෘෂිකාර්මික උපදේශන සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය සහ මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර සංස්ථාවේ මෙහෙවරෙහි අත්‍යවශ්‍ය අංග බවටයි පත්වුණේ. විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවලට වඩාත් ප්‍රවේශ විය හැකි සන්නිවේදන මාධ්‍යය වූ ගුවන්විදුලිය ජනප්‍රිය වීමට පටන් ගත්තා.

තාක්ෂණයේ දියුණුව සහ වෙනස්වන මාධ්‍ය ප්‍රවණතා සමඟ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව එහි සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට, සංඥා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට පියවර ගෙන තිබෙනවා. කෙසේ වෙතත් පැහැදිලි ශබ්දයක් ලබා දුන් සහ තරුණ ප්‍රේක්ෂකයන් ආකර්ෂණය කර ගත් FM විකාශනය අඛණ්ඩ ව පරිණාමය වුවත් පෞද්ගලික ව්‍යවසායකයන් සතු ගුවන්විදුලි නාලිකාවලට අවසර ලැබීමත් සමඟ සිදු වූයේ රජය සතු ව පැවති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව අර්බුදකාරී යුගයකට අවතීර්ණ වීම. මේ වන විට සංඛ්‍යාත භාවිතයෙන් විකාශනය කෙරෙන රජය සහ පෞද්ගලික ව්‍යවසායකයන් සතු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ක්‍රියාත්මක වන ගුවන්විදුලි නාලිකා 50කට ආසන්න සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සන්නිවේදන කර්මාන්තය සතුයි.

## නූතන ගුවන්විදුලියේ නව අභියෝග

ඩිජිටල් තාක්ෂණය, වෙනස්වන ප්‍රේක්ෂක හැසිරීම් සහ දැඩි තරගකාරිත්වයකින් හැඩගස්වන ලද වේගයෙන් පරිණාමය වන මාධ්‍ය භූ දර්ශනයකට ගුවන්විදුලි සන්නිවේදකයන් නූතනයේ මුහුණදෙමින්


සිටිනවා. වඩාත් ම ප්‍රබලම අභියෝගයක් වන්නේ ප්‍රවාහ සේවා, පොඩ්කාස්ට් සහ සමාජ මාධ්‍ය වේදිකා වැනි ඩිජිටල් සහ ඉල්ලුම මත සකසාගත හැකි මාධ්‍ය වෙත මාරුවීම. සංගීතය සහ විනෝදාස්වාදය සඳහා වරක් ගුවන්විදුලිය මත විශ්වාසය තැබූ තරුණ ප්‍රේක්ෂකයන් වර්තමානයේ YouTube, Spotify සහ TikTok වැනි මාර්ගගත වේදිකා වෙතයි යොමු ව සිටින්නේ. එහිදී අන්තර්ගතය පුද්ගලීකරණය කර එය දෘශ්‍යමය වශයෙන් සම්බන්ධ කර ගත හැකි සහ ක්ෂණික ව ලබා ගත හැකි තත්ත්වයට පත් ව තිබෙනවා. මේ මාරුව සාම්ප්‍රදායික ගුවන්විදුලි ශ්‍රාවකත්වය අඩු කර තිබෙනවා මෙන් ම විකාශකයන්ට බල කෙරෙන්නේ ඔවුන්ගේ වැඩසටහන් උපායමාර්ග නැවත සිතා බැලීමට. තවත් ප්‍රධාන අභියෝගයක් වන්නේ ප්‍රේක්ෂක ඉලක්ක කිරීම වඩාත් නිරවද්‍ය සහ මැනිය හැකි ඩිජිටල් අලෙවිකරණය සඳහා සමාගම් වැඩි වැඩියෙන් ආයෝජනය කරන බැවින් වෙළෙඳ දැන්වීම් ආදායම් පහත වැටීම. ගුවන්විදුලි මධ්‍යස්ථාන, විශේෂයෙන් පොදු සහ ප්‍රාදේශීය විකාශකයන් උසස් තත්ත්වයේ අන්තර්ගත පවත්වා ගැනීමට සහ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් අරමුදල් ලබා ගැනීමට බොහෝ විට අසමත් වී ඇති අතර එම ආර්ථික අරගලය තියුණු වී තිබෙනවා.

නවීන ගුවන්විදුලිය, ඩිජිටල් ගුවන්විදුලිය සහ මාර්ගගත ප්‍රවාහ සේවා වැනි උසස් විකාශන පද්ධති වෙත මාරුවීමේ අවශ්‍යතාව ඇතුළු තාක්ෂණික අභියෝග ද පවතිනවා. බොහෝ දිගුකාලීන ගුවන්විදුලි ආයතන පැරණි උපකරණ, සීමිත අය වැය සහ පුහුණු තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟය සමඟයි ක්‍රියාත්මක වන්නේ. එවිට නවීකරණය අතිශය දුෂ්කර කාර්යයක්. ගුවන්විදුලිය බහුලීකරණය වූ තොරතුරු පරිසරයක තරඟ කළ යුතු අතර එහිදී සමාජ මාධ්‍යවල ප්‍රවෘත්ති වේගයෙන් පැතිරීම, වැරදි තොරතුරු පහසුවෙන් සත්‍යාපිත වීම නිසා නිවැරදි තොරතුරු වාර්තාකරණය එයින් යටපත් වී තිබෙනවා. විශ්වසනීයත්වය, නිරවද්‍යතාව සහ අදාළත්වය පවත්වා ගැනීම වෙන කවරදාටත් වඩා සියවස සපුරන ලාංකික ගුවන්විදුලිය මුහුණදෙන අභියෝගයක්. අන්තර්ගත කුඩා කොටස්වලට බණ්ඩනය කිරීමට ගුවන්විදුලි මධ්‍යස්ථාන මුහුණ දිය යුතුයි. මන්ද ශ්‍රාවකයන් සාම්ප්‍රදායික පුළුල් වැඩසටහන්වලට වඩා ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන සුවිශේෂ කෙටි වැඩසටහන් අපේක්ෂා කරනවා. මේ පරිසරයේ නොනැසී පැවතීමටනම් නවීන ගුවන්විදුලි ජාල අන්තර්ක්‍රියාකාරී අන්තර්ගත ඒකාබද්ධ කිරීම, ඔවුන්ගේ මාර්ගගත පැවැත්ම ශක්තිමත් කිරීම, ඩිජිටල් වේදිකා සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම, ගුවන්විදුලිය සැමවිට ම බලවත් මාධ්‍යයක් බවට පත් කර ඇති විශ්වාසය සහ හුරුපුරුදුකම පවත්වා ගනිමින් නව තාක්ෂණය වැළඳ ගැනීමෙන් නවෝත්පාදනය කළ යුතු තැනට ඊළඟ සියවසේදී පැමිණීම කළ යුතු වෙනවා.


## ශ්‍රී ලංකා ගුවන්විදුලියේ අනාගතය

මෙරට ගුවන්විදුලියේ අනාගතය හැඩගැසී ඇත්තේ සම්ප්‍රදාය සහ තාක්ෂණික නවෝත්පාදන මිශ්‍රණයකින්. මාධ්‍යය එහි දිගුකාලීන සංස්කෘතික වටිනාකම ආරක්ෂා කරමින් වෙනස් වන ප්‍රේක්ෂක අවශ්‍යතාවලට අනුවර්තනය විය යුතුයි. ඩිජිටල් මාධ්‍ය සහ මාර්ගගත ප්‍රවාහය විසින් තොරතුරු සහ විනෝදාස්වාදය පරිභෝජනය කරන ආකාරය පරිවර්තනය කර ඇතත් ගුවන්විදුලියට අඛණ්ඩ ව අද්විතීය ස්ථානයක් හිමි කර ගත හැකි වන්නේ විශේෂයෙන් ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ප්‍රේක්ෂකයන් අතර ඉක්මන් හා විශ්වාසදායක සන්නිවේදනය අත්‍යවශ්‍ය වන හදිසි අවස්ථාවලදී. ඉදිරිය දෙස බලන විට ශ්‍රී ලාංකික ගුවන්විදුලි මධ්‍යස්ථාන ඩිජිටල් පරිවර්තනය කෙරෙහි අවධානය යොමු කරනු ඇති. මාර්ගගත වේදිකා, ජංගම යෙදුම්, සමාජ මාධ්‍ය සහ ස්මාර්ට් උපාංග මත ඔවුන්ගේ පැවැත්ම පුළුල් කරනු ඇති. බොහෝ මධ්‍යස්ථාන දැනටමත් සජීවී ප්‍රවාහය, පොඩ්කාස්ට් සහ ඉල්ලුම මත වැඩසටහන් පිරිනැමීම ආරම්භ කර ඇති අතර ඒවායේ අන්තර්ගතය සාම්ප්‍රදායික FM ග්‍රාහකයන් මත තවදුරටත් යැපෙන්නේ නැති තරුණ, තාක්ෂණික දැනුමැති ශ්‍රාවකයන් වෙත ළඟා වන බව සහතික කරනවා.

ඒ සමඟ ම ශ්‍රී ලංකා ගුවන්විදුලියේ අනාගතය අන්තර්ගත නවෝත්පාදන වැළඳ ගැනීම මතයි රඳා පවතින්නේ.



එදා කෙටි තරංග විකාශන සඳහා භාවිතා කළ ට්‍රාන්ස් මීටරය



ප්‍රවීණ සන්නිවේදකයන් වූ එච්. එම්. ගුණසේකර, පාලිත පෙරේරා ඇතුළු පිරිස වැඩසටහන් සම්පාදනයේ නියැළෙමින්

එදා ගුවන්විදුලි වාද්‍ය ශිල්පීන් කණ්ඩායමක්



තරගකාරී මාධ්‍ය පරිසරයක ස්වකීය අදාළ බව සහතික කර ගැනීමට ගුවන්විදුලි මධ්‍යස්ථාන වඩාත් අන්තර්ක්‍රියාකාරී වැඩසටහන්, ද්විභාෂා සංදර්ශන, ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන අන්තර්ගත සහ තරුණයන් කේන්ද්‍රකරගත් කොටස් යන අංශ සංවර්ධනය කළ යුතුයි. ඩිජිටල් නිර්මාණකරුවන් සමඟ හවුල්කාරිත්වය, ප්‍රේක්ෂක ප්‍රතිපෝෂණ ඒකාබද්ධ කිරීම සහ දෘශ්‍ය හෝ මාර්ගගත හෝ සම්බන්ධතාව සමඟ ශ්‍රව්‍ය මිශ්‍ර කරන දෙමුහුන් ගුවන්විදුලි ආකෘති අත්‍යවශ්‍ය වනු ඇති. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වැනි මහජන සේවා විකාශකයන්ට සංස්කෘතික සංරක්ෂණය සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා නව කාර්යභාරයක් ඉටු කළ හැකි අතර පෞද්ගලික නාලිකා කථන ගුවන්විදුලි, ජීවන සංදර්ශන සහ විශේෂිත සංගීත ප්‍රවාහ වැනි සුවිශේෂ ප්‍රභේද ගවේෂණය අඛණ්ඩ ව කරගෙන යා යුතු වනවා. ඩිජිටල් ගුවන්විදුලි තාක්ෂණයෙහි විභව, අනාගත ආයෝජන ඇතුළු ව ශ්‍රී ලංකාව එහි විකාශන යටිතල පහසුකම් නවීකරණය කරන විට මාධ්‍යය අතුරුදහන් වීමට වඩා පරිණාමය වීමටයි නියමිත. ශ්‍රී ලංකාවේ ගුවන්විදුලිය එහි ඓතිහාසික ශක්ති ඩිජිටල් යුගයේ නවෝත්පාදන සමඟ ඒකාබද්ධ කිරීමෙන් සමෘද්ධිමත්, අනුවර්තනය කළ හැකි සහ ප්‍රවේශ විය හැකි සන්නිවේදන ආකාරයක් ලෙස පවත්වාගෙන යාම එළඹෙන සියවසේ අනිවාර්ය අභියෝගයක්.

ලෝකය ඩිජිටල් යුගයේ ගැඹුරට ගමන් කරන විට අනාගත පරම්පරාව සඳහා අදාළ සහ ඵලදායී ලෙස පැවතීමට ගුවන්විදුලිය සැලකිය යුතු පරිවර්තනයකට භාජනය විය යුතුයි. සාම්ප්‍රදායික විකාශනය තවදුරටත් ප්‍රමාණවත් නොවනු ඇති නිසා ඉල්ලුම මත ඩිජිටල් අන්තර්ගතය සමඟ සජීවී විකාශනය මිශ්‍ර කරන දෙමුහුන් ආකෘතියක්

මෙරට ගුවන්විදුලියේ අනාගතය හැඩගැසී ඇත්තේ සම්ප්‍රදාය සහ තාක්ෂණික නවෝත්පාදන මිශ්‍රණයකින්. මාධ්‍යය එහි දිගුකාලීන සංස්කෘතික වටිනාකම ආරක්ෂා කරමින් වෙනස් වන ප්‍රේක්ෂක අවශ්‍යතාවලට අනුවර්තනය විය යුතුයි. ඩිජිටල් මාධ්‍ය සහ මාර්ගගත ප්‍රවාහය විසින් තොරතුරු සහ විනෝදාස්වාදය පරිභෝජනය කරන ආකාරය පරිවර්තනය කර ඇතත් ගුවන්විදුලියට අඛණ්ඩ ව අද්විතීය ස්ථානයක් හිමි කර ගත හැකි වන්නේ විශේෂයෙන් ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ප්‍රේක්ෂකයන් අතර ඉක්මන් හා විශ්වාසදායක සන්නිවේදනය අත්‍යවශ්‍ය වන හදිසි අවස්ථාවලදී.

ගුවන්විදුලිය වැලඳ ගත යුතු වෙනවා. මධ්‍යස්ථාන උසස් තත්ත්වයේ පොඩ්කාස්ට්, ජංගම-හිතකාමී ප්‍රවාහය සහ නවීන සංගීත යෙදුම්වලට සමාන පුද්ගලාරෝපිත අන්තර්ගත ඇල්ගොරිතම ලබා දිය යුතුයි. මේ මාරුව නිසා ප්‍රේක්ෂකයන්ට ඔවුන්ගේ පහසුව සඳහා සවන් දීමට ඉඩ සලසන අතර ම තත්‍යකාලීන ප්‍රවෘත්ති, හදිසි අනතුරු ඇඟවීම් සහ ප්‍රජා යාවත්කාලීන කිරීම් ලබා දීමට රේඩියෝවට ඇති හැකියාවෙන් ප්‍රතිලාභ ලබාගත යුතුයි. ස්මාර්ට් ස්පීකර්, පැලඳිය හැකි උපාංග සහ සම්බන්ධිත වාහනවලට රේඩියෝව ඒකාබද්ධ කිරීම එය වඩාත් ප්‍රවේශ විය හැකි සහ තරුණ, තාක්ෂණයට නැඹුරු ශ්‍රාවකයන්ගේ ජීවන රටාව සමඟ පෙළගස්වනු ඇති.

නූතන ප්‍රේක්ෂකයන්ගේ වෙනස්වන අපේක්ෂා පිළිබිඹු කිරීම සඳහා අන්තර්ගතය ද පරිණාමය විය යුතුයි. රේඩියෝවේ ඊළඟ සියවස අන්තර්ක්‍රියාකාරිත්වයට ප්‍රමුඛත්වය දිය යුතු අතර ශ්‍රාවකයන්ට සමාජ මාධ්‍ය, හඬ පණිවිඩ, සජීවී ඡන්ද විමසීම් සහ ඒකාබද්ධ ඩිජිටල් කතාබස් වේදිකා ඔස්සේ සහභාගිවීමට ඉඩ සලසා දිය යුතු වනවා. ජාත්‍යන්තර වේදිකාවල පහසුවෙන් සොයාගත නොහැකි තරුණ සංස්කෘතිය, තාක්ෂණය, ගෝලීය ප්‍රවණතා සහ දේශීය ප්‍රජා කථා කෙරෙහි අවධානය යොමු කරමින් වැඩසටහන්කරණය විවිධාංගිකරණය විය යුතුයි. ශ්‍රව්‍යයට වඩා වැඩි යමක් අපේක්ෂා කරන බහු-වේදිකා ප්‍රේක්ෂකයන් සම්බන්ධ කර ගැනීම සඳහා ගුවන්විදුලිය වීඩියෝ ක්ලිප්, තොරතුරු ග්‍රැෆික්ස් සහ ඩිජිටල් කතන්දර කීම වැනි ශක්තිමත් දෘශ්‍ය සහකරුවන් වර්ධනය කරගත යුතුයි. දත්ත විශ්ලේෂණ අනුගමනය කිරීමෙන් ගුවන්විදුලි මධ්‍යස්ථානවලට ශ්‍රාවක මනාප වඩා හොඳින් තේරුම් ගත හැකි අතර වඩා දක්ෂ, ඉලක්කගත වැඩසටහන් නිර්මාණය කළ හැකියි.

ගුවන්විදුලි කර්මාන්තය අන්තර්ගතයේ පමණක් නොව අරමුණෙහි ද නවෝත්පාදනය වැලඳ ගැනීම අනිවාර්ය වනවා. වැරදි තොරතුරු සහිත ලෝකයක විශ්වාසදායක සහ සත්‍යාපිත මහජන සන්නිවේදන පද්ධතියක් ලෙස ගුවන්විදුලියට සේවය කළ හැකි අතර විශ්වාසදායක මාධ්‍ය කලාව සහ කරුණු පරීක්ෂා කළ වාර්තාකරණය සිදුකරගත යුතුයි. සාම්ප්‍රදායික ඩිජිටල් ජාල අසාර්ථක විය හැකි ස්වාභාවික විපත්, දේශගුණික අර්බුද සහ හදිසි අවස්ථාවලදී එය බලවත් මෙවලමක් ලෙස ක්‍රියා කළ හැකි ආකාරය හා ඒ විභවතාව අමතක නොකළ යුතුයි. ඊළඟ සියවස සඳහා සූදානම් වීමට ගුවන්විදුලිය ශක්තිමත් තාක්ෂණික යටිතල පහසුකම්, පුනර්ජනනීය බලශක්ති බලයෙන් ක්‍රියාත්මක වන සම්ප්‍රේෂක සහ ඩිජිටල් උපස්ථ පද්ධති සඳහා ආයෝජනය කළ යුතුයි. එහි ඓතිහාසික ශක්තිය විශ්වසනීයත්වය, ප්‍රවේශ්‍යතාව සහ මානව සම්බන්ධතාව, අතිනවීන තාක්ෂණය සහ නිර්මාණාත්මක අදහස් සමඟ ඒකාබද්ධ කිරීමෙන් ගුවන්විදුලියට ලෝකයේ වඩාත් ම කල් පවතින සහ අනුවර්තනය කළ හැකි මාධ්‍ය ආකාරයක් ලෙස අඛණ්ඩ ව දියුණු විය හැකි බව සඳහන් කළ යුතු කරුණක්.



# ශ්‍රවණ පර්යේෂණ




**එම්. සරත් කුමාර පෙරේරා**
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ මාධ්‍යවේදී
බාහිර කථිකාචාර්ය
පුස්තකාල විද්‍යා හා තොරතුරු විද්‍යා
අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය


සන්නිවේදන ක්‍රියාදාමයේදී ශ්‍රවණ පර්යේෂණ අංශය (Audience Research Unit) සිදු කරන්නේ සුවිශේෂ බලපෑමක්. ශ්‍රාවක සමාජයේ ප්‍රතිචාර සොයා බැලීම, නව වැඩසටහන් ආකෘති ජනතාවට හඳුන්වා දීම, ප්‍රචාර ප්‍රවර්ධක මෙහෙය වීම හා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම, නව ප්‍රවණතා සෝදිසි කිරීම, වැඩසටහන් සංවර්ධනය හා ප්‍රතිසංවිධානය ශ්‍රවණ පර්යේෂණ අංශයෙන් සිදු කෙරෙන කාර්ය අතරට අයත්. ගුවන්විදුලි බලධාරින්, ඉහළ කළමනාකාරිත්වය ඉදිරි තීරණ ගැනීමේදී හා ප්‍රතිපත්ති සකස් කිරීමේදී ශ්‍රවණ පර්යේෂණ අංශයේ මග පෙන්වීම විශේෂ අවධානයට ලක් කරනවා.

ලෝක යුද්ධ පැවති සමයේදී මෙරට මුල්වරට 'වයර්ලස්' විකාශන කටයුතු ආරම්භ කිරීම සඳහා හඬ පර්යේෂණ අත්හදා බැලීම් සිදු කර ඇති බව (1921දී) සඳහන්. ප්‍රථම සිංහල නිවේදකයා ලෙස ඩී. එම් කොළඹගේ 'කොළඹින් කතා කරමි' (Colombo Calling) ලෙස ප්‍රථම වරට ගුවන්විදුලි හඬ රටට සන්නිවේදන කළ අවස්ථාවේ ග්‍රැමෆෝන් තැටි වාදනය කරමින් මයික්‍රෝෆෝනයක් ඉදිරියේ තබා කතා, ගීත ප්‍රචාරය වීම මුල් වරට ඇරඹූ බව සඳහන්.

1925 දෙසැම්බර් 16 දින නිල වශයෙන් ලංකාවේ ගුවන්විදුලි විකාශනය ආරම්භ වන අතර 'ගුවන් විදුලි හඬ' සන්නිවේදනයේ ශ්‍රවණ පර්යේෂණ (Audience Research) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබීම විශේෂත්වයක්. 1931 වසරේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන පසුබිම යටතේ ප්‍රධාන ඉංජිනේරුවරයා ලෙස කටයුතු කළ එඩ්වඩ් හාපර් පළමු වරට ශ්‍රවණ පර්යේෂණ අංශයක් විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ පිහිටුවා තිබෙනවා. ශ්‍රාවක සමාජ පිහිටුවමින්, ගුවන්විදුලි තාක්ෂණික උපකරණ එක් කර ගනිමින් අසන්නාට ගුවන්විදුලි ක්‍රියාකාරිත්වය පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමේ වැඩපිළිවෙළක් හා ප්‍රදර්ශනයක් කොළඹදී පවත්වා තිබෙන්නේ ඇල් මැක්රේගේ උනන්දුවත් සමඟ.

1948 වන විට විධිමත් ලෙස ගොඩනැගුණු ශ්‍රවණ පර්යේෂණ අංශයක් මෙරට ක්‍රියාත්මක වී නැහැ. එවැනි පසුබිමක අසන්නන්ගේ අදහස් දැන ගැනීමට ලංකා ගුවන්විදුලි සේවය උනන්දුවක් දක්වා ඇති බව ඩී. එම්. කොළඹගේ 'ගුවන්විදුලි වංශය' කෘතියේ සඳහන්. ඒ සඳහා පළමු පියවර ලෙස ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් අසන්නන් අතරට ඉදිරිපත්කොට පිළිතුරු ලබා ගැනීමට ගුවන්විදුලි බලධාරීන්ගේ අවධානය යොමු වී තිබෙනවා. ඒ අනුව ශ්‍රාවක අසන්නන් අතරට පළමු වරට ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රශ්නාවලියක් එක් කරන ලද අතර එහිදී සිංහල/දෙමළ භාෂා යටතේ අසන්නන්ගේ ප්‍රතිචාර සොයා බැලීමටත් පියවර ගෙන තිබෙනවා. ප්‍රශ්නාවලියට පිළිතුරු සඳහන්කොට තැපැල් කන්තෝරුවට ලබාදෙන ලෙසත් එසේ නොමැතිනම් තම ප්‍රදේශවල තැපැල් පෙට්ටියට යොමු කරන ලෙසත් ශ්‍රවණ ප්‍රතිචාර ප්‍රශ්නාවලියේ උපදෙස් ලබා දී තිබෙනවා.

ප්‍රාථමික මුහුණුවරකින් මුල් කාලයේ ක්‍රියාත්මක වූ ශ්‍රවණ පර්යේෂණ කාර්ය පසුකාලයේදී නව වෙනසකට ලක්කොට ඇති අයුරු දක්නට පුළුවන්. 50 දශකය ආරම්භයත් සමඟ ගුවන්විදුලි විකාශන ගමන්මගේ නව පුනරුදයක් බිහි වුණා. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදී ගුවන්විදුලි සම්ප්‍රදාය ආධිපත්‍යයෙන් මිදී ස්වදේශීය ගුවන්විදුලි සන්නිවේදනයකට පදනම එක් කරමින් 1950 වර්ෂයේදී පළමු වරට ගුවන්විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් වන්නේ කීර්තිමත් සිවිල් පරිපාලකයෙකු වූ එම්. ජේ. පෙරේරා. ඔහු දේශීය ගුවන්විදුලි සම්ප්‍රදායක ආරම්භය සකසමින් පළමු වරට ශ්‍රවණ පර්යේෂණ අංශයක් ගුවන්විදුලියේ බිහි කිරීමට පියවර ගත්තා. ශ්‍රාවක ප්‍රතිචාර සොයා බලමින් විධිමත් පදනමක් මත ශ්‍රවණ පර්යේෂණ අංශයක කාර්ය ඇරඹීමට 1956 ජූනි 02 දින පළමු වැනි පර්යේෂණ නිලධාරියා ලෙස පත් වූයේ බීබීසී බ්‍රිතාන්‍ය ගුවන්විදුලියේ පුහුණුව ලැබූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වූ ජී. ඩබ්. එස්. පෙරේරා.

1953 වසරේ ගුවන්විදුලි කටයුතු පිළිබඳ සොයා බැලීමට රාජ්‍ය නීතිඥ එන්. ඊ. වීරසූරියගේ සහභාගිත්වයෙන් පත් කළ කොමිසම ශ්‍රවණ පර්යේෂණ නිලධාරියාට ඉදිරියේදී පැවරෙන ප්‍රධාන වගකීම් දෙකක් ගැන පෙන්වා දී තිබෙනවා. ඒ, ශ්‍රාවක ප්‍රතිචාර සමඟ වැඩසටහන්වලට කීදෙනෙක් සවන් දෙනවා ද? නැද්ද? යන්න සහ ජනප්‍රිය වැඩසටහන් කවරේ ද? යන්න සොයා බැලීම යනුවෙන්. ඒ අනුව පර්යේෂණ නිලධාරි ජී. ඩබ්. එස්. පෙරේරා කුඩා කාර්ය මණ්ඩලයක් සමඟ සීමිත පහසුකම් ඇති ව පර්යේෂණ කටයුතු සැලසුම් කළා.

ගුවන්විදුලි ඉතිහාස ගමන්මගේ සංගීත පර්යේෂණ අංශයේ දායකත්වය පිළිබඳ ව අවධානය යොමු කිරීමත් මෙහිදී වැදගත්. 1953 වසරේදී ගුවන්විදුලි කටයුතු සොයා බැලීමට පත් කළ රාජනීතිඥ එන්. ඊ. වීරසූරිය කොමිසම හා හුළුගල්ල කොමිසම ජනතා ප්‍රතිචාර සමග තම වාර්තාවේ සඳහන් කර තිබෙනවා "දේශීය සංගීතයක් ගොඩනැගීමේදී ඒ සඳහා ගුවන්විදුලිය දායක විය යුතු බවත් දේශීය ජන ගී කෙරෙහි සැලකිලිමත් විය යුතු බවත්". ඒ අනුව ගුවන්විදුලි සංගීතය දියුණු කිරීම සඳහා පත් කළ විශේෂ සංවර්ධන කමිටුවක නිර්දේශ මත 1970 ගුවන්විදුලි පර්යේෂණ අංශයක් පළමු වරට පිහිටුවනවා. එම ජාතික කාර්යභාරය සඳහා මග පෙන්වීම හා උපදේශකත්වය සී. ද එස්. කුලතිලක ලබා දුන් අතර මකුලොළුව ගුවන්විදුලි පර්යේෂණ අංශයට එක්වීම මූලාශ්‍ර පර්යේෂණාගාරයක් ලෙස හඳුන්වා තිබෙනවා.

සී. ද එස්. කුලතිලකගේ තොරතුරු හා උපදෙස් මත ශ්‍රී ලංකා ගුවන්විදුලිය පර්යේෂණ මූලාශ්‍ර වාර්තා කිහිපයක් මුද්‍රණයකොට ප්‍රකාශයට පත් කර තිබෙනවා. සංගීත පර්යේෂණ වාර්තාව, ජන සංගීත සිද්ධාන්ත, දහ අට වන්නම තොරතුරු වාර්තා සමඟ හෙළ ජන ගී, ශ්‍රී ලංකා ජන සංගීතය නමින් පර්යේෂණ ගී තැටි කිහිපයක් ඒ අතරට අයත්.

ඒ. ඊ. වීරසූරිය වර්තාව සඳහන් කරන ආකාරයට 1952 ජූලි 01 සිට 07 දින දක්වා වූ කාල සීමාවේ ශ්‍රාවක ප්‍රතිචාර ලබා ගැනීමේ සතියක් ගුවන්විදුලි බලධාරින් ක්‍රියාත්මකකොට තිබෙනවා. ගුවන්විදුලි පර්යේෂණ අංශයක් නිසි ලෙස ක්‍රියාත්මක නොවූ පසුබිමක වරින් වර අසන්නන් වෙනුවෙන් ප්‍රශ්න මාලා යැවීමේ ක්‍රමයක් සකස් කරමින්, ශ්‍රාවක කැමැත්ත අකමැත්ත සොයා බැලීමට ජනතා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගය හා දායකත්වය ලබාගෙන ඇති බව එහි සඳහන්. කොළඹ හා පිට පළාත්වල ශ්‍රාවක සමීක්ෂණයක් පැවැත්වීමට පළමුවරට අවස්ථාව උදා කරගෙන ඇති අතර ශ්‍රාවක ප්‍රතිචාර ගුවන්විදුලි බලධාරින්ට යොමු කිරීමෙන් ඒ අනුව වැඩසටහන් සැලසුම් සකස් කර ඇති බවත් එම වාර්තාවේ සඳහන් වෙනවා. 1957 සැප්තැම්බර් මස 30 සිට ඔක්තෝබර් 06 දින දක්වා වූ සතියේ දහවල් 2.00 සිට රාත්‍රී 11.00 දක්වා ප්‍රචාරය වූ සිංහල වැඩසටහන් කෙරෙහි අසන්නන්ගේ ප්‍රතිචාරය දැනගැනීම සඳහා ප්‍රශ්න මාලාවක් යොමු කර ඇති අතර ඒ කෙරෙහි අසන්නන්ගේ ප්‍රතිචාරය දිරිගැන්වෙනසුලු වූ බවයි පැවසෙන්නේ.

සිලෝන් රේඩියෝව, ලංකා ගුවන්විදුලි සංස්ථාව බවට 1967 ජනවාරි 05 දින නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ එහි ප්‍රථම සභාපති/අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස වැඩ භාරගත් පරිපාලන නිලධාරියෙකු වූ නෙවිල් ජයවීර ගුවන්විදුලියේ ප්‍රතිසංස්කරණ ආරම්භ කරමින් නව සම්ප්‍රදායක් බිහි කිරීමට සමත් වුණා. එහිදී ශ්‍රවණ පර්යේෂණ අංශය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම කාර්යභාරය මැනවින් ඉටු කරගෙන යාමට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් තම උපදේශකත්වය ලබා දීමට ඔහු පියවර ගත්තා.

1977 ටී. බී. ඒකනායක ගුවන්විදුලි කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර ඇත්තේ "පර්යේෂණ නිලධාරියා සෘජු ව ම අධ්‍යක්ෂ ජනරාල්වරයා යටතේ සේවය කළ යුතු බවත් තනතුරුභාවය 'ශ්‍රවණ පර්යේෂණ' ලෙස සඳහන් කළ යුතු බවත්" යනුවෙන්. එයින් ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ නිලධාරියාට පළමු වරට වෘත්තිමය පිළිගැනීමක් ලැබී තිබෙනවා.

1973 වසරේ ගුවන්විදුලි හා ප්‍රවෘත්ති ලේකම්, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, පරිපාලන නිලධාරි, රිජ්වේ තිලකරත්න සභාපති/අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත් වීම ගුවන්විදුලිය දේශීයකරණය වීම, දේශීය පුනරුදයක ඇරඹුම වුණා. ශ්‍රාවක ප්‍රතිචාර පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ ඔහු ගුවන්විදුලියේ ගුණාත්මක ප්‍රමිතිකරණය උසස් මට්ටමකට ගෙන ඒමට කැප වූ අතර නව වැඩසටහන් ඔස්සේ ශ්‍රාවක ජනතාව තුළ වින්දනය සමඟ දැනුවත් බවක් ඇති කිරීමට ශ්‍රාවක පර්යේෂණ අංශයෙන් උපරිම වැඩ ගත්තා.

70 දශකයේ අගභාගයේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් හා ගුවන්විදුලි ප්‍රවෘත්ති ලේකම් වූ මෙරට සන්නිවේදන විශේෂඥයෙකු, පර්යේෂකයෙකු වන ආචාර්ය සරත් අමුණුගම ගුවන්විදුලි හඬ මාධ්‍ය ගමන් මග වෙනසකට ලක් කරමින් ශ්‍රාවක ජනයා අතරට ගෙන යමින් විද්වතුන්ගේ දායකත්වය ගුවන්විදුලියට ලබා ගැනීමට මුල් වුණා. ඒ, ශ්‍රවණ පර්යේෂණ අංශය විධිමත් කරමින් වෘත්තිකභාවයක්, වටිනාකමක් ලබා දීමට.

යුනෙස්කෝ ආයතනයේ උපදේශකවරයෙකුගේ දායකත්වය ලබාගෙන බීබීසී බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සේවයේ විශේෂඥයෙකු ලෙස දිගු කාලයක් ක්‍රියා කළ අත්දැකීම් ඇති පර්යේෂණ නිලධාරියෙකු වූ Pieter Danheizer ලංකාවට ගෙන්වා ගැනීම සුවිශේෂ වුණා. ගුවන්විදුලි පර්යේෂණ කටයුතු පිළිබඳ සොයා බලා ඔහු බලධාරින්ට වාර්තාවක් ලබාදෙමින් "කඩිනමින් පශ්චාත් උපාධිධාරියෙකුගේ අධ්‍යක්ෂ මග පෙන්වීම මත ශ්‍රවණ පර්යේෂණ ඒකකය ඉදිරියට ගෙන යා යුතුයි" යන්න සඳහන් කර තිබුණා. ඒ අනුව මෙරට ජනමාධ්‍ය විෂය ක්ෂේත්‍රයේ විද්වතෙකු, ජ්‍යේෂ්ඨ පර්යේෂකයෙකු වූ නන්දන කරුණානායක පළමු ශ්‍රවණ පර්යේෂණ අධ්‍යක්ෂවරයා ලෙස පත් කෙරුණා. 1982 වසරේ ඔහුගේ ඉදිරි ශ්‍රවණ පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා සහාය පර්යේෂණ නිලධාරින් 6 දෙනෙකු පත් කෙරුණු අතර ශ්‍රවණ පර්යේෂණ අංශයට වෘත්තිමය වටිනාකමක්, ඇගයීමක් කළ පළමු අවස්ථාව ලෙස මෙය ශ්‍රී ලංකා ගුවන්විදුලි ඉතිහාසයේ සටහන් වුණා.

ගුවන්විදුලි ශ්‍රවණ පර්යේෂණ අංශය පර්යේෂණ අරම්භ කරමින් සෙසු මාධ්‍ය පිළිබඳ පර්යේෂණ සෙවීමක ද සිටින හෙයින් වාර්තා කිරීම ආරම්භ කළා. ශ්‍රාවක අවශ්‍යතා හා ප්‍රමුඛතාව මත, ප්‍රතිචාර මත වැඩසටහන් සැලසුම් කිරීම ශ්‍රවණ පර්යේෂණ අංශයේ මූලික අරමුණ වුණා. ඒ අනුව ශ්‍රවණ පර්යේෂණ අධ්‍යක්ෂ නන්දන කරුණානායකයන්ගේ උපදේශකත්ව හා මගපෙන්වීම යටතේ සිදු කර තිබෙන්නේ ජනමාධ්‍ය ග්‍රාහක පර්යේෂණ 37ක්. මෙය ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය පැමිණි ගමන්මගේ සුවිශේෂ අවස්ථාවක්.

බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සේවය බීබීසී දකුණු ආසියානු කලාපීය පර්යේෂණ ඇසුරෙන් කළ සමීක්ෂණ අධ්‍යයන වාර්තාවේ ශ්‍රවණ පර්යේෂණ අංශය හා අධ්‍යක්ෂවරයා පිළිබඳ විශේෂ සඳහනක් කර තිබෙනවා. එහි සටහන් ව ඇත්තේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ශ්‍රවණ පර්යේෂණ අංශය ජාත්‍යන්තර මට්ටමින් ලැබූ ජයග්‍රහණයක් ලෙස. 80 දශකයේදී ආචාර්ය නන්දන කරුණානායක ශ්‍රවණ පර්යේෂණ අංශයේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉවත් වූ අතර ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ඉතිහාස ගමන්මගේ ශ්‍රවණ පර්යේෂණ අධ්‍යක්ෂ හා අධ්‍යක්ෂ ජනරාල් ධුරය යන තනතුරු දෙක ම හිමි

කර ගත් තැනැත්තා ලෙස ඔහුගේ නම සටහන් වුණා.

80 දශකයේ අගභාගයේ ගුවන්විදුලි වැඩසටහන් පිළිබඳ සොයා බැලීමට පත් කළ සරත් පෙරේරා කමිටුව සිංහල සේවාවල විශේෂ දුර්වලතා රැසක් පෙන්වා දී තිබෙනවා. විශේෂයෙන් එහි සඳහන් කර ඇත්තේ වැඩසටහන්වල ගුණාත්මක බව අඩු වීම, නියමිත වේලාවට වැඩසටහන් ප්‍රචාරය කිරීමේ ප්‍රමුඛතාව ගැන. 1980 වසරේදී ශ්‍රවණ පර්යේෂණ අංශය සම්බන්ධ කෙරුණේ ගුවන්විදුලි අභ්‍යාස ආයතනයට. එහිදී දැනුවත් බවක් ඇති අසන්නන්ගෙන් යුත් ශ්‍රවණ මණ්ඩලයක් පත්කොට තිබෙන්නේ වැඩසටහන් පිළිබඳ ඔවුන්ගේ අදහස් හා ප්‍රතිචාර දැන ගැනීමට. මේ උපක්‍රමය නිසා වැඩසටහන්වල තත්ත්වය උසස් කිරීමට මෙන් ම නිවේදක නිවේදිකාවන්ගේ, නිෂ්පාදකයන්ගේ අඩුපාඩුකම් හා දුර්වලතා මඟ හරවා ගැනීමට අවස්ථාවක් උදා වුණා.

ගුවන්විදුලියේ පරිවර්තන රැසක් සිදු වූ පසුබිමක ගුවන්විදුලියට සවන්දෙන අසන්නන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පළමු වරට City FM නමින් ගුවන්විදුලි විකාශනයක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඇරඹුවේ 1989 නොවැම්බර් 03 දින. එහිදී ශ්‍රාවක ප්‍රතිචාරය නැංවීමට සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන් වැඩසටහන් ගෙනඒමට පියවර ගැනුණා. 90 දශකය ආරම්භයේ රජයේ අවසරය මත FM ගුවන්විදුලි නාලිකා ඇරඹීමට පෞද්ගලික අංශයට අවස්ථාව උදා වීමත් සමඟ සිදු වූයේ සාම්ප්‍රදායික ගුවන්විදුලිය හිමි කරගෙන තිබූ ශ්‍රාවක ආධිපත්‍යය මුළුමනින් ම බිඳ වැටී, නව ගුවන්විදුලි වෙනස සමඟ ශ්‍රාවකයන් එක් වීම.

වර්තමානය වන විට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සාම්ප්‍රදායික ඒකාකාරී වැඩසටහන් ආකෘතියෙන් මිදී නව ප්‍රවණතා සමඟ ජාතික ගුවන්විදුලියේ අරමුණු හා පරමාර්ථ රැකගෙන නව වැඩසටහන් ආකෘති ශ්‍රාවක ජනයා අතරට ගෙන යාමට කැපවිය යුතුයි. ඒ සඳහා නිවැරදි මගපෙන්වීමක් හා උපදේශකත්වයක් යටතේ විධිමත් ශ්‍රවණ පර්යේෂණ අංශයක් ගුවන්විදුලි සංස්ථාවේ ඇරඹිය යුතුයි. ශ්‍රාවක ප්‍රතිචාර නොමැති ව ශ්‍රී ලංකා ගුවන්විදුලියට ඉදිරි පැවැත්මක් නැහැ.

# නූතන අභියෝග






නීතීඥ
**කළණී ඉරෝෂා ධර්මසිරි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ජනමාධ්‍ය අධ්‍යයන අංශය
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය

ලොව විද්‍යුත් සන්නිවේදනයේ හැරවුම් ලක්ෂ්‍යය බවට පත්වනුයේ ගුවන්විදුලියේ සොයා ගැනීම. ටෙලිග්‍රාෆ් සන්නිවේදන ක්‍රමවල අත්හදාබැලීම් හමුවේ ගුග්ලි එල්මෝ මාර්කෝනි ගුවන්විදුලිය හඳුන්වා දුන්නා. රැහැන් රහිත ව එක් තැනක සිට තවත් තැනකට පණිවිඩ සම්ප්‍රේෂණය කිරීමේ තාක්ෂණය වැඩිදියුණු කරමිනුයි ගුවන්විදුලිය නිපදවන ලද්දේ. කාර්මික විප්ලවයෙන් පසු නිර්මාණය වූ මේ සන්නිවේදන මාධ්‍යය අදටත් රටවල් පුරා ඉතා සක්‍රිය මට්ටමින් මහජනයාට තොරතුරු සම්ප්‍රේෂණය ක්‍රියාවලියේ නියැළෙමින් විකාශනය වෙනවා. ඒ ආකාරයෙන් විකාශනය වූ ගුවන්විදුලිය අද වන විට ක්‍රියාත්මක වන්නේ ආකෘතිමය, අන්තර්ගතමය හා තාක්ෂණික වශයෙන් විවිධ වූ විපර්යාසවලට ලක්වෙමින්.

සංවර්ධනය යන්න පුළුල් වූ පරාසයක විහිදී පැතිරෙන්නක්. සමස්ත සමාජ ක්‍රමයේ ඉදිරි ගමන හෝ සමාජයේ සිදුවන විප්ලවීය වෙනස හෝ සංවර්ධනය යන්න අරුත් ගැන්වෙනවා. ගුවන්විදුලි ක්‍රියාවලියේ සංවර්ධනය යනු ගුවන්විදුලියේ සිදුවන යහපත් හා මනා වූ වර්ධනය. ඒකාකාරී වූ යාවත්කාලීන නොවන මාධ්‍යය පුද්ගලයා ප්‍රතික්ෂේප කරනවා. නූතන ලෝකයේ තරගකාරී මාධ්‍යකරණය දෙස විමසීමේදී පුද්ගලයන්ට තොරතුරු ලබා ගැනීමට විකල්ප මාධ්‍ය පවතින්නේ ගණනාවක්. විශේෂයෙන් නව මාධ්‍ය ආගමනයත් සමඟ සංහතික මාධ්‍යයේ පැවැත්ම ස්ථිර වීමටනම් පවතින තරගකාරිත්වය හා සටන් කළ හැකි මාධ්‍ය සම්ප්‍රදායක් සංහතික මාධ්‍ය තුළ බිහි විය යුතුයි. ඒ සඳහා සංහතික මාධ්‍ය යාවත්කාලීන කරමින් සංවර්ධනය වීම අනිවාර්ය ලක්ෂණයක්. ගුවන්විදුලි මාධ්‍යයට ද එය අදාළ කරුණක්. පවතින තරගකාරිත්වයට මුහුණදිය හැකි අයුරින් ගුවන්විදුලි මාධ්‍යකරණය ද සංවර්ධනය කළ යුතුයි ආකෘතිමය (Structure), අන්තර්ගතමය (Content) සහ තාක්ෂණික (Technology) වශයෙන්.

තාක්ෂණිකමය වශයෙන් ගුවන්විදුලියේ සංවර්ධනය විමසීමේදී පෙරට වඩා ප්‍රගතියක් පවතිනවා. ගුවන්විදුලි මාධ්‍යය

ආරම්භයේදී පැවති විකාශන ක්‍රමවේද, තාක්ෂණය වර්ධනය වී තිබෙන්නේ ක්‍රමානුකූල ව. තාක්ෂණිකමය වශයෙන් Frequency ක්‍රමය අභිභවා අද වන විට අන්තර්ජාලය ඔස්සේ ද ගුවන්විදුලි විකාශනය සිදු වෙනවා. ගුවන්විදුලි විකාශන පරාසයේ ද සිදු වී ඇත්තේ වර්ධනයක්. පෙරට වඩා අර්ථ බාධාවකින් තොර ව ගුවන්විදුලිය ශ්‍රවණය කිරීමේ හැකියාව ද පවතිනවා.

තාක්ෂණික දියුණුවත් සමඟ ගුවන්විදුලිය හා ශ්‍රාවකයා අතර අන්තර්ක්‍රියා කිරීම වැඩි වී ඇති අතර එයින් ගුවන්විදුලි නිවේදකයා හා ශ්‍රාවකයා අතර ගොඩනගන්නේ මනා වූ සම්බන්ධතාවක්. ප්‍රාථමික සම්ප්‍රේෂණ විකාශන ක්‍රමවලින් ඇරඹී ගුවන්විදුලි තරංග මාලාව අද වන විට Webcasting, Podcasting, On-demand ආදී ක්‍රමවේද ඔස්සේ සංවර්ධනීය අරමුණු සාක්ෂාත් කරගෙන තිබෙනවා. ගුවන්විදුලි මාධ්‍ය නාලිකාවක් ඔස්සේ විකාශනය කරන වැඩසටහන් live streaming ඔස්සේ ෆේස්බුක් හා යූටියුබ්වලින් නැරඹීමට, නැවත එය ශ්‍රවණය කිරීමට හා download කිරීමට හැකි වීම ද ගුවන්විදුලි මාධ්‍යයේ ශක්‍යතාවක්.

ආකෘතිමය වශයෙන් ගත් කල ගුවන්විදුලිය ආරම්භක යුගයේ පැවති ආකෘති තවමත් ක්‍රියාත්මකයි. ප්‍රවෘත්ති, සඟරාමය, සම්මුඛ සාකච්ඡා, වාර්තාමය, නාට්‍යමය සහ සංගීතමය යනාදී ගුවන්විදුලි ආකෘති වර්තමානයේ පැවතියත් එහිදී ගුවන්විදුලිය සංවර්ධනාත්මක ඉලක්ක සපුරාගෙන නැහැ. ආකෘති කිහිපයක් උපයෝගී කරගෙන නව ආකෘති නිර්මාණයත් නවතාවකින් යුතු ආකෘති නිර්මාණයත් සිදු වී නැහැ.

අන්තර්ගතමය සංවර්ධනයක් ද ගුවන්විදුලියේ දක්නට නැහැ. ඒ වෙනුවට පවතින්නේ අන්තර්ගතමය පිරිහීමක්. විශේෂයෙන් ගුවන්විදුලි මාධ්‍යය ආරම්භක යුගයේ පැවති වැඩසටහන් අන්තර්ගතය ග්‍රාහක අවශ්‍යතා පූර්ණය කරන, දැනුම වර්ධනය කරන භාෂා ශෛලිය හා සංස්කෘතිය රැක ගැනීමට යොමු වුණා. වත්මන් වැඩසටහන් අන්තර්ගතයේ හරවත් බවක් හෝ ගුණාත්මක බවක් හෝ දැකිය නොහැකියි. විශේෂයෙන් බොහෝ විට පවතින්නේ ගුවන් කාලය උපයෝගී කරගනිමින් අල්ලාප සල්ලාපයේ යෙදෙන නිවේදකයන්ගේ මිශ්‍ර වූ භාෂා ශෛලිය ඔස්සේ මෙහෙයවන නිරර්ථක අන්තර්ගත වැඩසටහන්. අධ්‍යාපනය, තොරතුරු ලබාදෙන, දැනුම සංකේන්ද්‍රණය කරන හරවත් ගුණාත්මක අන්තර්ගතයක් සහිත වැඩසටහන් නැහැ. හුදෙක් ම විනෝදාස්වාදය පමණක් අපේක්ෂා කරන වැඩසටහනක ගුණාත්මකභාවයක් හෝ හරවත් බවක් හෝ නොපැවතීම සාමාන්‍ය කරුණක්. වර්තමාන ගුවන්විදුලි වැඩසටහන්වල අන්තර්ගතමය සංවර්ධනයක් සිදු ව නොමැති බවයි ඉන් පැහැදිලි වන්නේ.

මේ අනුව තාක්ෂණික සංවර්ධනයක් පැවතියත් ආකෘතිමය හා අන්තර්ගතමය වශයෙන් පිරිහීමට ලක් ව ඇති ස්වභාවයක් අද්‍යතන ගුවන්විදුලි කර්මාන්තය විමසීමේදී

> තාක්ෂණයේ වර්ධනයත් සමඟ නව මාධ්‍ය බිහිවීමෙන් ගුවන්විදුලි මාධ්‍යයේ තරගකාරීත්වයක් නිර්මාණය වී ඇති අතර ඊට මුහුණදීමටනම් ගුවන්විදුලි මාධ්‍යය ද නව මාධ්‍ය හා මුසුවෙමින් නව්‍යතා හඳුන්වා දිය යුතු වෙනවා. සාම්ප්‍රදායික ක්‍රම අභිභවා නව මුහුණුවරකින් යුතු ව ශ්‍රාවකයන් පිනවීමේ හැකියාව ගුවන්විදුලි මාධ්‍යය සතුවීම අද වන විට අනිවාර්ය සාධකයක්. එහිදී වඩාත් යෝග්‍ය වන්නේ වෙබ් ගුවන්විදුලි නාලිකා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය නාලිකාවල දිගුවක් ලෙස භාවිත කරනවාට වඩා විකල්ප මාධ්‍ය ලෙස යොදා ගැනීම.

පෙනී යනවා. සැබෑ සංවර්ධනය යනු මේ සියල්ලෙහි ම එකතුවෙන් සිදුවන්නා වූ වර්ධනීය අගයක්. එක් පැතිකඩකින් පමණක් සංවර්ධනය වූ පමණින් එය සැබෑ සංවර්ධනය යැයි කිව නොහැකියි. වත්මන් ගුවන්විදුලි මාධ්‍ය කලාව වාණිජකරණයට හා දේශපාලනීකරණයට ලක් ව ඇති බව නොරහසක්.

තාක්ෂණයේ වර්ධනයත් සමඟ නව මාධ්‍ය බිහිවීමෙන් ගුවන්විදුලි මාධ්‍යයේ තරගකාරිත්වයක් නිර්මාණය වී ඇති අතර ඊට මුහුණදීමටනම් ගුවන්විදුලි මාධ්‍යය ද නව මාධ්‍ය හා මුසුවෙමින් නව්‍යතා හඳුන්වා දිය යුතු වෙනවා. සාම්ප්‍රදායික ක්‍රම අභිභවා නව මුහුණුවරකින් යුතු ව ශ්‍රාවකයන් පිනවීමේ හැකියාව ගුවන්විදුලි මාධ්‍යය සතුවීම අද වන විට අනිවාර්ය සාධකයක්. එහිදී වඩාත් යෝග්‍ය වන්නේ වෙබ් ගුවන්විදුලි නාලිකා ප්‍රධාන ධාරාවේ මාධ්‍ය නාලිකාවල දිගුවක් ලෙස භාවිත කරනවාට වඩා විකල්ප මාධ්‍ය ලෙස යොදා ගැනීම.

අන්තර්ජාලය ප්‍රමුඛ වෙබ් ගුවන්විදුලි නාලිකා බිහිවීමෙන් මාධ්‍ය ප්‍රජාතන්ත්‍රීකරණය වී තිබෙන අතර තොරතුරු ලබා ගැනීමට තිබූ මාර්ග සංඛ්‍යාව ද වැඩි වී තිබෙනවා. වෙබ් රේඩියෝ යන සංකල්පය සමාජයේ ගොඩනැඟුණු විශිෂ්ට ප්‍රවණතාවක්. එහෙත් එය ඵලදායී ව යොදා ගත යුතු වෙනවා. මෙරට අන්තර්ජාලය ප්‍රමුඛ වෙබ් ගුවන්විදුලි නාලිකාවලට පවතින ප්‍රධානතම ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක ම සමාන ව විහිදුණු අන්තර්ජාල පහසුකම් නොමැති වීම. නව මාධ්‍ය සාක්ෂරතාව නොමැතිකම, අන්තර්ජාල ගුවන්විදුලිය පිළිබඳ ශ්‍රාවකයාට දැනුවත්භාවයක් නොමැති වීමත් මේ සඳහා මූලික ව ම බලපානවා.

වර්තමාන ගුවන්විදුලි මාධ්‍යකරණය වෙනස් විය යුත්තේ තාක්ෂණිකමය වශයෙන් සංවර්ධනය වනවාත් සමග ම අන්තර්ගතමය හා ආකෘතිමය වශයෙන් සංවර්ධනය වීම ද අනිවාර්ය වීමෙන්. එහිදී ග්‍රාහකයාගේ සැබෑ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින ගුණාත්මක අන්තර්ගතයක් සහිත ආකෘති නිර්මාණය විය යුතුයි. දේශපාලනීකරණය, වාණිජකරණය ආදී ලාභ අපේක්ෂාවෙන් තොර ව ස්වාධීන හා සත්‍යවාදී මාධ්‍ය කලාවක් බිහි විය යුතුයි.

# අධිෂ්ඨානශීලී සලකුණක්

ගුවන්විදුලිය යනු මෙරට පළමු වැනි විද්‍යුත් සන්නිවේදකයා. සන්නිවේදන ක්ෂේත්‍රයේ එදා ඇරඹූ එහි අලුත් ගමන බොහෝ දුෂ්කරතා, අභියෝග හා කැපවීම් මත විවිධ තත්ත්ව යටතේ ජනතාවට සමීප වී තිබෙනවා. මාධ්‍ය පිළිබඳ අත්දැකීම් ලබා දී ජනතාව මාධ්‍යයට හුරු කරවීම, අනුගත කරවීම මෙන් ම ගුවන්විදුලිය මාධ්‍ය අධ්‍යාපනය ද ලබා දෙනවා. මෙරට පළමු වරට මාධ්‍ය අධ්‍යාපනය ලබා දීම ආරම්භ කළේ ගුවන්විදුලි සංස්ථාව. ඒ, 1968 වසරේදී.

මුල්වරට ජනතාවට ගෙදර සිට ලෝකයට අත දිගු කිරීමේ හැකියාව ඇති කළ ප්‍රධාන සහ සප්‍රාණික සජීවි මාධ්‍ය වුණේ ද ගුවන්විදුලිය. සමාජ සම්බන්ධීකාරකයකු, ප්‍රවර්ධකයකු සහ ලෝකය පිළිබඳ දැනමුතුකම් දුන් ගුරුවරයකු හැටියට ජාතික ගුවන්විදුලිය අසමසමයි. සමාජ සද්කාරක නියමුවකුගේ භූමිකාව ද ජාතික ගුවන්විදුලිය ඉටු කළා. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය වෙනස් කළ, සමාජ සබඳතා අවකාශය පුළුල් කළ, ලංකාව හා ලෝකය අතර සබැඳියාව ඉතා ම සක්‍රිය ව සජීවී මට්ටමකට වර්ධනය කළ මහා ජාතික සන්නිවේදන තක්සලාවක් ලෙස ගුවන්විදුලිය හඳුන්වන්න පුළුවන්. අපේ ගුවන්විදුලිය එතෙරට ද ගොස් තිබුණා. ඒ, විශේෂයෙන් ඉන්දියානු කලාපයට සහ අරාබිකරයට. අතීතයේ ඉන්දියාවෙන් වෙළෙඳ දැන්වීම් පවා ලංකාවේ ගුවන්විදුලියට ලැබී තිබෙනවා

ගුවන්විදුලිය යනු භාෂාවෙන් මවන ලෝකය. එය මිනිසුන්ගේ මනෝභාවය, රසභාවය ප්‍රසාරණය කිරීමේදී භාෂාව හඬ සහ නිහඬ බව යොදා ගත්තා. ගුවන්විදුලියට අසු නොවන මානයක් නැහැ. ශ්‍රී ලංකාවේ ශ්‍රාවකයාට ගුවන්විදුලිය සකල කලාවන්හි වටිනාකම ලබා දී තිබෙනවා. ගුවන්විදුලිය සමාජ සංස්කෘතික නියමුවෙක්. මාධ්‍ය ක්ෂේත්‍රයේ සහ කලා ක්ෂේත්‍රයේ අප අද වන විට දැවැන්තයන් ලෙස හඳුනා ගන්නා බොහෝදෙනකුට



මහාචාර්ය
**උදිත ගයාශාන් ගුණසේකර**
සභාපති
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

මූලික අඩිතාලම වැටුණේ ගුවන්විදුලියේ ළමා පිටියෙන්.

ශ්‍රී ලංකා ගුවන්විදුලියේ සියවස් සැමරුම යෙදී තිබෙන්නේ 2025 දෙසැම්බර් 16 දිනට. ගුවන්විදුලියේ 100 වැනි වර්ෂය ආරම්භ වුණේ 2024 දෙසැම්බර් 16 නිසා සියවස වෙනුවෙන් පළමු උත්කර්ෂවත් අවස්ථාව සනිටුහන් කරමින් අප එදින ගුවන්විදුලියේ සියවස් සැමරුම් මුද්දරය නිකුත් කළා. එතැන් පටන් මාසික ව අපේ එක් එක් නාලිකාවලින් පවත්වාගෙන ගිය වැඩසටහන් සියවස් සැමරුම් වැඩසටහන් හැටියටයි ඉදිරිපත් කළේ.

සැම කලෙක ම මෙරට මාධ්‍ය ක්ෂේත්‍රයේ සහ කලා ක්ෂේත්‍රයේ අතිදක්ෂයන් පිරිසක් ගුවන්විදුලිය වඩා එක්රොක් ව සිටියා. ගායකයන් වාදකයන්, නාට්‍යවේදින්, නිවේදකයන්, විචාරකයන්, පිටපත් රචකයන්, සම්ප්‍රවේශකයන් සියල්ලන් ම එහි සිටියා. ඒ අතර ආයතනය පවත්වාගෙන යෑම උදෙසා විශිෂ්ට කැපකිරීම් කළ පරිපාලකයන් ද සිටියා. එහෙත් වරින් වර සිදු වූ දේශපාලනික අවභාවිත හේතුවෙන් ගුවන්විදුලිය තිබිය යුතු තැන ගුවන්විදුලියට පවතින්නට නොහැකි වුණා. ගුවන්විදුලියෙන් රටේ ජනතාවට ලැබිය යුතු නිසි ඵලදාව ලබාගන්නත් නොහැකි වුණා. ගුවන්විදුලිය සතු ව තිබූ අපරිමිත සම්පත් විවිධාකාරයෙන් කොල්ල කැවා පමණක් නොව ඒ සඳහා ජාත්‍යන්තර මැදිහත්වීම් සහිත සැලසුම් ද සකස් කර තිබුණා.

මුල්කාලයේ සිට ගුවන්විදුලිය ජනගත වෙමින්, ජනප්‍රිය වෙමින්, ජනතාවගේ හදගැස්ම බවට පත්වෙමින් පැමිණ 1977න් පමණ පසු එහි යම් වෙනසක් සිදු වෙනවා. ඒ සඳහා බලපෑ කාරණා අතර දේශපාලනික බලපෑම් ප්‍රධානයි. තරගකාරී විද්‍යුත් මාධ්‍ය ආරම්භ වන්නේ 1990න් පසුව. 2000න් පසු සමාජ මාධ්‍ය නැගී සිටිනවා. ඒ දේවල් සමඟ මාධ්‍ය ලෝකයේ හැඩය වෙනස් වන විට ගුවන්විදුලියත් ඊට අනුරූප ව වෙනස්විය යුතු ව තිබුණා. ඒ වෙනස්වීම කෙසේ වෙතත් පවත්වාගෙන ආ විකාශනය හා තාක්ෂණික වටිනාකම් පවා නිසියාකාර ව නඩත්තු වී නැහැ.

මෙරට රාජ්‍ය මාධ්‍යවලින් ලංකාව පුරා විහිදුණු ජාලයක් තිබෙන්නේ ගුවන්විදුලියට පමණයි. කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය මෙන් ම රජරට, රුහුණ, කඳුරට, අක්කරෙයිපත්තු, යාපනේ ට්‍රාන්ස්මිෂන් වෙනස්. වෙන ම ගුවන්විදුලි මධ්‍යස්ථානවලින් නාලිකා දියත් කර තිබෙනවා. මෙහි ව්‍යුහය පෘථුලයි. ඒ නිසා ම අපට අතපොවන්නට පුළුවන් දේ වැඩියි. එහෙත් පසුගිය කාලයේ එක්තරා නිශ්චිත ආකාරයකට මෙය දිශාගත වී, සමාජ සාධනීය ව්‍යුහයක් වෙනුවෙන් ගමන් නොකරපු නිසා දැන් අප ඒ යම් යම් අඩුපාඩු සපුරාගත යුතු ව තිබෙනවා.

ගුවන්විදුලියේ සියවස් සැමරුම අප සලකන්නේ මේ ප්‍රශ්න විසඳා ගන්නා අතර ම ඊළඟ සියවස සඳහා ගුවන්විදුලියේ විශාල ඉදිරි පිම්මක් වෙනුවෙන් සූදානම් වීමක් ලෙස. නැවත ගොඩනැගීම සහ ඉදිරියට ගමන් කිරීම යන අධිෂ්ඨානශීලී සලකුණක් ලෙස. සියවස් සැමරුම වෙනුවෙන් සූදානම් කර තිබුණු ඇතැම් වැඩසටහන් රටේ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වයත් සමග කල්දැමීමට සිදුවුණා. ඒ

අනුව සර්ව ආගමික පුදපූජා වැඩසටහනක් දෙසැම්බර් 15 දින පැවැත්වෙන අතර දෙසැම්බර් 16 දින සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් පැවැත්වීම සහ සියක් නමකට සාංඝික දානයක් දීම සිදු කරනවා.

මෙරට භූමි ප්‍රමාණයෙන් 92%ක් ආවරණය කරන ජාතික ගුවන්විදුලිය පුළුල් ජාලයක්. සේවා 13ක් ජාතික ගුවන්විදුලියට තිබෙනවා. මේ වෙනුවෙන් භාවිත කරන්නේ විකාශනාගාර 14ක්. ශ්‍රී ලංකා ගුවන්විදුලිය දකුණු ආසියාවේ පළමු ගුවන්විදුලිය. ලෝකයේ දෙවැනි ගුවන්විදුලිය. සියවසක් පුරා හැදී වැඩී අතුපතර විහිදා ගිය එය අද වන විට වෘක්ෂයක් බවට පත්වෙලා. ලෝකයේ තාක්ෂණය වෙනස් වන විට ගුවන්විදුලියටත් සිදු වෙනවා ඒ වෙනුවෙන් සූදානම් වෙන්නට. අතීතයේ ජාතික ගුවන්විදුලියේ සේවකයන් තුන්දහසකට වැඩි පිරිසක් සිටියත් අද සිටින්නේ තුන්සිය තිස් ගණනක්. එහෙත් ප්‍රවෘත්ති විකාශන කාලය හෝ වැඩසටහන් කාලය හෝ අඩු වී නැහැ. තරගය වැඩිවුණත් අපේ සම්පත්වල වර්ධනයක් සිදු නොවුණත් ගුවන්විදුලිය ඔස්සේ කෙරෙන වැඩ ප්‍රමාණයේ අඩු වීමක් වෙලා නැහැ. ඒ නිසා අප සිටින්නේ අභියෝගාත්මක තත්ත්වයක.

මහජන සේවා විකාශන මාධ්‍යයක් හැටියට ජාතික ගුවන්විදුලිය රජය සතු ව පවත්වා ගන්නවානම් ඒ සඳහා අවස්ථාව අනිවාර්යයෙන් ම ලබාදිය යුතුයි. මහජන සේවා විකාශන මාධ්‍යයක්නම් වගකීමෙන් මහජනතාව හා රාජ්‍ය යාන්ත්‍රණය අතර සම්බන්ධීකාරකයා හැටියට පැවැතිය යුතු නිසා මෙය ව්‍යාපාරික හැඩයකින් ම දියත් කරන්නට බැහැ. ජාතියේ වගකීම් සහ යුතුකම් රාජ්‍ය නියෝජ්‍යත්වයක් සහිත ව ඉදිරියට කරගෙන යා යුතුයි. එසේ ම පැවැත්ම සඳහා රජයට බරක් නොවී, හැකිතාක්දුරට ආර්ථිකය පෝෂණය කර ගැනීමත් අවශ්‍යයි. මේ කාරණා ද්විත්වය සමබර ව පවත්වා ගැනීමේ අභියෝගය ගුවන්විදුලියට තිබෙනවා. නවක පරම්පරාවක් ගොඩනැගීමේදී අලුත් සහ වෙනස් ආකාරයේ වැඩසටහන් නිෂ්පාදනය, විකාශනය ඊළඟ පියවරේ අභියෝගාත්මක ඉසව්වක්. තරගකාරී මාධ්‍ය ලෝකයේ තොරතුරු ඉක්මනින් ලබාදීම මෙන් ම නිවැරදි ව සහ වගකීම් සහගත ව ලබා දීමත් වැදගත්.

අද වන විට ජාතික ගුවන්විදුලිය කිසිවකුට ගරහන, කිසිවකුට පක්ෂපාතී මාධ්‍යයක් නෙවෙයි. කිසිවකුගේ ගීත හෝ කටහඬ හෝ තහනම් කරන්නේ නැහැ. කෙසේ වෙතත් අප සතු සම්පත්වලින් වැඩ ගන්න අවශ්‍ය කාර්ය සාධන බලවේගය හිඟකමේ ගැටලුවකට අප මුහුණ පා සිටිනවා. ප්‍රායෝගික ව මේ යාන්ත්‍රණය නිසියාකාර ව පවත්වාගෙන යාමටනම් යම්කිසි මට්ටමකට ආයතන ව්‍යුහය ගොඩනැගිය යුතුයි. මේ ආයතනය ඉතා ම හෘදයාංගම, වගකීම් සහගත සහ රසවත් ලෙස වර්ධනය කිරීම මේ වන විටත් අප සිදු කරන්නක්. ප්‍රවෘත්ති අංශය සහ සංගීත අංශය වඩා සංවර්ධනාත්මක සහ සක්‍රීය තලයකට වැඩිදියුණු කිරීම ගැනත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. රාජ්‍ය මාධ්‍ය ආයතන වැඩි සංඛ්‍යාවක් අද වන විට තිබෙන්නේ ආර්ථික වශයෙන් පාඩු ලබන තත්ත්වයක. ඒ තත්ත්වය තව තවත් දරුණු අතට හැරෙන්නට ඉඩ නොදී, පාඩුව අවම කරමින් සාර්ථක ගමනක් වෙනුවෙන් ඉදිරියට එන බලකායක් ගොඩනැගීමයි මේ වන විට ජාතික ගුවන්විදුලියේ මුඛ්‍ය අරමුණ.

**කාංචනා සිරිවර්ධන**



# අවදානමට පෙර සූදානම

හර්ෂා සුගතදාස

රිය අනතුරකට මුහුණදුන් නිශ්මිට රුධිරය ලබාදීමෙන් පසුව ඇය එච්.අයි.වී (HIV-Human Immunodeficiency Virus) හෙවත් 'මානව ප්‍රතිශක්ති ඌනතා වයිරසය' ආසාදිතයකු බවට පත් වන බව අපට දැක ගැනීමට ලැබෙන්නේ මේ දිනවල ප්‍රදර්ශනය වන 'ආයු' චිත්‍රපටයෙන්. ඇයට රුධිරය දී තිබෙන්නේ වෙරළ ගැවසෙන තරුණයෙක්. මේ සිදුවීම දකිනවිට ක්ෂණික ව මතකයට නැගුණේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය කාමලිකා අබේරත්න. ඇයටත් එච්.අයි.වී වයිරසය ශරීරගත වන්නේ හදිසි අනතුරකට මුහුණපෑ මොහොතේ රුධිරය පාරවිලයනයේදී සිදුවූ වරදක් නිසා. එහෙත් ඇය කොන් වූයේ එච්.අයි.වී වයිරසය ශරීරගත වූ අයට, ඒඩ්ස් රෝගීන්ට මානුෂික ව සැලකිය යුතු ආකාරය පෙන්වාදෙන උගත් බුද්ධිමත් වෛද්‍යවරුන්ගෙන්. ඇගේ අවමඟුලටවත් ඈ සමඟ සේවය කළ ඇතැම් වෛද්‍යවරුන් සහභාගි වී තිබුණේ නැහැ. මේ රෝගයේ ඛේදනීය තත්ත්වයයි ඒ.

එච්.අයි.වී. වයිරසය ශරීරගත වීමෙන් පසු මිනිස් සිරුරේ ප්‍රතිශක්තිය ක්‍රමක්‍රමයෙන් අඩු වී ශරීරය දුර්වල කෙරෙනවා. මේ වයිරසය ඒඩ්ස් දක්වා වර්ධනය වීමට ගත වන්නේ අවුරුදු 2-10 අතර කාලයක්. පුද්ගලයකු ඒඩ්ස් රෝගී තත්ත්වයට පත්වුවහොත් ඉක්මනින් මරණය වැලඳ ගැනීමට සිදු වන්නේ එම රෝගය නිට්ටාවට සුව කළ හැකි ඖෂධ ප්‍රතිකාර තවමත් සොයාගෙන නැති බැවින්. ඒඩ්ස් රෝගය සඳහා ඖෂධ නිපදවීමට අසීරු වී තිබෙන්නේ එච්.අයි.වී. වයිරසය ප්‍රෝටීනයක් වශයෙන් සිරුරේ තිබෙන නිසා. එහෙත් ඒඩ්ස් දක්වා වර්ධනය වීමට ඉඩ නොදී ඖෂධවලින් එච්.අයි.වී. වයිරසය පාලනය කළ හැකියි. ඊට හොඳම නිදසුන වන්නේ ප්‍රින්සි මංගලිකාගේ කතාව.

ප්‍රින්සි මංගලිකාට එච්.අයි.වී. වයිරසය ශරීරගත වුණේ විදෙස්ගත ව සිට මෙරටට පැමිණි ඇගේ සැමියාගෙන්. ඒ, 2000 වර්ෂයේදී. මුලින් ම විදෙස්ගතවී මෙරටට පැමිණි ඔහුට උණ, සෙම්ප්‍රතිශ්‍යාව වැලඳී නිතර නිතර අසනීප වෙන්නට පටන් ගත්තා. මේ නිසා කොළඹ ජාතික රෝහලෙන් ප්‍රතිකාර ලබාගැනීමට ගිය ඔහුට කළ පරීක්ෂණයකින් තහවුරු වුණේ ඔහු එච්.අයි.වී. ආසාදිතයකු වී ඇති බව. අවාසනාවට ඔවුන්ගේ ගමේ ජීවත්වන රෝහල් සේවකයකු මේ පුවත ගමට ගෙනාවා. ගමේ අය ඔවුන්ට නොසරුප් වදනින් බැණ වැදුණා. ගල් ගැසුවා. මේ අතරේදී සිත් තැවුලට පත් ප්‍රින්සිගේ සැමියා වස පානය කර සියදිවි හානි කරගත්තා. එදින රෑයේ ගමේ අය ඔවුන්ගේ නිවසට ගිනි තබන්නේ අමානුෂික විදිහට. ඒ අතරේදී ප්‍රින්සි ද එච්.අයි.වී. ආසාදිතයකු බව තහවුරු වන අතර ඈ දියණියන් දෙදෙනකු සමඟ හුදෙකලා වෙනවා. එහෙත් ඇය ජීවිතය අත්හරින්නේ නැහැ. එච්.අයි.වී. වයිරසය පාලනය කිරීම සඳහා ඖෂධ ප්‍රතිකාර නොකඩවා ලබාගනිමින් දියණියන් හදාවඩා ගත්තා. එම වයිරසය සමඟ ජීවත්වන ඇය එච්..අයි.වී. ආසාදිතයන් වෙනුවෙන් Positive Women's Network සංවිධානය පිහිටුවාගෙන සමාජ ක්‍රියාකාරිනියක ලෙස දිරිය කාන්තාවක් වුණා. එම නිසා එච්.අයි.වී. වයිරසය ශරීරගත වී තිබුණත් එය පාලනය කරගනිමින් ජීවිතය ජය ගත හැකි බවයි මෙපුවතින් පැහැදිලි වන්නේ.

සුළඟින්, ස්පර්ශයෙන් මේ රෝගය වැළඳෙන්නේ නැහැ. එච්.අයි.වී. වයිරස ආසාදිතයකුගේ රුධිරය ශරීරගත වීම, අනාරක්ෂිත ලිංගික සම්බන්ධතා පැවැත්වීම සහ එච්.අයි.වී. වයිරසය ආසාදිත මවකගෙන් මව්කිරිවලින් දරුවාට සම්ප්‍රේෂණය වීම වශයෙන් එය බෝවිය හැකි ආකාර 3ක් තිබෙනවා. ඒ නිසා ඒඩ්ස් යනු අනාචාරයේ හැසිරීමෙන් පමණක් හැදෙන රෝගී තත්ත්වයක් නොවන බව අවබෝධ කර ගැනීම වැදගත්.

එච්.අයි.වී. වයිරසය රුධිරය ඔස්සේ ශරීරගත වීමේදී රුධිර පාරවිලයනය කිරීමෙන් පමණක් නොව, එන්නත් කටු භාවිතයෙන් ද ශරීරගත විය හැකියි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් එක ම එන්නත් කටු පාවිච්චි කිරීමෙන් එච්.අයි.වී.



වයිරසය ව්‍යාප්ත වීමේ වැඩි ඉඩකඩක් තිබෙනවා. ලිංගික සබඳතාවකදී එච්.අයි.වී. වයිරසය ශරීරගත විය හැකියි. එම ලිංගික සම්බන්ධය යෝනි මාර්ගයෙන් හෝ ගුද මාර්ගයෙන් හෝ මුඛ මාර්ගයෙන් හෝ සිදු වුවත් ශුක්‍රාණු සහ යෝනි

මාර්ග ශ්‍රාව හුවමාරු වීමේදී එච්.අයි.වී. වයිරසය ශරීරගත වෙන්නට පුළුවන්. මව්කිරිවලින් එච්.අයි.වී. වයිරසය සම්ප්‍රේෂණය වීම තිබෙන්නේ ඉතා අඩු මට්ටමක. ශ්‍රී ලංකාව 2019 වසරේ සිට එච්.අයි.වී. වයිරසය මව්කිරිවලින් දරුවාට බෝවීම තුරන් කළ රටක් වශයෙන් පිළිගැනෙනවා.

ශ්‍රී ලංකා ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහනේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ මාධවී ගුණතිලක පවසන ආකාරයට ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට එච්.අයි.වී. වයිරස ආසාදිතයකු හමුවන්නේ 1987 වසරේදී. එදා සිට 2024 වසර අවසානය දක්වා වාර්තා වී ඇති එච්.අයි.වී. වයිරස ආසාදිතයන් ගණන 6959ක්. 2025 වසරේ කාර්තු 3කදී එච්.අයි.වී. වයිරස ආසාදිතයන් 639ක් වාර්තා වී තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ දැනට වාර්තා වී ඇති මුළු ආසාදිතයන් ගණන 7168ක්. මේ තත්ත්වය පැහැදිලි කරන ප්‍රජා වෛද්‍ය විශේෂඥ මාධවී ගුණතිලක; "2024 වර්ෂයේ පමණක් වාර්තා වී ඇති එච්.අයි.වී. වයිරස



ආසාදිතයන් ගණන 824ක්. ඔවුන්ගෙන් 722ක් පිරිමි. පිරිමි පුද්ගලයන්ගෙන් වැඩිපුර ම මේ වයිරසය වාර්තා වන්නේ පිරිමි සමරිසි පුද්ගලයන් අතර. වයස අවුරුදු 15-24 අතර වයස් කාණ්ඩයේ පිරිමි අයගේ එච්.අයි.වී. වයිරස ආසාදිතයන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් දකින්නට පුළුවන්. ඒ අයගෙනුත් වයස අවුරුදු 20-24 අතරේ රෝගීන් වැඩියි. 2010 වසරට සාපේක්ෂ ව 2024 වසරේදී ලෝකයේ එච්.අයි.වී. වයිරස නව ආසාදිතයන් වාර්තාවීම 40%කින් අඩුවන විට ශ්‍රී ලංකාවේ එච්.අයි.වී. වයිරස ආසාදිතයන් වාර්තා වීම 48%කින් වැඩි වී තිබෙනවා. 2024 වසරේදී පමණක් ඒඩ්ස් මරණ 50ක් වාර්තා වී තිබෙනවා. කොළඹ සහ ගම්පහ එච්.අයි.වී. වයිරස ආසාදිතයන් වැඩිපුර ම හමුවෙන දිස්ත්‍රික්ක."

එච්.අයි.වී. 90%ක් ම බෝ වන්නේ අනාරක්ෂිත ලිංගික හැසිරීම්වලින්. මේ නිසා විශේෂයෙන් තරුණ පරම්පරාව ෆේස්බුක්, ටික්ටොක් වැනි මාධ්‍ය ඔස්සේ සම්බන්ධතා ඇති කරගෙන ඔවුන් සමඟ අනාරක්ෂිත ව ලිංගික ව හැසිරුණහොත් එච්.අයි.වී. වයිරසය ශරීරගත වීමේ අවදානමක් පවතින බවයි ඇයගේ අවධාරණය.

2024 වසරේ වාර්තා වූ එච්.අයි.වී. වයිරස ආසාදිතයන් 824න් 115ක් ම වයස අවුරුදු 15-24 අතර පසුවන්නන් වීම සුළුවෙන් තකන්නට බැහැ. ඔවුන් රටේ අනාගතය භාර ගැනීමට සිටින දරුවන් මෙන් ම රටේ ශ්‍රම බලකායට සෘජු ලෙස ඔවුන්ගේ දායකත්වය බලපානවා. පාසල් දරුවන්ට නිවැරදි ලෙස ලිංගික අධ්‍යාපනය ලබාදීම කාලීන අවශ්‍යතාවක් වන්නේ ඒ නිසා.

එච්.අයි.වී. වයිරසය ඇතුළු ලිංගාශ්‍රිත රෝග වැළඳිය හැකි බවට හඳුනාගත් අධි අවදානම් කණ්ඩායම් කිහිපයක් ශ්‍රී ලංකා ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහන හඳුන්වා දී තිබෙනවා. එය වර්ගීකරණය වන්නේ ලිංගික ශ්‍රමිකයන්, සමලිංගික ඇසුර පවත්වන පිරිමි, වෙරළේ ගැවසෙන ළමයින්, සිරකරුවන් සහ විවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් යනුවෙන්

එච්.අයි.වී. වයිරසය ශරීරගත වූවකුගේ රෝග ලක්ෂණ සුවිශේෂ නැහැ. සාමාන්‍යයෙන් උණ රෝගය වැලඳුණු පුද්ගලයකුගෙන් පළවන ලක්ෂණ මෙහිදී දකින්නට පුළුවන්. ඇතැම් විට රෝග ලක්ෂණ පෙන්නුම් නොකරන අවස්ථා ද තිබෙනවා. පළමුවෙන් ම උණ, හිසරදය, මස්පිඩු වේදනාව, උගුරේ හෝ මුඛයේ තුවාල ඇතිවීම, රාත්‍රියට දහඩිය දැමීම, තෙහෙට්ටුව, බර අඩුවීම, පාචන ගතිය, වසා ගැටිති ඉදිමීම වැනි රෝග ලක්ෂණ දකින්න ලැබෙනවා. වයිරසය ප්‍රගතිශීලී වන විට විවිධ ආසාදන, පිළිකා ඇතුළු බරපතළ සංකූලතාවලට හේතු වෙනවා.

එච්.අයි.වී./ඒඩ්ස් පිළිබඳ එක්සත් ජාතීන්ගේ වැඩසටහන විසින් සෑම වසරක ම දෙසැම්බර් 01 දින ලෝක ඒඩ්ස් දිනය ලෙස නම් කරනු ලැබුවා. ලෝක ඒඩ්ස් දිනයේ මෙවර තේමාව වන්නේ 'අභියෝග ජයගෙන එච්.අයි.වී. නිවාරණය නව මඟකට ගැනීම' යන්න. වසර 2030දී එච්.අයි.වී. තුරන් කිරීම, එච්.අයි.වී. ගැන දැනුවත් කිරීම, ආසාදිතයන් හැකි ඉක්මනින් ප්‍රතිකාර සඳහා යොමු කිරීම, සමාජයෙන් එල්ලවන අපහාස සහ කොන් කිරීම් නැති කිරීම අපේක්ෂා කරනවා. ඊට අමතර ව ශ්‍රී ලංකා ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහන විසින් තරුණ ප්‍රජාව ඉලක්ක කර ගනිමින් වැඩසටහන් සංවිධානය කරනු ලබන්නේ තරුණ පිරිස එච්.අයි.වී. වයිරස ආසාදිතයන් බවට පත්වීමේ වර්ධනය පහත දැමීමේ අරමුණින්. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන සායන 40ක් තිබෙනවා. මේ සායනවල ප්‍රතිකාර කරන්නේ ඒවාට යොමු වන අයගේ අනන්‍යතාව සහ රහස්‍යභාවය 100%ක් ම සුරකිමින්. ඒ නිසා යම් පුද්ගලයකුට සැකයක් ඇත්නම් ළඟ ම පිහිටි සායනයක් වෙත යොමුවීම වැදගත්.

කෙසේ වෙතත් ශ්‍රී ලාංකිකයන් වශයෙන් අපට සතුටු විය හැකි කාරණාවක් තිබෙනවා. ඒ, ලෝකය සමඟ සංසන්දනය කරන විට මෙරට එච්.අයි.වී. ප්‍රවණතාව 0.01%ට අඩු වීම. එහි අරුත ශ්‍රී ලංකාව එච්.අයි.වී. වයිරස තත්ත්වය බෙහෙවින් අඩු රටක් හැටියට සැලකීම.

# සිරිලක සිනමා උණුසුම

තුසිත ජයසුන්දර




සිනමාපට නිපැයුම හා ජනගත කරලීම ගතික ලකුණු බහුල කාර්යයක් ය යන්න නොරහසක්. මේ නිසා ම නිපැයුම් කාර්ය නිම වුව ද ජනගත කරලීම පමා වන සිනමාපට සේ ම නිපැයුම් කාර්ය නිම වූ විගස ම ජනගත කරලන සිනමාපට එක ම සමයකදී දත හැකි වනවා. වඩා සංවිධිත කොන්දේසි හා සාධක ඔස්සේ සක්‍රිය ලොව වඩා පෘථුල සිනමා කලාප වෙතින් පවා මෙයට අදාළ නිදසුන් හඳුනා ගැනීම අසීරු නැහැ. සියවසක් සපිරුණු සිරිලක සිනමාව ද තවදුරටත් සිනමාපට නිපැයුම හා ජනගත කරලීම සම්බන්ධයෙන් එසේ ඒකාකාර නොවන චර්යා පෙන්නුම් කරමින් සිටින්නේ වරෙක විචාර කාර්ය ද සම්මාන ප්‍රදාන ද යම් පරස්පරතා සහිත අවස්ථා කරා යොමු කරමින්.

රසික ආකර්ෂණය නොමඳ ව හා ප්‍රමාණවත් ව ලද, නිපැයුම් ප්‍රමිතිය ඉහළ නංවා ගත් සිනමාපට නොකඩවා ජනගත වූ සුවිශේෂ කාල වකවානු කිහිපයක් ම මේ තතු මැද ම දක්නට ලැබෙනවා. 1969, 1980 හා 2023 යන තෙවසර නිදසුන් ත්‍රයක්.

සිනමාව කලාත්මක, සම්භාවනීය හා විවාදාත්මක අයුරින් භාවිතයට ගනු පිණිස උත්සුක වූ හා එය ජයගත් සිනමාපට මෙහිලා වෙසෙසින් ඉස්මතු වන බවයි පෙනී යන්නේ. එනමුදු බහුතර සිනමා රසික ආහ්ලාදයට නිතැතින් ම ලක් වන රසාලිප්ත අංග මනාව සංගෘහිත සිනමාපට ද මේ ප්‍රවණතා බලාත්මක කරනු සඳහා ඉවහල් වූ වග සඳහන් කිරීම වැදගත්.

මේ ගෙවී යන්නේ සිරිලක සිනමාව මෙබඳු පෙරට ඒමක් නොඅනුමාන ව ම සනිටුහන් කළ වසරක් ය යන්න සුපැහැදිලියි. නිපැයුම් කාර්ය කෙසේ නිම වුව ද වසර පුරා ම විටෙක විරාමයකින් ද තොර ව ප්‍රදර්ශිත සිනමාපට ගණනාවක් ම නොමඳ හා ප්‍රමාණවත් රසික ප්‍රතිචාර ලැබ ගත්තේ විචාරක අවධානයට ද නිල වශයෙන් ම පාත්‍ර වෙමින්. මෙතැනදී අවලෝකනය කෙරෙන්නේ මේ සිනමාපට ජනිත කළ සිරිලක සිනමාවේ බලසම්පන්න බව පිළිබඳ කරුණු කිහිපයක්.

සිරිලක සිනමාවේ මේ අභිනව උදෝයෝගය හුදෙක් මේ වසරට පමණක් ම සීමා කරලීම ප්‍රඥාගෝචර වන්නේ නැහැ. ගෙවුණු වසරේදී මුල් වරට ප්‍රදර්ශිත සිනමාපට අතළොස්සක් ද මේ තතු වෙනුවෙන් පෙනී සිටි වග කිව යුතු වනවා. මෙතැන මාදිලි කිහිපයක ම සිනමාපට තිබූ වග නොරහසක්. මෙයින් උද්ධරණය කෙරෙන්නේ හැම තරාතිරමක ම රසිකයන් අමතන්නට මේ එක් එක් සිනමාපට වෙන් වෙන් වශයෙන් ද සමස්තයක් වශයෙන් ද උත්සුක වූ වග.

මෙසමය වන විට සම්මත පවුලේ සිනමා රසිකයන්ගේ ඇවතුම් පැවතුම් බරපතළ වෙනස්වීම් සහිතවයි දැකිය හැක්කේ. ඇතැම් සිනමාපට නරඹනු සඳහා ඔවුන් නොපැමිණෙන තරම්. මේ නිසා ම ඇතැම් සිනමාකරුවන් ද නිපැයුම්කරුවන් ද උනන්දු වන්නේ වෙනත් රසික පිරිස් ඉලක්ක කරගත් සිනමාපට නිමවන්නට.

මේ අනුව 'රාණී', 'නෙළුම් කුලුන', 'වාලම්පුරි හෙවත් හීන හතහමාරක්', 'රිදම් ඔෆ් ද ගිටාර්', 'දේවි කුසුමාසන', 'නීරා', 'මෝඩ තරිඳු', 'ආයු', 'මාරියා' යන මේ වසරේදී මුල් වරට ජනගත වූ සිනමාපට සඳහා ඉහළ හා ප්‍රමාණවත් රසික සහභාගිත්වය පවසන්නේ ද නව රසික කණ්ඩායම් ඉලක්ක කර ගැනීමේ වැදගත්කම. එසේ ම නව රසික කණ්ඩායම් ආසක්ත කර ගන්නට සමත් වෙමින් සිටින බව. සිරිලක සිනමාවේ මතු නොව සිරිලක සිනමා කලාපයේ ම පැවැත්ම හා අභිවෘද්ධිය උදෙසා මෙය අගනා දායකත්වයක්. සිනමා රසිකයන් දිනෙන් දින වියැකී යන වග සඳහන් කරමින් උකටලී ව නොසිටීමේ අරුත් සරු බව මෙයින් උද්දීපනය කෙරෙනවා.

මේ අභිනව රසික කණ්ඩායම් පැමිණෙන්නේ සිනමාව හා අනවරතයෙන් ම නොබැඳෙන, සිනමාව නොතකන හා ඉන් ලැබෙන අනුප්‍රාණය පිළිබඳ කිසිදු වැටහීමකින් තොර පිල් වෙතින්. මොවුන'තර වෘත්තික පිරිස් සැලකිය යුතු තරමින් සිටීම එක්තරා ආකාරයක අනාගත ආයෝජනයක්. දැක්ම හා නිපැයුම් ප්‍රමිතිය කෙරෙහි සිනමාකරුවන් ද නිපැයුම්කරුවන් ද යොමු කරලන අදිසි මෙහෙයුමක් මෙතැනදී තනා ගැනීම අසීරු නැහැ.

ගෙවී ගිය වසර කිහිපය තිස්සේ ම සිරිලක සිනමා ශාලා සිය තිර කාලය වරෙක වැඩි වශයෙන් ද තවත් වරෙක සැලකිය යුතු තරමින් ද වෙන් කරලනු ලැබුවේ නවතම විදෙස් සිනමාපට වෙනුවෙන්. එහෙත් වත්මන් සිරිලක සිනමා උණුසුම වැඩි තිර කාලයක් තමන් සතු කර ගන්නට කෙමෙන් වෙහෙසෙන බව පෙනී යනවා. පෙර මෙන් එක ම සිනමාපටය දිනපතා සියලු දර්ශන වාර සඳහා එක් නොවන පසුබිමක වුව මේ නැඹුරුව සඵලදායී වන බවයි දත හැකි වන්නේ.

යට කී සිනමාපට සමුච්චය නිපදවීමේදී පුද්ගල සාධක සේ ම ආයතනික සාධක ද උරෙනුර ගැටෙමින් ක්‍රියා කළ බව පෙනී යනවා. පසුගිය සමයේ තනි පුද්ගල සිනමා නිපැයුම්කරුවන් කෙමෙන් සිනමාව හැර යන්නට වූ බව සැබෑවක්. වෙනත් ආයෝජන අවස්ථා තිබියදී සිනමාව බඳු අවදානම් සහගත ආයෝජනයකට ඔවුන් තුළ කැමැත්තක් ඇති නොවන්නට පුළුවන්. එනමුදු වත්මන් තතු වෙතින් පෙනී යන්නේ සිනමා නිපැයුම වඩා විවෘත බිමක සිදු වන බව.

මෙසේ ඉහළ හෝ සැලකිය යුතු හෝ ආදායම් උපයමින් ද රසික නැණ නුවණ වඩවමින් ද පෙරට ආ සිනමාපට විදෙස් ප්‍රදර්ශන සඳහා විධිමත් ව යොමු වීම කිසිසේත් ම නොසලකා හැරිය යුතු




නොවන්නක්. විදෙස්ගත සිරිලක ප්‍රජාව ඉක්මවූ රසික පිරිස් එක්කර ගැනීම මෙහි නවතම අභියෝගය ලෙසිනුයි සඳහන් කළ හැක්කේ.

සම්මත තරු නොව විකල්ප තරු රූපණ කාර්යයේදී කැපී පෙනුණු බව මේ සිනමාපට විමසීමේදී දැකිය හැකි වූවක්. මොවුන'තරින් ප්‍රියන්ත සිරිකුමාර, තුසිත ලක්නාත්, අශාන් ඩයස්, සරත් කොතලාවල, ජගත් මනුවර්ණ, දසුන් පතිරණ හා දර්ශන් ධර්මරාජ් වෙසෙසින් සඳහන් කළ යුතු කිහිපදෙනෙක්. තරු ගුණැති දමිත් විජයතුංග, නිහාරි පෙරේරා, ශනුද්‍රි ප්‍රියසාද්, සැන්ඩ්‍රා මැක් වැන්නන් ද තමනට ලැබුණු චරිත මනාව නිරූපණයට උත්සුක වූ බව කිව යුතුයි.

2025 වසර උත්කර්ෂයට නැංවූ සිනමාපට අතර ඒකාකාර බවක් නොතිබූ තරම්. එක ම තලයක මේ සියල්ල ම තැබීම පහසු නැහැ. අශෝක හඳගම නිමවූ 'රාණි' සැබෑ සිදුවීම් හා සැබෑ චරිත රැගෙන ආ දේශපාලනික කතිකාවක් පොහොසත් කළ සිනමාපටයක් ලෙසිනුයි ගත හැක්කේ. සිය සිනමා භාවිතය පුරා ම අශෝක හඳගම අඩු වැඩි වශයෙන් පෙනී සිටියේ දේශපාලනික සිනමාවක් වෙනුවෙන් ය යන්න පැහැදිලියි. 'රාණි' සාර්ථකත්වය පසුපස ඊට පිටුබලය සැපයූ අන්තර්ගතයේ මතක හිටිනසුලු බව ද රැඳී තිබුණා.

ඉලංගෝ රාම් සිය පළමු සිනමා මෙහෙයුම සේ රැගෙන ආ 'නෙළුම් කුලුන' ජනාදරප්‍රාප්ත වූයේ අනපේක්ෂිත අන්දමින්. මෙහි එන්නේ අනෙකාට සිනාසිය හැකි හාස්‍යයක් නොවන වග තේරුම් ගන්නට සිනමාපටය මුළුමනින් ම නැරඹිය යුතු වනවා. තීරණාත්මක අවස්ථාවකදී මිනිසුන් හා ගැහැනුන් හැසිරෙන ව්‍යාජ හා නිර්ව්‍යාජ ආකාර පිළිබඳ සිනමානුරූපී ප්‍රකාශනයක් ලෙසින් ද 'නෙළුම් කුලුන' හැඳින්විය හැකියි.

'වාලම්පුරි' සමඟ ලක්මාල් ධර්මරත්න සිනමාවතරණය කරන්නේ 'කුඹියෝ' ප්‍රාසංගික ටෙලි නාටකය නිමවීමෙන් ලද පන්නරය ද සහිත ව. මෙහිදී ද ඔහු සමාජ දේශපාලන කතිකාවක් පොහොසත් කරන්නට උනන්දු වුණා. ඊට සමගාමී ව ඔහු පෘතග්ජනයන් සතු තෘෂ්ණාව පිළිබඳ ව කළ විවරණය විවාදාත්මකයි.

තේජා ඉද්දමල්ගොඩ විසින් නිමැවුම් කාර්ය අරඹන ලද බව සඳහන් 'රිදම් ඔෆ් ද ගිටාර්' අපමණ රසික ආදරයට පාත්‍ර වූයේ ජනාදරප්‍රාප්ත සංගීතඥ ක්ලැරන්ස් විජේවර්ධනගේ චරිතය මුල් කර ගත් නිසා ම. මෙපුවතට පාදක වූ 1960 හා 1970 දශක ද්විත්වය පිළිබඳ ව අද දවසේ පවත්නා අතීතකාමී කියැවීම ද මෙයට තවත් හේතුවක්. එය මෙසමයේදී සැලකෙන්නේ රසවත්, විසිතුරු අත්දැකීම් ලෙසින්.

'දේව් කුසුමාසන' මැයෙන් ජයන්ත චන්ද්‍රසිරි නිමවූ සිනමාපටය රජ සමයට බර තැබූ බොහෝ සිරිලක සිනමාපට අභිභවා නව කියැවීමකට ඉඩහසර සැලසූ සිනමාපටයක් ලෙසින් ද පෙනී යනවා. සැබෑ පුවතක් හා එහි එන සැබෑ චරිත පිළිගත් අයුරින් ම විදාරණය නොකරන ජයන්ත චන්ද්‍රසිරි සමකාලීන බටහිර බලපෑම් සම්බන්ධයෙන් වඩා වෙනස් හා නවමු දැක්මක පිහිටන්නේ ආන්දෝලනාත්මක පසුබිමක.

'නීරා' මැයෙන් වාසව බදුගේ ගෙනා සිනමාපටය හා වැඩිපුර ම බැඳුණේ තරුණ රසික පිරිස් ය යන්න සැබෑවක්. ඔවුන් සමඟ භාවමය බැඳීමක් ඇති කර ගන්නට සිනමාපටය උනන්දු වනවා. සිනමා ශාලා වෙතින් බැහැර වන තරුණ රසික පිරිස් රඳවා ගන්නට මෙබඳු සිනමාපට ඉවහල් කර ගත හැකි බව සඳහන් කිරීම වැදගත්.

මතුපිට සිනහව යටින් ඇති සදය උපහාසය මත පදනම් වූ සිනමාපටයක් සේ තිසර ඉඹුලාන නිමවූ 'මෝඩ තරිඳු' නම් කළ හැකියි. අභිනවයෙන් සිනමාව හා එක්වන වෘත්තිකයන් ද 'මෝඩ තරිඳු' මාදිලියේ සිනමාපට නොසලකා නොහැරීම දෙස විවෘත ව බැලීම අත්‍යන්තයෙන් ම වැදගත්. තිසර පෙන්වූ මේ සමත්කම ඇගැයීම නිසා ම ඔහුගේ ඉදිරි සිනමා නිර්මාණ හරබර වන්නට ඉඩ තිබෙනවා.

චත්‍ර වීරමන් සිය දෙවැනි සිනමා මෙහෙයුම සේ ගෙන එන 'ආයු' සිනමාවේ රූපමය සන්නිවේදන සමත්කම ප්‍රබලාකාරයෙන් දනවන්නට පියවර සලසා ගත සිනමාපටයක්. මෙය මරණය පිළිබඳ සුබවාදී කියැවීමක් සේ හඳුනා ගන්නට ද පුළුවන්. සංකේත බහුල මන්දගාමී රූප රචනය නිසා 'ආයු' වඩා සමීප වන්නේ විද්වත් රසිකයන්ට ය යන්න පැහැදිලියි.

එකිනෙකට වෙනස් සිනමාපට නිමවීමට ආ අරුණ ජයවර්ධන 'මාරියා' සමඟ ආකාර කිහිපයක ම රසික කණ්ඩායම් අමතන්නටයි වෑයම් කරන්නේ. මෙතැන සම්මත පවුලේ රසිකයක් නොමැති තරම්. පුරුෂ මනෝභාවය තුළ ස්ත්‍රී රූපය මෙතරම් අපූර්ව ආකාරයෙන් විවරණයට බට අන් සිරිලක සිනමාපටයක් පහසුවෙන් හඳුනා ගන්නට බැහැ. එක අතකට අරුණ සිදු කර ඇත්තේ දෙබරයකට ගලක් ගැසීමක්.

ඉහළ රසික ප්‍රතිචාර නොලද එහෙත් එසේ නොවිය යුතු සිනමාපට දෙකක් ද මේ වසරට අදාළ ව තිරගත වූ බව සඳහන් කළ යුතු වනවා. ඒ, ප්‍රදීප් ධර්මදාසගේ 'අයිස් ක්‍රීම්' හා මාලක දේවප්‍රියගේ 'බහුචිතවාදියා'. මෙයින් 'බහුචිතවාදියා' නාගරික පීඩිත තාරුණ්‍යයේ දිවි සැරිය හා ඉරණම පිළිබඳ දේශපාලනික කියැවීමකට සපැමිණි අවස්ථාවක්. උක්ත සිනමාපට සමුච්චය ඉහළ රසික ප්‍රතිචාර ලැබුවේ සැබැවින් ම රසිකත්වයේ පොහොසත්වීමක් නිසාමදැයි යන පැනය සීරුවෙන් නඟන්නට ද 'බහුචිතවාදියා' ලද අත්දැකීම මහෝපකාරී කර ගන්නට පුළුවන්.

# පරිවර්තකයා ද්‍රෝහියෙක්




**නුවන් කුමාර කටුගම්පල**

"'පිටස්තරයා', 'අලුත් මිනිහෙක්' යන කෘති පරිවර්තනය කළ ආචාර්ය පියසිරි විජේසේකර, එම කෘතිවල පරිවර්තකයාගේ නම ලෙස තමාගේ නම යොදා එය තනි ඉරකින් කපා හැරියා. එයින් ඔහු සංකේතවත් කරන්නට උත්සාහ කළේ පරිවර්තකයා, ද්‍රෝහියා (Translator, Traitor) කියා." යනුවෙන් සඳහන් කළේ ප්‍රවීණ සාහිත්‍යවේදී, විචාරක හසිත අබේවර්ධන. ඔහු මෙසේ පැවසුවේ නොබෝද ගම්පහ, ආසියානු සාහිත්‍ය නිවහනේ පැවති ප්‍රවීණ ලේඛිකා සේනානි ධර්මරත්න පරිවර්තනය කළ 'හෙනා සිත්තරිය ලක්ෂ්මී' නවකතාව පිළිබඳ සංවාදයේදී. මේ නවකතාව අල්කා ජෝෂි (Alka Joshi) නම් ඇමරිකාවේ වාසය කරන ඉන්දියාවේ උපන් ලේඛිකාව විසින් ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද 'The Henna Artist' නවකතාවේ සිංහල පරිවර්තනය. එය අල්කාගේ තුන් ඈඳුතු නවකතාවක පළමුවැන්න. එහි අනෙක් කෘති දෙක වන්නේ 'The Secret Keeper of Jaipur' සහ 'The Perfumist of Paris'.

පරිවර්තකයාගේ අවධානය යොමු විය යුතු පරිවර්තනයේ තාක්ෂණික උපක්‍රමවල (Translation Techniques) වැදගත්කම විචාරක හසිත අවධාරණය කළේ The Henna Artist කෘතියේ පරිවර්තිකාව 100%ක් ම නොවූවත් බොහෝදුරට පරිවර්තන තාක්ෂණික අවශ්‍යතා සපුරමින් මේ කෘතිය පරිවර්තනය කර ඇති බව කියමින්. ඔහු ගෙනහැර දැක්වූ පරිදි පරිවර්තන කාර්යයකදී සපිරිය යුතු මූලික තාක්ෂණික අවශ්‍යතා රාශියක් තිබෙනවා.

පොතේ වාක්‍යයෙන් වාක්‍යයට තිබෙන අන්‍යෝන්‍ය සම්බන්ධතාව ආරක්ෂා කළ යුතු වන බැවින් මුල් කෘතිය ලියා ඇති භාෂාවේ වාක්‍යයක තිබෙන වචන අතරින් වඩාත් සාරාත්මක වචනය හෝ වචන කිහිපය හෝ හඳුනා ගැනීම සහ පරිවර්තන කෘතියේ භාෂාවට හැරවීමේදී ඒවා මග හැරීමට ඉඩ නොතැබීම, පෙළ (Text) සමස්තය ම වචනයෙන් වචනය එලෙස ම පරිවර්තනය කළ යුතු ද? යන්න අවබෝධ කර ගැනීම, පාඨකයාට මුල් කෘතියේ ආස්වාදය ම ලැබීම සඳහා එහි අදහස ම ඔවුන් වෙත ගලා යාමට සැලැස්වීම හෙවත් අර්ථපවාහනය කිරීම (Transpire the Meaning), පරිවර්තනය සඳහා නිශ්චිත අර්ථ නැති වචන සිංහලයට පෙරළන්නට නොගොස් මුල් කෘතියේ භාෂාවෙන් ම තැබීමට සැලකිලිමත් වීම, සැමවිට ම දෙවැනි වාක්‍යය නැතිනම් ඊළඟ වාක්‍යය සැකසෙන්නේ සහ එහි හැඩය තීරණය වන්නේ පළමු වැනි වාක්‍යය නැතිනම් පෙර වාක්‍යය අනුව බැවින් එකී මුල් වාක්‍ය පරිවර්තනය කිරීම ඉතා ප්‍රවේශමෙන් සිදු කළ යුතු බැරෑරුම් වගකීමක් බව තේරුම් ගැනීම, අභියෝගවලට මුහුණනොදී පරිවර්තනය කළ නොහැකි බව තේරුම් ගැනීම, පරිවර්තකයන් එකතු වී ගන්නා දැඩි උත්සාහයකින් පරිවර්තන සාහිත්‍යය සම්බන්ධ ගැටලු විසඳා ගැනීම, Google Translation හෝ AI ඔස්සේ හෝ ශබ්දකෝෂවලින් හෝ පරිවර්තනය කර පිටපත් කළ විට (Copy and Paste) කෘතියට අදාළ මව් භාෂාවේ යොදා ඇති වචනයේ නියම අර්ථය බොහෝ විට නොලැබෙන නිසා එවැනි කොපි කිරීම් සිදු නොකිරීම යනාදී අවශ්‍යතා ඊට අයත්.

මෑතකදී Damion Searls රචිත ලන්ඩනයේ Yale University Press නිකුත් කළ Philosophy of Translation කෘතිය පිළිබඳ අන්තර්ජාලයේ හුවමාරු වූ අදහස් අනුව "පරිවර්තනය හොඳ රචකයකුගේ තිබෙන හොඳ ගුණවලින් සත්‍ය ජීවිතයේ දේවල් උකහා ගන්නට නිතර උත්සාහ කරනවා. එය AI හෝ ගූගල් පරිවර්තන තාක්ෂණයට හෝ සිදු කරන්නට බැහැ (A Good Translation goes on as much as Life Experience and Personality as Good Writers as). AI වැනි තාක්ෂණික පහසුකම් ආශ්‍රයෙන් පරිවර්තනය කිරීමේදී එසේ සත්‍යය උකහා ගත නොහැකියි." මේ අනුව එබඳු පරිවර්තන කාර්යයක් නිෂ්ඵල වන බව විචාරක හසිත අබේවර්ධන පැවසුවා.

ඔහුට අනුව "අභියෝගවලට මුහුණනොදී සාර්ථක පරිවර්තනයක් සිදු කළ නොහැකි සේ ම පරිවර්තනයේ තාක්ෂණික සීමා හඳුනා නොගෙන එළැඹෙන අභියෝගවලට මුහුණදීම ද අසීරු කරුණක්. මෙරට සිංහල පාඨකයාට උසස් රසවින්දනයක් සහිත පොතක් කියවිය හැකි වන්නේ පරිවර්තකයා පරිවර්තනයේ අභියෝග භාර ගන්නා තරමට. මේ කරුණු සලකා බැලීමේදී ඉන්දියාවේ සංස්කෘතික හා සමාජීය උභතෝකෝටිකය (Cultural and Social Paradox) හෙළිපෙහෙළි කර මතු කිරීමට හෙනා සිත්තරිය ලක්ෂ්මී කෘතිය සමත්. එසේ ම රහසිගත, සැඟවුණු, යටිබිම්ගත ඉන්දියාව (Hidden or Mystic India) එළිමහනට ඇද ප්‍රදර්ශනය කරවන්නටත් පරිවර්තිකාව සමත් වෙනවා."


'හෙනා සිත්තරිය ලක්ෂ්මී' යනු ඉතා අවමන්සහගත යෝජිත විවාහයකින් හෙම්බත් වන 17 වියැති ලක්ෂ්මී නම් තරුණ කාන්තාව නූතනත්වය සහ සාම්ප්‍රදායකත්වය අතර දෝලනය වන, තාඩන පීඩන සහිත සමාජ වටපිටාවක සාර්ථකත්වය සඳහා යෙදෙන අරගලය අළලා නිර්මාණය වුණු නවකතාවක්. තවදුරටත් පරිවර්තිකාවගේ අවධානය යොමු විය යුතු ව තිබූ ඉසව් කිහිපයක් පෙන්වා දෙමින් විචාරකයකුගේ අභියෝගයට ලක්වීම හොඳම කෘතියක් නිර්මාණය කිරීම සඳහා ලේඛකයකුට හෝ පරිවර්තකයකුට හෝ අභිප්‍රේරණයක් වන බවත් විචාරක හසිත පෙන්වා දුන්නා.


පරිවර්තකයා කියන්නේ විවිධ ජාතීන්, සංස්කෘති, භාෂා සහ භූ කලාප යා කරන්නෙක්. ඔහු/ඇය මුල් කෘතියට හැකිතාක් උපරිම සාධාරණය ඉටු කරමින් දුරස්ථ කලාපයක මිනිසුන්ගේ හැඟීම්, ආකල්ප, ජීවන රටා, දේශපාලනික, සමාජ සහ ආර්ථික පසුබිම, ස්වාභාවික පරිසරය ඇතුළු බොහෝ සමාජ

සංස්කෘතික දේපොළ ලොව තව පැත්තක වෙසෙන්නන්ට පවරා දෙනවා. ඒ නිසා මුල් කෘතියේ ලේඛකයා උපරිමයෙන් තෘප්තිමත් වන පරිවර්තනයක් සිදු කිරීමේ වගකීම සහ වගවීම පරිවර්තකයා භාර ගත යුතුයි. ඒ කාර්යය සාර්ථක ව ඉටු කරන පරිවර්තකයා ද්‍රෝහියෙකු නොවී මිත්‍රයකු බවට පත් වනවා.

මුල් කෘතිය ලේඛකයාගේ දරුවකු වන අතර වෙනත් භාෂාවකට පරිවර්තනය වූ පසු එය පරිවර්තකයාගේ දරුවකු වන බවයි, රුසියානු භාෂාවෙන් ලේඛනයේ යෙදෙන සුප්‍රකට උස්බෙකිස්තානු ලේඛකයකු සහ බීබීසී මාධ්‍යවේදියකු ද වන හමීඩ් ඉස්මායිලොව්ෆ් උපුටා දක්වමින් ප්‍රවීණ පරිවර්තක සහ ලේඛක චූලානන්ද සමරනායක පැවසුවේ. ඒ අනුව බැලූ විට මුල් කෘතියට වඩා වෙනස් ජානමය ලක්ෂණ පවා ප්‍රබන්ධ පරිවර්තන කෘතියක පැවතිය නොහැකි ද? එවිට පරිවර්තකයා ද්‍රෝහියකු ලෙස හෝ මිත්‍රයකු ලෙස හෝ නිශ්චිත ව වර්ග කළ හැකි ද? යන්න සංවාදශීලීයි.

ප්‍රබන්ධ සාහිත්‍ය කෘතියක් පරිවර්තනය කිරීමේදී මුල් ලේඛකයා කෘතියට ඇතුළත් කර ඇති නිර්මාණාත්මක ගුණ රැක ගැනීම පහසු නැහැ. එයට හේතු වන්නේ මුල් කෘතිය කිසියම් ආගන්තුක භූමි පරාසයක, කාල පරාසයක, සංස්කෘතික පරාසයක, ජන කොට්ඨාසයක සහ




භාෂාවක කතන්දරයක් වීම. එසේ ම පරිවර්තන කෘතිය රැගෙන යන්නේ ඊට හාත්පසින් ම වෙනස් පරිසරයකට වීම නිසා ඇතිවන සට්ටනය ද හේතුවක්. පරිවර්තනයේදී මුහුණපාන ග්‍රහණය කර ගැනීමේ සහ ගෝචර කර ගැනීමේ අපහසුතාව හේතුවෙන් පරිවර්තකයාගෙන් මගහැරීම් සිදු විය හැකියි. මේ අපහසුතාව, පහසුව බවට පත් කිරීම නොහොත් මේ ගැටෙන දෙපාර්ශ්ව අතර හොඳ ශක්තිමත් පාලමක් නිර්මාණය කිරීමයි පරිවර්තකයාගේ කාර්යය වන්නේ. ඒ සඳහා පරිවර්තකයා, නිර්මාණකරුවකු ද වීම වටිනවා. එසේ නොවුණු විට කතාවේ අභ්‍යන්තරයේ පවතින නිර්මාණාත්මක ගුණ බහුල ව මග හැරෙන්නට ඉඩ තිබෙනවා. එවිට පරිවර්තකයා ද්‍රෝහියකු වන්නට පුළුවන්.

''පරිවර්තකයකුට මුල් කෘතියේ බස ඉක්මවා තමන්ගේ භාෂාව පිළිබඳ පෘථුල දැනුමක් තිබීමත් වැදගත්. කතාවක උඩුතලය සහ යටිතලය දෙක ම කරළියට ගෙනඒම පහසු වන්නේ එවිට. 'මගේ දගෙස්ථානය' නමින් මා පරිවර්තනය කළ My Dagestan පොතේ කර්තෘ රසුල් ගම්සාටොව්ෆ් කියන පරිදි, 'පරිවර්තකයා ද ලේඛකයකු, කවියකු සහ කලාකරුවකු විය යුතුයි. තමාගේ ජනතාව නියෝජනය කරන ජනතා පුත්‍රයකු ය යන හැඟීම දැරිය යුතුයි. එසේ නොවී තමාගේ මිනිසුන් උදෙසා පරිවර්තන නොකළ යුතුයි.' මේ අවශ්‍යතා සපුරන්නේ නැති පරිවර්තන, මුල් කෘතියටත් පරිවර්තිත කෘතියටත් ද්‍රෝහී වන්නට පුළුවන්. ඒ නිසා පරිවර්තකයාගේ අඩයාලම පරිවර්තනයට වටිනවා. එසේ නොවන පරිවර්තකයා මුල් කෘතියේ දත් ගලවා ලොඹු කටින් සපමින් කෑම කන අයකු බඳු විය හැකියි. එසේ ක්‍රියා කරන පරිවර්තකයාගේ නිර්මාණවල අවුල්සහගත වූ ද්‍රෝහී ලක්ෂණ පැවතිය හැකියි. පරිවර්තකයන් කිහිපදෙනකු පරිවර්තනය කළ එක ම පොතක පරිවර්තිත කෘති, මුල් කෘතිය සමග සසඳා බැලූ විට අඩු වැඩි වශයෙන් සිදු වී ඇති වෙනස්කම් දැකගත හැකියි. ඒ අනුව වඩාත් සාර්ථක, නිර්දෝෂී, පාඨක මිත්‍රශීලී කෘතිය හඳුනා ගන්නට පුළුවන්." මේ ප්‍රවීණ ලේඛක සහ පරිවර්තක මහින්ද සෙනරත් ගමගේ දැක් වූ අදහස්.

'පරිවර්තකයා, ද්‍රෝහියා' යන්න 'Traduttore, Traditore' යනුවෙන් වන ඉතාලි ආප්තෝපදේශයක්. ඉන් ඉඟි කරන්නේ පෙළ පරිවර්තනය කිරීමේදී මව් කෘතියේ මුල් අර්ථය හෝ එහි සූක්ෂ්මතාව විනාශ කර ගැනීමේ ආවේණික අභියෝගය සහ විභවය පිළිබඳ. විශේෂයෙන් සාහිත්‍ය කෘති පරිවර්තනයේ අසම්පූර්ණ ස්වභාවය කියාපාන්නටත් පරිවර්තකයාගෙන් සිදු වන මූලාශ්‍ර පාඨයේ ආත්මය, ශෛලිය හෝ අන්තර්ගතයේ ප්‍රබල තැන් හෝ වෙනස් වන බව පෙන්වා දෙන්නටත් 'පාවා දීම' යන අරුත භාවිත කරමින් එමගින් උත්සාහ දරනවා. පරිවර්තන කෘතියක් නව භාෂාවෙන් හැඩ වී ඊට විශ්වාසවන්ත ව ගොඩනැගෙන නමුත් එය මුල් පිටපතට අවිශ්වාසවන්ත වීම නිතැතින් මතුවන දෝෂයක් බව les belles infidèles (අවිශ්වාසවන්ත සුන්දරත්වය) යනුවෙන් වන ප්‍රංශ වදනින් ද කියවෙනවා. එය ද පරිවර්තන කාර්යය පිළිබඳ ප්‍රබල විවේචනයක්. පරිවර්තකයන් 'ද්‍රෝහීන්' ලෙස ඉතාලි ජාතිකයන් හඳුන්වන්නේ වචන, වාක්‍ය ව්‍යුහ, සංස්කෘතික අගය, ඍජු ව ම පරිවර්තනය නොකිරීම, විවිධ ආසන්න තේරුම් වෙනුවෙන් සත්‍ය අදහස කැප කිරීම, පරිවර්තකයාගේ ආත්මීය ලක්ෂණ, අවබෝධය සහ ඉදිරි දර්ශනය කෘතියට කාවැද්දීමට යාම යනාදිය පාවාදීමේ ලක්ෂණ ලෙස ගෙනයි. කෙසේ වෙතත් 'පරිවර්තකයා, ද්‍රෝහියා' යනු පරිවර්තන කලාවට ආවේනික ආතතිය සහ අභියෝග ප්‍රකාශ කිරීමට යොදා ගත් සංක්ෂිප්ත අදහසක් විනා සියලු ම පරිවර්තකයන්ට එරෙහි චෝදනාවක් ලෙස සැලකීම යුක්ති යුක්ත නැහැ. එය යොදා ගත යුත්තේ අසීමිත ව දුරස්ථ සමාජ, සංස්කෘතික ප්‍රවාහ දෙකක් අතර පාලමක් ඉදි කරන ඉංජිනේරුවා වන පරිවර්තකයාගේ වගකීමේ ස්වභාවය කෙබඳු ද? යන්න තේරුම් ගන්නට පමණයි.

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

# ආදර්ශ ප්‍රශ්නෝත්තර -1



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු), මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

විවිධ කඩඉම් හා උසස්වීම් විභාග වෙනුවෙන් දෙසතිය පුවත් සඟරාවෙන් ඉදිරිපත් කෙරෙන ලිපි මාලාවේ තවත් දිගුවක් ලෙස ඉදිරියේ පැවැත්වෙන කඩඉම් විභාග වෙනුවෙන් ආදර්ශ ප්‍රශ්නෝත්තර මාලාවක් මෙසේ ඉදිරිපත් කෙරේ.

**1. රජයේ නිලධරයකු සතු විය යුතු සාමාන්‍ය හැසිරීම් විස්තර කරන්න.**

- රජයට පූර්ණ පක්ෂපාතීත්වයක් දැක්විය යුතු ය.
- පවරනු ලබන ඕනෑ ම රාජකාරියක් ඉටු කළ යුතු ය.
- සිය තනතුරේ හා සේවයේ හොඳ නම රැකිය යුතු ය.
- සිය පෞද්ගලික කටයුතුත් රාජකාරී කටයුතුත් අතර ගැටුමක් නොවන පරිදි කටයුතු කළ යුතු ය.
- උසස් කිරීම් සම්බන්ධ ව බලපෑම් නොකළ යුතු ය.
- අයුතු ප්‍රතිලාභ උදෙසා රාජකාරි හුවමාරු නොකළ යුතු ය.
- මහජනයාට ආචාරශීලී විය යුතු ය.
- භාෂා විලාශය සංවර විය යුතු ය.
- පෞද්ගලික කටයුතු සඳහා රාජ්‍ය දේපළ හා රාජ්‍ය ස්වකයන් යොදා නොගත යුතු ය.

**2. ආයතන සංග්‍රහයට අනුව රජයේ නිලධරයකු විසින් සිදු රනු ලබන වැරදි බෙදෙන ප්‍රධාන කොටස් දෙක කෙටියෙන් දක්වන්න.**

➢ පළමු වැනි ලේඛනයේ වැරදි (බරපතළ වැරදි)

- ජනරජයට අවනත නොවීම, ජනරජය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම
- රාජ්‍ය විරෝධී, ත්‍රස්තවාදී හෝ සාපරාධී හෝ කටයුතු සම්බන්ධ වැරදි.
- රාජකාරී කාලය තුළ /රජයේ කාර්යාල පරික්ෂයක් තුළ මත් වතුර පානය කර සිටීම/ විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම හෝ ඒවා ළඟ තබා ගැනීම.
- රජයේ මුදල්/සම්පත් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ හැරීම.
- රජයේ සම්පත් අවධානයෙන් හෝ අනවධානයෙන් හෝ ඒවා විනාශ වීමට හෝ වටිනාකම් අඩු වීමට හෝ ඉඩ හැරීම.
- රජයේ අයිතිවාසිකම්වලට හානිවන අයුරින් ක්‍රියා කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම.
- රාජ්‍ය සේවය අපකීර්තියට පත් වන පරිදි ක්‍රියා කිරීම.
- ජ්‍යෝෂ්ඨ නිලධරයෙකුගේ නීත්‍යානුකූල නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම, අකීකරු වීම හෝ පැහැර හැරීම සහ තවත් වැරදි.

➢ දෙවැනි උපලේඛනයේ වැරදි (සුළු වැරදි)

ඉහත පළමු උපලේඛනය යටතට නොවැටෙන නමුත් නිලධරයෙකුගේ අකාර්යක්ෂමතාව, අදක්ෂතාව, අනවධානය, අවංකභාවය නැතිකම, අනිසි හැසිරීම, නොසැලකිල්ල හා අවිනය නිසා සිදු කරන වෙනත් වැරදි.

**3. රාජ්‍ය නිලධරයෙකුට පැනවිය හැකි දඬුවම් මොනවාද?**

➢ බරපතළ දඬුවම්

- සේවයෙන් පහ කිරීම, පරිවාස කාලයේ පසුවන නිලධරයෙකුගේ සේවය අවසන් කිරීම, සාමාන්‍ය අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගැන්වීම
- සේවයෙන් පහ කිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම.
- වෛකල්පික විශ්‍රාම වයසෙන් ඔබ්බට සේවා දිගු ලබා නොදීම.
- ජ්‍යෝෂ්ඨත්වයෙන් පහළ දැමීම.
- නිල තත්ත්වයෙන් පහළ දැමීම.
- ලබමින් සිටි වැටුප් වර්ධක කිහිපයකින් අඩු කිරීම.
- වැටුප් වර්ධක විලම්භනය කිරීම.
- නිශ්චිත කාලයක් ගතවන තුරු උසස්වීම සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදීම.
- ඉහත වැරදිවලට වඩා බරපතළ නොවන හා සාමාන දඬුවම්.

➢ සුළු දඬුවම්

- තරවටු කිරීම (අවවාද කිරීම, තදින් අවවාද කිරීම දඬුවමක් නොවේ)
- තදින් තරවටු කිරීම
- දෝෂ දර්ශනයට ලක් කිරීම
- වසරකට වැඩි නොවන කලකට වැටුප් වර්ධකය අත්හිටු වීම.
- වසරකට වැඩි නොවන කලකට වැටුප් වර්ධකය නතර කිරීම
- නිලධාරියාගේ වියදමින් (විනය හේතු මත) වෙනත් තැනකට මාරු කිරීම
- සතියක වැටුපට වැඩි නොවන දඩයක්
- ඉහත දඬුවම්වලට වඩා බරපතළ නොවන හා සාමාන දඬුවම්.

**4.රජයේ නිලධරයෙකුගේ වැඩ තහනම් කළ හැකි අවස්ථා මොනවාද?**

- වැඩ තහනම් කළ හැක්කේ විනය බලධරයාට ය. අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා විනය බලධරයා නොවන විට ආවරණ අනුමැතියට යටත් ව වැඩ තහනම් කර එහි පිටපතක් විනය බලධරයාට යවා ආවරණ අනුමැතිය ලබා ගත හැකි ය.
- ජනරජයේ ව්‍යවස්ථාවට අවනත නොවීම, ජනරජය කීර්තියට පත් වන අයුරින් කටයුතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම.
- රාජ්‍ය විරෝධී /ත්‍රස්තවාදී/සාපරාධී අපරාධ/ අල්ලස් හෝ දූෂණ චෝදනා සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ නඩු පවරා තිබීම.
- රාජකාරී වේලාව තුළ හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ හෝ මත් වතුර/ විෂ මත් ද්‍රව්‍ය පාවිච්චි කිරීම හෝ ළඟ තබා ගැනීම.
- රජයේ මුදල්/සම්පත් සාවද්‍ය/අයථා ලෙස පරිහරණය කිරීම හෝ වෙන අයෙකුට එසේ කිරීමට ඉඩ හැරීම. අවධානයෙන් හෝ අනවධානයෙන් සම්පත් විනාශ වීමට හෝ වටිනාකම අඩු වී යාමට ඉඩ හැරීම.
- රජයේ අයිතිවාසිකම්වලට හානි වන ආකාරයෙන් කටයුතු කිරීම, රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන ආකාරයෙන් කටයුතු කිරීම.

**5. මූලික විනය පරීක්ෂණය හා විධිමත් විනය පරීක්ෂණය අතර වෙනස දක්වන්න.**

මූලික විනය පරීක්ෂණයක් යනු විධිමත් විනය පරීක්ෂණයකට පෙර අනුගමනය කරන පියවරකි. මූලික පරීක්ෂණයක අරමුණු පහත පරිදි වේ.

- අදාළ සිද්ධිය/ සිද්ධි පිළිබඳ නියම තතු හෙළි කර ගැනීම
- සැකයට පාත්‍ර ව සිටින නිලධරයන්ට විරුද්ධ ව චෝදනා ඉදිරිපත් කළ යුතු ද යන්න තීරණය කිරීම
- චෝදනාව ඔප්පු කිරීම සඳහා සාක්ෂි පවතී ද යන්න නිශ්චය කිරීම
- මූලික විමර්ශන සිදු කරන්නේ ඒ සඳහා පත් කරනු ලැබූ කමිටුවක් විසිනි.

විධිමත් විනය පරීක්ෂණයක අරමුණ අප්‍රමාද ව සත්‍ය සොයා ගැනීමයි. රාජ්‍ය සේවකයන්ගේ විනය කඩකිරීම සම්බන්ධ ව විධිමත් විනය පරීක්ෂණ පැවැත්විය යුත්තේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල ව ය.

**6. රැකවරණ නිලධරයකු යනු කවුරුන් ද? එවැන්නෙකුගේ සේවය අවශ්‍ය වන්නේ කවර අවස්ථාවකදී ද?**

විධිමත් විනය පරීක්ෂණයකදී රැකවරණ නිලධරයෙකු පත් කිරීමට හා රැකවරණ නිලධාරියාගේ සහය ලබා ගැනීමට චූදිත නිලධාරියාට හැකි ය. රැකවරණ නිලධරයෙකු ලෙස පත්වීම් ලැබීමට සුදුසුකම් ඇත්තේ පහත සඳහන් අයට ය.

- සේවයේ නියතු අයෙකු
- රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් සිටින අයෙකු

නීතීඥවරයෙකු රැකවරණ නිලධාරියා ලෙස පත්කර ගැනීමට නම් විනය බලධරයාගෙන් අවසර ලබා ගත යුතු ය. රැකවරණ නිලධරයෙකුට මූලික වශයෙන් පහත සඳහන් බලතල ඇත.

- චූදිත නිලධරයා වෙනුවෙන් විනය පරීක්ෂණයේ පෙනී සිටීම.
- චූදිත නිලධරයාට එරෙහිව ඉදිරිපත් කරන ලේඛන පරීක්ෂා කර බැලීම.

**7. විනය නියෝගයක අනිවාර්යයෙන් ම අඩංගු විය යුතු කරුණු මොනවා ද?**

- චූදිතයා එක් එක් චෝදනාව සම්බන්ධයෙන් වරදකරු ද? නිවැරදිකරු ද? යන වග
- වරදකරු වී ඇති චෝදනා සම්බන්ධ ව පනවන දඬුවම් හා/හෝ කොන්දේසි
- සියලු ම චෝදනාවලට නිවැරදිකරුනම් ඒ බව දැන්වීම
- දෙවැනි උපලේඛනය යටතේ වන වරදක් සම්බන්ධ ව වරදකරු වී ඇති චූදිත නිලධරයකුට පැනවිය හැක්කේ සුළු දඬුවම් ලෙසත් වර්ග කර ඇති දඬුවමක් පමණි.
- විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමක් ක්‍රියාත්මක කළ යුතු දිනය ලෙස සැලකිය යුතු වන්නේ චෝදනාවට සම්බන්ධ වරද කළ දිනයයි.

**8. විනය බලධරයෙකුගේ කාර්යභාරය කෙටියෙන් පහදන්න.**

- විධිමත් විනය පරීක්ෂණ කටයුතු පවත්වාගෙන යන ආකාරය නිරීක්ෂණය කිරීමේදී අදාළ පරීක්ෂණය අනවශ්‍ය ලෙස ප්‍රමාද වන බව පැහැදිලි ව පෙනේනම් ඒවා වැළැක්වීමට නිසි පියවර ගත යුතු ය.
- විධිමත් විනය පරීක්ෂණයක් පවත්වාගෙන යන අතරතුර පරීක්ෂණය කල් දැමීමෙන් ගමන් වියදම්, පරීක්ෂණ සඳහා ගෙවීම් සඳහා රජයට සිදුවන වියදම අවම කර ගැනීමට හැකි වන සේ පරීක්ෂණය ආරම්භයේ සිට අවසනය දක්වා ම නිරන්තර අවධානයකින් යුතු ව නිරීක්ෂණය කර අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි පියවර ගත යුතු ය.
- විධිමත් විනය පරීක්ෂණයක් අවසන් ව අවසාන වාර්තාව හා අදාළ ලේඛන අප්‍රමාද ව ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය.
- අප්‍රමාදව විනය නියෝගය නිකුත් කළ යුතු ය.
- අදාළ විධිමත් විනය පරීක්ෂණ වාර්තාව සුපරීක්ෂාකාරී ව අධ්‍යයනයකොට, සියලු චෝදනා හෝ චෝදනා කිහිපයකට හෝ එක ම චූදිතයා වරදකරු කිරීම, චෝදනා සියල්ලට ම හෝ කිහිපයකට හෝ එකකට හෝ නිවැරදිකරු කිරීම හෝ විධිමත් විනය පරීක්ෂණය සම්පූර්ණයෙන් නිෂ්ප්‍රභාකොට අලුත් පරීක්ෂණයක් පැවැත්වීම හෝ කළ යුතු ය.
- තීරණය ගන්නා විට එම තීරණයට පදනම් වූ සියලු ම හේතු සමඟ විනය බලධරයා අදාළ විනය නියෝගය ඉතා පැහැදිලිවත් නිශ්චිතවත් සටහන් කළ යුතු ය.



# යෝග

ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය
**අනෝමා රත්නායක**

'දිට්වා' සුළි කුණාටුව ජන ජීවිතයට එල්ල කළ බලපෑම සුළුපටු නැහැ. බොහෝ පිරිසක් එයින් පීඩාවට පත් වුණා. මේ ව්‍යසනය නිසා විවිධ ලෙස මානසික අක්‍රමිකතා ඇතිවීමට ඇති අවස්ථා බොහෝයි. මේ තත්ත්වයෙන් පුද්ගලයා ආරක්ෂා කර ගැනීමේදීත් යෝග අභ්‍යාසවලට යොමු කරවීම කාලීන ව වැදගත්.

ගෝලීයකරණය සහ ඩිජිටල්කරණය හමුවේ අපගේ එදිනෙදා ආහාර රටාව ඇතුළු සමස්ත චර්යා ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් තිබෙනවා. මෙහිදී නිරීක්ෂණය වන්නේ ඊට අනුගත වීමට නොහැකි වීම නිසා බොහෝ අය විවිධ ආබාධවලට (ශාරීරික/මානසික) ගොදුරු වන ආකාරය. කාංසාව, මානසික අවපීඩනය, මනෝභාවයේ ආබාධ, හින්නෝන්මාදය, ආහාර ගැනීමේ අක්‍රමිකතා සහ පෞරුෂ ආබාධ ඊට නිදසුන්. ජානමය සාධක, තුවාල, රෝග නිසා ශාරීරික ආබාධ ඇති විය හැකියි. එවිට අයහපත් චර්යාවලට පුද්ගලයා දැනුවත් ව හෝ නොදැනුවත් ව යොමු වීම සහ නැඹුරුව නූතන සමාජයේ දක්නට ලැබෙනවා. මෙය යහපත් සමාජයක් බිහි කිරීමට ඇති එක් අභියෝගයක්. කුඩා දරුවාගේ සිට බාල, මහලු, වැඩිහිටි ප්‍රජාව වෙත විහිද පවතින මේ තත්ත්වයෙන් පුද්ගලයා ආරක්ෂා කර ගැනීමේදී යෝග අභ්‍යාස ඉටු කරන්නේ විශේෂ කාර්යභාරයක්.

යෝග අභ්‍යාස යනු පුරාණ ඉන්දියාවේ ආධ්‍යාත්මික ශාස්තෘවරයන් විසින් වර්ධනය කරන ලද සාම්ප්‍රදායික භාවනා ක්‍රමයක්. ආධ්‍යාත්මික ශාස්තෘවරයන් තම මනස හා ශාරීරික ක්‍රියාකාරකම් පාලනය කිරීමේ ඵලදායී ක්‍රමයක් ලෙස යෝග අභ්‍යාස ප්‍රගුණ කර ඇති බව ඉතිහාසයේ සඳහන්. සංස්කෘත නාම පදය යුජ්+අ මූලයෙන් ව්‍යුත්පන්න වී ඇත්තේ 'ඇමිණීම, සම්බන්ධ වීම, පටිකිරීම, වියගහ කිරීම' යන මූලයෙන්. යෝගය යනු පුද්ගලයාගේ අභ්‍යන්තර අවබෝධය වර්ධනය කිරීමට භාවිත අතිවිශිෂ්ට ඉන්දීය ක්‍රමයක්. ශරීරය, මනස, බුද්ධි මට්ටම් සමඟ සංකේතාත්මක සංග්‍රාම සහ ස්පන්දන මගින් පුද්ගලයාට බාහිර හා ආභ්‍යන්තර බලය සම්පූර්ණයෙන් ම පාලනය කිරීමේ හැකියාව මෙයින් පවතින බවත් පැවසෙනවා. යෝග යනු පරිපූර්ණතාව, පවිත්‍රතාව සහ ජීවිතයේ සාර්ථකත්වය ලබාදෙන විනයක්.

Hayes & Timalsina, (2017) යෝග වර්ගීකරණයක් පෙන්වා දී තිබෙනවා Karma yoga, Bhakthi yoga, Janana yoga, Hatha yoga, Mantra yoga, Yantra yoga, Laya and Kundalini yoga, Tantra yoga, Raja yoga ආදී වශයෙන්. මේ යෝග වර්ග අතරින් ශරීරය සුසංයෝජනයට උපරිමයෙන් දායක වන අභ්‍යාසය ලෙස සැලකෙන්නේ රාජ යෝග (Raja yoga). අෂ්ඨාංග යෝග ලෙසත් රාජ යෝග හැඳින්වෙනවා. මෙලෙස ඓතිහාසික ව පැවත එන පුරාණ ඉන්දියානු දර්ශනයේ මුල් බැසගත් යෝග අරමුණු කෙරෙන්නේ ඒකාබද්ධ යහපැවැත්මක් ඇති කිරීම වෙනුවෙන්. මෙහි අදියර අටක් (08) පිළිබඳ ව පර්යේෂකයන් අවධාරණය කර තිබෙනවා. මේවාට ශාරීරික ඉරියව් (Asanas), හුස්ම පාලනය (Pranayama), භාවනාව සහ ආචාරධර්ම මූලධර්ම (Yama and niyama) යනාදී පුළුල් පරාසයක අභ්‍යාස ඇතුළත් (KR, 2019).

විද්වතුන් පෙන්වා දෙන පරිදි යෝග අභ්‍යාස නිතිපතා සිදු කිරීමෙන් පුද්ගලයාට භෞතික, කායික, විද්‍යාත්මක, ජෛව රසායනික සහ මනෝ විද්‍යාත්මක ප්‍රතිලාභ අත්කර දෙනවා (Petric et al., 2014; Y. Sharma et al., 2018). එහිදී ස්වයංක්‍රීය ස්නායු පද්ධති වැඩිදියුණු කිරීමෙන් කායික ආතති ප්‍රතිචාර අඩු වන අතර ලැබෙන්නේ වඩා යහපත් ශාරීරික ඔරොත්තු දීමේ හැකියාවක්. යෝග අභ්‍යාසවල නිරතවීමෙන් උදාසීන ජීවන රටාව, දුර්වල ඉරියව් සහ දිගු පැය තිර කාලයෙහි සෘණාත්මක බලපෑමට ප්‍රතිරෝධය දැක්විය හැකි බව (Petric et al., 2014; Y. Sharma et al., 2018); ශාරීරික ජීව ශක්තිය පවත්වාගෙන යන සහ අධි රුධිර පීඩනය, පිටුපස වේදනාව සහ පරිවෘත්තීය අසමතුලිතතාව වැනි නිදන්ගත තත්ත්ව ඇතිවීමේ අවදානම අඩු කරන හෝ වැළැක්වීමේ හෝ සෞඛ්‍ය උපායමාර්ගයක් බව (Cramer et al.,2016); ශාරීරික සංවේදන චිත්තවේගීය හා සංජානන රටා සමඟ සම්බන්ධ කිරීමෙන් ස්වයං විමර්ශනයට පහසුකම් සපයන බව (Gard et al., 2014); වෘත්තිකයන්ට

පුද්ගලයාගේ ශාරීරික යෝග්‍යතාවට අවශ්‍ය වන නම්‍යශීලී බව, ශක්තිය සහ සමස්ත ශාරීරික සෞඛ්‍යය වැඩිදියුණු කිරීමේ හැකියාව සඳහා යෝග පුළුල් ලෙස පිළිගෙන තිබෙන්නක්. මෑතකදී යෝග අභ්‍යාසය පිළිබඳ විශේෂ අවධානයක් යොමු වී ඇති අතර එහි පැරණි මූල ඉක්මවා ගොස් සමකාලීන සමාජයේ සමස්ත සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත වී ඇති ආකාරය දක්නට පුළුවන්. යහපැවැත්ම සඳහා වන මේ බහුමාන ප්‍රවේශයට ශාරීරික, මානසික, චිත්තවේගීය සහ ආධ්‍යාත්මික මාන ඇතුළත් වන අතර සෞඛ්‍යය සහ යහපැවැත්ම පිළිබඳ පුළුල් දැක්මක් වෙනුවෙන් එය භාවිත කළ හැකි ආකාරය පර්යේෂකයන් පෙන්වා දී තිබෙනවා.

අන්තර් පුද්ගල සම්බන්ධතා තුළ වැඩි අනුකම්පාවක් සහ චිත්තවේගීය සංවේදීතාවක් වර්ධනය කිරීමට ආකල්ප සහ හැසිරීම් හැඩගස්වන අතර ඉවසීම, අවබෝධය සහ සහයෝගී සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීමට හැකි බව (Singh, and Balkrishna,2012) එහිදී විද්වතුන් අවධාරණය කර තිබෙනවා.

පුද්ගලයාගේ ශාරීරික යෝග්‍යතාවට අවශ්‍ය වන නම්‍යශීලී බව, ශක්තිය සහ සමස්ත ශාරීරික සෞඛ්‍යය වැඩිදියුණු කිරීමේ හැකියාව සඳහා යෝග පුළුල් ලෙස පිළිගෙන තිබෙන්නක්. මෑතකදී යෝග අභ්‍යාසය පිළිබඳ විශේෂ අවධානයක් යොමු වී ඇති අතර එහි පැරණි මූල ඉක්මවා ගොස් සමකාලීන සමාජයේ සමස්ත සෞඛ්‍යය ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත වී ඇති ආකාරය දක්නට පුළුවන්. යහපැවැත්ම සඳහා වන මේ බහුමාන ප්‍රවේශයට ශාරීරික, මානසික, චිත්තවේගීය සහ ආධ්‍යාත්මික මාන ඇතුළත් වන අතර සෞඛ්‍යය සහ යහපැවැත්ම පිළිබඳ පුළුල් දැක්මක් වෙනුවෙන් එය භාවිත කළ හැකි ආකාර පර්යේෂකයන් පෙන්වා දී තිබෙනවා. ඒ අනුව (Ko KY, Kwok ZCM, Chan HY ., 2023) පර්යේෂණ සොයා ගැනීම්වලින් තහවුරු කර ඇත්තේ යෝග නිතිපතා පුහුණුවෙන් ශාරීරික හා ක්‍රියාකාරී යෝග්‍යතාව සඳහා අත්‍යවශ්‍ය වන ශරීර දැනුවත්භාවය, ඉරියව් සහ සමබරතාව වැඩිදියුණු කිරීමට හේතු වන බව. K. B. Joseph and colleagues (2022) අනුව යෝග වෘත්තිකයන් වඩා හොඳ හෘද වාහිනී සෞඛ්‍යයක්, අඩු රුධිර පීඩනය සහ වැඩිදියුණු කළ පරිවෘත්තීය ක්‍රියාකාරිත්වයක් අත්විඳීමට නැඹුරු වන බව පෙන්නුම් කරනවා. Khalsa, (2004) සඳහන් කරන්නේ යෝග භෞතික ශරීරයෙන් ඔබ්බට ගොස් චිත්තවේගීය හා මානසික සෞඛ්‍යය ආමන්ත්‍රණය කරන බවත් යෝග පුහුණුව සිහිකල්පනාව ඇතුළත් කරන අතර ආතති කළමනාකරණය ප්‍රවර්ධනය, කාංසාව සහ මානසික අවපීඩනය අඩු කිරීමට හේතු වන බවත්. Cramer et al., (2017) සිදු කළ පර්යේෂණ සොයා ගැනීම්වලට අනුව සිහිකල්පනාව එනම් මේ මොහොතේ සම්පූර්ණයෙන් ම සිටීමේ සහ නියැළීමේ තත්ත්වය (Mindfulness) යෝගයට ආවේණික හුස්ම ගැනීමේ දැනුවත්භාවය සහ භාවනා පිළිවෙත් ඔස්සේ වැඩිදියුණු කර ගැනීමට යෝගී අභ්‍යාස උපකාර වන බව. එසේ ම මානසික සෞඛ්‍ය අභියෝගවලින් බොහෝ විට පීඩා විඳින සමාජයක යෝග චිත්තවේගීය ස්ථාවරත්වය සහ මානසික යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකාරී පියවරක් වැදගත් වන බවයි ඔවුන් සඳහන් කරන්නේ. McCall et al., (2013) සඳහන් කර ඇත්තේ කාංසාව, මානසික අවපීඩනය සහ වේදනාවේ රෝග ලක්ෂණ අඩු කිරීම සඳහා යෝග වඩාත් ඵලදායී ලෙස පෙනී සිටින බව.

ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ශාරීරික හා මානසික යහපැවැත්ම සඳහා මෙවලමක් ලෙස යෝග ප්‍රවර්ධනයේ ඇති වැදගත්කම අවධාරණය කර තිබෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය මේ අභ්‍යාසය සඳහා වඩාත් පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා මඟ පෙන්වන යෝග සැසි සපයන නොමිලේ **mYoga App** හඳුන්වා දීමට පියවර ගෙන ඇත්තේ ඉන්දියානු රජය සමඟ සහයෝගයෙන්. ලෝක සෞඛ්‍ය සංවිධානයේ 2018-2030 ශාරීරික ක්‍රියාකාරකම් පිළිබඳ ගෝලීය ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වැඩි කිරීමේ මාර්ගයක් ලෙස යෝග සඳහන් කර තිබෙනවා. 2025 ජූනි මස 21 දින ලොව මිලියන සංඛ්‍යාත ජනතාවක් 11 වැනි එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර යෝග දිනය සැමරුවේ Yoga for One Earth, One Health යන තේමාවෙන්. මෙහිදී අදහස් දැක්වූ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රධාන විද්‍යාඥ Dr. Sylvie පවසා ඇත්තේ "යෝග පිළිබඳ සමාලෝචනයේදී මානසික සෞඛ්‍යය, හෘදවාහිනී ක්‍රියාකාරිත්වය, ශාරීරික යෝග්‍යතාව සහ ජීවන තත්ත්වය කෙරෙහි යෝග ධනාත්මක ව බලපාන බව නවතම විද්‍යාවට අනුව තහවුරු කරනවා. ඒ ඔස්සේ ලොව මිලියන සංඛ්‍යාත ජනතාවක් වාර්තා කරන ජීවන අත්දැකීම්, අවශ්‍යතා සහ ප්‍රතිලාභ ඇසුරින් ජාතික ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැකසීම සඳහා මගපෙන්වීමක් ලෝක සෞඛ්‍ය සංවිධානයට ලැබෙනවා." යනුවෙන්.

මේ අනුව එදිනෙදා ජීවිතයේදී යෝග අභ්‍යාස කිරීමෙන් ඵලදායිතාව සහ යහපැවැත්ම අතර සමතුලිතතාව ප්‍රවර්ධනයට ඇති කාර්යභාරය වඩාත් හොඳින් තහවුරු කරන ආකාරය පෙනී යනවා.








# නොසැලෙම් ගොඩලම්

'දිට්වා' ඇවිත් යන්නට ගියා. ඒ, ජීවිත හා දේපළ ඇතුළු තවත් බොහෝ දෑ උදුරාගෙන. ඉතිරි කළ දෙයක් ඇත්නම් ඒ ඇත්තේ නොසීඳෙන අධිෂ්ඨානය. සියල්ල අහිමි වූ පසුවත් යළි දෙපයින් නැගිටුවන ගාමක බලවේගය එයයි. හුදෙකලා අධිෂ්ඨානය සාමූහික ජන විඥානයක් ලෙස ගොඩනැඟීමෙන් මහා බලයක් නිර්මාණය වනු ඇති. දැවැන්ත ව්‍යසනයක් මතින් ලෝකය ගොඩනැගෙන්නේ එලෙස.

වැලිමඩ, නාවල ගම්මානයේ නාය ගිය පසට වැසුණු කෘෂිකාර්මික ජලමාර්ගය, දිට්වා සුළි කුණාටුවට පෙර ගැමියන්ගේ ජීවනාලිය වුණා. එය වසාගත් කන්දෙන් ගත් පස් මේ කාන්තාව විසින් විසි කරනු ලබන රිද්මය කියාපාන්නේ නිහඬ කරන ලද මිනිස් ජීවිත, අතුරුදන් වූ කෙත්වතු සහ විනාශයක් බවට හැරවූ ජලකඳට එරෙහි ඇගේ හුදෙකලා විරෝධය. මනුෂ්‍යත්වයේ නිහඬ ගෞරවය වන්නේ මේ ශ්‍රමය භාෂාව බවටත් විනාශය ගොඩනැගීම බවටත් පත්වන අවධියේ යන්ත්‍ර නොව මිනිස් කැමැත්ත, කැපවීම සහ දරා ගැනීමේ හැකියාව.

සටහන හා ඡායාරූපය
**අනුරුද්ධ ලොකුහපුආරච්චි**

**දෙසතිය** පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

**Rs. 100/-**